**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය ඇවදී විය

(පහළොස්වන වෙළුම)

# සබ්බ සංඛාර සමථය

(ආන්දෝලනාත්මක හෙළිකිරීමක්)

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.


**සබ්බ සංඛාර සමථය**


බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
   https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
   https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado  Unity -
   https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
   https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
   https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
   https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
   https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
   https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
   https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana  -
    https://youtube.com/@BuddothpadoTVdammaDesana

## නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඥාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

    2.1 කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

    2.2 කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කළ්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

   බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥ්ඥාණය)

   - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
   - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
   - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
   - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
   - ශූන්‍යතා අවබෝධය
   - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍යාඥාණය)
     (සිත = අරමුණ = ආත්මය)

   1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

   1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

   1.3 යෝනිසෝමනසිකාරය

   1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව

   **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍යා ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍යා ඥ්ඥාණය)

2.2. **කෘතක්ඥාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්පනිහිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



මේ සිත දියෙන් ගොඩගෙන
බිම තැබූ මාළුවෙකු මෙන්
හැම අතින්ම සැලෙයි. සංසාර චක්‍රය
නමැති කෙලෙස් නැසිය යුතුය
නිවනෙහි සිත් අල්වා වාසය කළ
යුතු ය. වස්තුකාමය ක්ලේශ කාමය
දුරුකොට කිසිම දෙයක අයිතිය
නැත්තෙක් විය යුතු ය. සිත කිලිටි
කරන අකුසල්වලින් මිදී සිත
පිරිසිදු කරගත යුතුයි. හැම
තැන්හිම මිදුණු සියළු කෙලෙස්
දුරුකළ රහතන් වහන්සේට දැවිල්ලක්
නැත. සැම සියළු දෙනාමත් සසරෙහි
බියකරු බව දැක, සිත අවබෝධ කොට
එයින් මිදීමට අධිෂ්ඨානය කරමින් නිවන්
මගට පිළිපන් විය යුතුයි. ඒ උතුම්
අවබෝධයන් සාක්ෂාත් කර නිස්සරණ
මග ඇවිද යන්න මෙහි සඳහන්
'සත්‍ය ධර්මය' නිවනටම
උපකාර වේවා !

# පටුන


| | | |
|---|---|---|
| 01 | නිවන් මඟේ දොරටුව 'සත්‍ය ඥාණය' | 13 - 49 |
| 02 | ඇයි අපි ඉපදුනේ, ඇයි අපි මැරෙන්නෙ | 50 - 73 |
| 03 | මේ භවයේම නිවන් දකිමු කර්ම භූමියෙන් මිදී | 74 -98 |

# 01

# නිවන් මගේ දොරටුව 'සත්‍ය ඥාණය'

**ආර්යයන් වහන්ස :** එහෙනම් අද සුවිශේෂී දිනයක්. හැමෝටම අවස්ථාව තියෙනවා. විවෘතයි. මේ දහම් කථිකාවත බුද්ධෝත්පාද දේශනා ඇත්තටම නිර්මලවයි ඉදිරිපත් වෙන්නෙ. ඇත්තටම කියන්න ඕන, ඔබේ මනස නිදහස්ව තියෙන්න ඕනෙ. ඔබට විවෘත මනසක් තියෙන්න ඕනෙ මේ නිවන් මග කටයුතු කිරීමට. ඒ නිදහස් විවෘත මනසට තමයි ඇත්තටම මේ සත්‍යය හමුවන්නෙ. ඒ සත්‍යය ඔබට හමුවුනොත් තමයි ඔබට ඔබ හිරවෙලා සිටින සෑම තැනකින්ම මිදුණු ස්වභාවයකට එන්නෙ. මේ මහා ශාන්ත සුවය ඔබට අත්දැකීමට ලැබෙන්නේ. දෘෂ්ටියක සිටිනතාක් කල්, ඔබ යමක  හිරවී සිටින තාක්කල් ඔබට දුකම තමයි.

හොඳයි, අපි ප්‍රවේශයක් දෙමු. කැමති කෙනෙකුට පුළුවන් ප්‍රශ්න අහන්න. හොඳයි,

**උපාසක :** ආර්යයන් වහන්ස ඇත්තටම ඔබ වහන්සේගේ දේශනා ශ්‍රවණය කළාම මා අවබෝධ කරගත් ආකාරයටම, ඇත්තටම පූර්වභාග ප්‍රතිපදාවේ තිබෙන වැදගත්කම බොහෝ වෙලාවට අපි වරද්දගන්න තැනක් ඇත්තටම අපි ප්‍රතිඵලයක් සොයාගෙන අපි ප්‍රතිඵලයක් හිතේ තියාගෙන අපි අවශ්‍යම කොටස මග හැර ගන්නවා කියන එක. පූර්ව භාග ප්‍රතිපදාව ඔබ වහන්සේ දේශනා කළ පරිදි ඇත්තටම අපි අපේ දැක්ම තුළ තමයි මේ ගමන එන්නෙ. පූර්ව භාග ප්‍රතිපදාවෙන් තොරව අපර භාග ප්‍රතිපදාවේ ප්‍රතිඵලය දැකීම කළ නොහැකියි කියන එක තමයි මට ඔබ වහන්සේගේ දේශනාව තුළ මා අවබෝධ කරගත් ගැඹුරුම කාරණය.

**ආර්යයන් වහන්ස :** විශේෂයෙන් වටිනාම තැනක් මොකද 'සත්‍ය ඥාණය' ඕක තව විදිහකට කියනව නම් මේ සත්‍ය ඥාණය ඇති වුන්ටයි කෘත්‍ය ඥාණය. ඒ කියන්නෙ ශ්‍රැතමය ඥාණය. ඕක තව විදිහකින් අපි කියනවා සත්‍ය ඥාණය. එක පැත්තකින් අපි කියනවා සද්ධර්ම ශ්‍රවණය කියල. අපි කියනවා ශ්‍රැතමය ආර්ය ශ්‍රාවකයා කියල. ඔය ඔක්කොම පූර්ව භාග ප්‍රතිපදාව ගැන. ඇත්තටම කිවුවොත් සෝතාපන්න වන්නේ පූර්ව භාග ප්‍රතිපදාව මත. ඒක ඒ තරමට ම වැදගත්. මොකද දිට්ඨිඤ්ච අනුපගම්මසීලවා දස්සනේන සම්පන්නෝ' කියල. ඒක අර සබ්බාසව සූත්‍රයට ගියත් 'දස්සනා පහාතබ්බා' ඒක අර ධම්ම සංගීකරණයට ගියහම සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස තුන් සංයෝජනයෝ දර්ශනයෙන්ම පමණක් ප්‍රහානය වේ කියල ඒ වාක්‍යයෙන්ම තියෙනවා දර්ශනයෙන් ප්‍රහානය වන ආශ්‍රව කෙළෙස් කවරේදයත් කියල. ඒකත් ආකාර කීපයකට තැන් කීපයකම තියෙනවා. ඒක මේ ඇත්තටම විශාල ආන්දෝලාත්මක තැනක්.

ඇත්තටම 'භාවනා පහාතබ්බා' කියන එක වෙනමම තියෙනවා පැහැදිලි කරල. භාවනාවෙන් සෝවාන් වෙන්නෙ නැහැ ඇත්තම කතාව. ඒක මේ සූත්‍රවලත් තියෙනවා. ඒක මේ 'ධම්ම සංගීකරණයේ' අභිධර්ම පීඨකයේ හැම තැනම තියෙනවා. පර්යායෙන් අපි පෙන්වන්නම්, සූත්‍රවලින් අභිධර්මයෙන්ද? ධර්මයෙන්ද? කොහෙන්ද ඔබට ඕනි? සමථ භාවනාව ගත්තත්. සමථය හරි, සමථය ඔබට විසිරෙන සිත තැන්පත් වෙනව සමථය වැඩෙනව ලෞකික ධ්‍යාන උපදිනව, හැබැයි ඔබ සෝවාන් වෙන්නෙ නෑ. එහෙනම් 'පොට්ඨපාද අරූප ධ්‍යානයේ හිටියත් සෝවාන් වෙන්නෙ නෑ. ඇයි? ඒ තමයි මෙතන ආත්මයක් නැති බව අවබෝධ කළ යුතු දහමක්. **ආත්මය හැදෙන හැටි ඔබ අසා දැනගත යුතුයි. මෙන්න මෙතනයි තියෙන්නෙ අනාත්ම ධර්මය. මෙතනයි 'ධම්ම චක්ක පවත්තන සූත්‍රය' දම්සක් පැවතුම් සූත්‍රයේ තියෙන සුවිශේෂීම තැන එතන**.

ඒ කියන්නෙ මහණෙනි මේ ඇස නිත්‍යද? '**චක්ඛුං නිච්චංවා - අනිච්චංවා අනිච්චං භන්තෙ**' එහෙනම් ඒ **දුක්ඛං භන්තෙ** ඊට පස්සෙ අහනවා මහණෙනි ආත්මයක් තියෙනවද? **නො හෙතං භන්තෙ**. මේ අනාත්ම ධර්මය. **ඉඳ භික්ඛවේ භික්ඛු**' මේ ශාසනයේ භික්ෂුවක් වන්නේ

මහණෙනි ආත්මයක් තියාගෙන කවුරුත් භික්ෂුවක් වෙන්නෑ. මේ ශාසනේ භික්ෂුවක් වෙන්නෙ **චක්ඛුං නිච්චං වා අනිච්චං** කියන ප්‍රශ්නයෙන්. එතන අනිච්චං භන්තෙ කියල පිළිතුරු දුන්නොත් තමයි අන්න **'ඉද භික්ඛවේ භික්ඛු'** මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නෙ එහෙනම්, මේ ඇස නිත්‍යද? අනිච්චයි ස්වාමිනි. ඒ කියන්නෙ මේ පේන බව. මස් ඇස නොවෙයි. පේන බව. ඇස කියන්නෙ ආයතන කෘත්‍යයක්. ඇස කියන්නෙ මස් ඇහැ නෙවෙයි. එහෙනං මැරුනු කෙනාටත් මස් ඇහැ තියෙනව. එහෙනම් මැරුණ කෙනාටත් පේන්න ඕනි. ඒක නෙවෙයි මේ, බුදුන් වහන්සේ අහන්නේ **'චක්ඛුං නිච්චංවා අනිච්චංවා අනිච්චං භන්තෙ'**

මේ ඇස කියන්නෙ පේන බව. පේන්නෙ බිත්තිය, පොත, මේසය, ඇඳ එතකොට ඒක ශබ්දයයි වර්ණයයි. එහෙම එකක් කොහෙවත් නැහැ. ඒක **'අනිච්චං භන්තෙ'** අන්න එහෙම වුනොත් තමයි **'ඉධ භික්ඛවේ භික්ඛු'** මේ ශාසනයේ භික්ෂුවක් බවට පත්වන්නෙ. එහෙම වුනොත් තමයි අන්න දෙයක් නැති බව දකින තැන **'භව නිරෝධය'** දකින්නෙ බෞද්ධයෙක් වෙන්නෙ. එහෙනම් බුද්ධ දර්ශනය දන්නෙ නැති කිසි කෙනෙක් **'ඉධ භික්ඛවේ භික්ඛු' මේ ශාසනයේ භික්ෂුවක් වෙන්නෑ බෞද්ධයෙක් වෙන්නෙත් නෑ. එතනින් තමයි ඔබට බෞද්ධකමක් හමුවන්නෙ. එතනින් තමයි ඔබ අනුසෝතයෙන් පටිසෝතයට එන්නෙ** සතා සිවුපාවා පවා ඉන්නෙ බාහිරය ඇත්ත කරගෙන. ඉතින් සතා සිවුපාවා ඉන්න තැන තමයි මනුස්සයත් ඉන්නෙ බාහිර ඇත්ත කරගෙන. හැමෝම අනුසෝතයෙ මිථ්‍යාදෘෂ්ටිකයි. එයා 'පටිසෝතය' දන්නෙ නෑ. සෝතයට පැමිණියා කියන්න බෑ, එයා සෝතාපන්න වෙනව කියල කොහොමටවත් කියන්න බෑ. සෝතාපන්න මාර්ගයේවත් නෑ.

එහෙනම් මේ **බුදුන් වහන්සේ ලෝකයට හෙළිකරන්නේ අර පාත්‍රය උඩුගංබලා ගියපු තැනින්, ඇත්තටම කිවුවොත් අපි මේ විඤ්ඤාණ මායාවට මැවෙන එක සත්‍යයක් නොවේ කියල දැනගන්න එක.** මෙතනම තමයි පූර්ව භාග ප්‍රතිපදාව. පූර්වභාග ප්‍රතිපදාව කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය මත, ඔබ අපර භාග ප්‍රතිපදාවට එන්නෙ. සත්‍ය ඥානය කියන්නෙ පූර්ව භාග ප්‍රතිපදාව. බුද්ධ දර්ශන අවබෝධය සමාජයට ගිලිහිලා තියෙන්නෙ. දර්ශනය ගැන මොකවත් තේරෙන්නෙ නෑ. බුදුන්

වහන්සේ පෙන්වන්නේ 'සත්‍ය ඤාණය' ඒ කියන්නෙ 'පරම සත්‍ය' කුමක්ද කියන එක. මේ දර්ශනවාදය කියල අමුතුවෙන් මේ දාගත්ත කෙමෙස්ට්‍රි, ෆිසික්ස් වගේ එකක් නෙවෙයි. 'පරම සත්‍ය' සත්‍යයයි. එහෙනම් සත්‍යය එකයි. බුදුන් වහන්සේ සත්‍ය, කෘත්‍ය, කෘත, තිපරිවට්ටය, ද්වාදසාකාරං කියල දම්සක් පැවතුම් සූත්‍රයේ දේශනා කළේ.

**මහණෙනි, 'ඇත කිව්වත් වැරදියි නැත කිවුවත් වැරදියි මහණෙනි' 'තියෙන ලෝකයක් නැහැ මහණෙනි, එතෙන්ට එන්න ඕනි. එහෙනම් ඇත නැත අන්තවලින් මිදුණු දහමක්. බුදුන් වහන්සේ දේශනා කළ බව දැනගෙන ඉන්න. එහෙනම් එතන 'හේතුං පටිච්ච සම්භූතා' 'හේතු භංගා නිරුජ්ජතී' කියල. එතන ඒ 'සම්භූතා' කියන එක කොහෙවත් තියෙන එකක් නෙවෙයි කියල දැනගන්න.** එහෙනම් හේතුඵල දහමට අපි එන්න ඕනි. අපි කර්ම ඵලය කරේ ගහගෙන ඉන්නතාක් කල් අපි ඉන්නෙ නිගන්ඨනාථපුත්තගෙ කර්මය කරේ ගහගෙන. අර බුදුන් වහන්සේගේ බුදු සමයට ආයමත් යන්නෙ. මේ ඔය පොත්වලින් අපි හැම දේකින්ම කන්දක් වගේ අරගෙන තියෙන්නෙ දෘෂ්ටි ගොඩක්. එකේ දම්සක් පැවතුම් සූත්‍රය තියෙන තැනවත් නෑ.

එහෙනම් බුදුන් වහන්සේ බුද්ධත්වය ලබල ගයා ශීර්ෂයේ බෝධි මූලයේ අලුයම මැදියම තුන්යම 'ත්‍රෛයිලෝකනාථ' සම්මා සම්බුද්ධත්වයට පත් වුණා කියන්නෙ මේ තුන් භූමියම ජය ගෙන කියන්නේ, මේ කොහෙවත් ගිහිල්ල යුද්ධ කරල නෙවෙයි. මේ සිතට එන අරමුණ, මේ එන අරමුණේ දකින්නෙ තුන් භූමියම. එතන දෙයක් කර ගත්තොත් එතන කාම භූමිය තියෙනවා. **'යාරූපේ නන්දි'** නන්දිය තියෙනවා. **'තධූපාදානං භවෝ'** අන්න එතන දෙයක් කර ගත්තොත් එතන තියෙනවා රූප සංඥාව අරූප සංඥාව ඔබ මේක දකින්න. ධර්මය දැක්කොත්, ඔබ මේ එක අරමුණයි ඇත්තටම හරියටම බැලුවොත් දැකල නිවන් දකින්නෙ. මේකයි **'බුද්ධක්ෂණය'** කියන්නෙ මේකයි. **'ක්ෂණසම්පත්තිය'** කියන්නෙ එහෙනම් මේ සතය්‍ය නොදැක මහණෙනි කල්පයක් සිටියත් වැඩක් නෑ කියල කිවුවෙ. එහෙනම් මේ සත්‍ය දැන ගත යුතුයි ඉස්සෙල්ල.

එහෙනම් ඔබතුමාගේ ප්‍රශ්නය හරියටම හරි. මේ සමාජයට ගිලිහිලා තියෙන්නෙ පූර්ව භාග ප්‍රතිපදාව කියන එක මේ 'සත්‍ය ඥානය' මේක

භාවනා කරල ලබන්න බැරිකමයි. භාවනාවට වාඩි වෙන්න ඕන. එහෙනම් සතර සතිපට්ඨානය අතට ගන්න ඕනි. එහෙනම් ඔබ බලන්න මේ සතර සතිපට්ඨානය අතට ගන්න බෑ. මේ බුද්ධ දර්ශනය දන්නෙ නැතිව. ලෝකය ඇත්ත කරගෙන සතර සතිපට්ඨානය වඩන්න බෑ. ලෝකය ඇත්ත කරගත් තැන ඔබට සතර සතිපට්ඨානය හම්බවෙන්නෙ නෑ. එහෙනම් මාර්ගයේ ඔබ ඉන්නෙ කෘත්‍ය ඥානය තුළයි. ඔබට කෝ සත්‍ය ඥානය? මුළු සමාජයටම ගිලිහිලා මුළු ලෝකයටම ගිලිහිලා. ඒක මේ ලංකාවෙ මාණික්‍ය රත්න වගේ රැකිල තියෙන්නෙ භික්ෂූන් වහන්සේලා රැකගෙන  ආපු ඒ ග්‍රන්ථ ධූරය තුළ. උන් වහන්සේලාගේ ඒ කැප කිරීම අපි අගය කරන්න ඕනෙ. ඒක නිසා තමයි මේක මේ දැන් අවදිවෙන්නෙ හේතුව.

**අති සුවිශේෂී දහමක් ගාම්භීර ධර්මයක්. ඔබට පේන ඇහෙන දැනෙන කිසිවක් සත්‍ය නොවේ. ඔබට කිසි දවසක අත්දකින්න බෑ සත්‍යයක්. ඇයි ඒ? විඤ්ඤාණ මායාවෙන් එහා අත්දැකීමක් ඔබට නැහැ. ඔබ කියල කෙනෙක් කියල ඔබ හිතන දැනෙනතාක් ඒ ස්වභාවය තුල සත්‍යය ඔබට හමුවෙන්නෙ නෑ.** මොකද හේතුව? ඔය විඤ්ඤාණ මායාවට දැනෙන ස්වභාවය, ඔබ කියන ස්වභාවය එයයි ලෝක ස්වභාවය ආත්ම ස්වභාවය. ඔබට සියල්ලම එක සැනින් තමයි කූඩුවෙන්නෙ. **ඒ කියන්නෙ ලෝක සංඥා කියන තැන ඔබත් ඉන්නවා. ලෝක සංඥා දුරුවන තැන ඔබත් නැති වෙනවා. 'විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං කායේකායනුපස්සී විහරති'** කිවුවෙ ඒකයි. මේව නිකං අර ඉස්පිලි පාපිලි මාරු කරල කිවුවට මේක ගැලපෙන්නෙ නෑ. මේක අග මුල මැද හොඳින් ගලපෙන්න. මේ දහම හොඳින් අවබෝධ වෙන්නෙ ඔබේ දහම් පර්යාය ගලපගන්නා ආකාරය මත. විශ්වාස කරන්න ඕනෙත් නැහැ. කවුරුත් අදහන්න ඕනෙත් නැහැ. මේ හැම දෙයක්ම ඔබට ප්‍රත්‍යක්ෂ වෙනව ප්‍රායෝගිකව අත්දකින්න ලැබෙනවා.

මේ ඇසේ උපතයි මහණෙනි උපත කියන තැනින් මේ දහම දකින්නට නම් ඔබ අවබෝධ කරන්න ඕනි ඇස විතරයි. අර 'රෝහිතස්ස' ලෝකය බාහිරින් හොයන්න එපා කිවුව වගේ **ඔබ වෙන කිසිවක් හොයන්න අවශ්‍ය නෑ. ඔබ අවබෝධ කළ යුත්තේ ඇස. ඇසේ උපත මහණෙනි උපත කියන**

තැනින් **'චක්ඛුං නිච්චංවා - අනිච්චංවා' යන මේ ප්‍රශ්නය සූත්‍ර ගණනාවක තියෙනවා. බුදුන් වහන්සෙ ඕක තමයි හැමෝගෙන්ම අහල තියෙන්නෙ.** ඇස ලෝකයයි මහණෙනි 'ලෝක සූත්‍රයට' ගියහම **'සළායතන ලෝකෝ - ලෝකං වදේති'** වෙන ලෝකයක් කොහේ හරි තියෙයි. ඇසට මැවෙන ලෝකයේ, දිවට මැවෙන ලෝකයේ, කණට මැවෙන ලෝකයේ, නාසයට මැවෙන ලෝකයේ, කයට මැවෙන ලෝකයේ, වර්ණ, රස, ගන්ධ, රස පහස, උණුසුම සීතල, තද ගතිය ඔබ මේ විඤ්ඤාණ මායාවක අතරමං වුණු ලෝකේ කොහෙවත් තියෙනවද? ඔබ මේක පිළිගන්න නොගන්න එක නොවෙයි තියෙන්නෙ.

ඔබ පොඩ්ඩක් විවෘත මනසකින් සත්‍ය මෙනෙහි කරල. ඔබ ඔය අන්ධකාරයේ ඉන්නේ. අර අන්ධකාරයේ ඉන්න කෙනෙකුට ආලෝකය ගැන කිවුවට තේරෙන්නෙ නෑ. එහෙනම් ඔබ ඉස්සෙල්ලම, ඔබ ඒ අන්ධකාරය කුමක්ද කියල හඳුන ගන්න. මේ අන්ධකාරය ඇත්තක් නොවෙයි. ඔබේම දෑතින් ඔබේම දෑස් වහගෙන ඔබ කියනවා ලෝකය අන්ධකාරයි කියල. ඇත්තම කතාව කිව්වොත් ඔබ ඉන්න දෘෂ්ටි නිසා ඔබට සත්‍ය පේන්නෙ නෑ. ඒකයි ඔබේම දෑසින් ඔබේම දෑස් වහගෙන ඉන්නවා කිවුවෙ. ඔබ ඉන්න දෘෂ්ටි ටික කුඩුවෙලා තියෙන්නෙ ඇත්තම කිවුවොත්.

ඔබ හදාගත්ත ලෝකයම නැති වුන එක විතරයි වෙලා තියෙන්නෙ. ඒකයි අර මාරය අහන ප්‍රශ්නය. බුද්ධත්වයට පස්සෙ මාරයා අහනව මහණ ඔබට සතුටුද? මහණ, මොනව ලැබුනටද මාරය? එහෙනම් මහණ ඔබට දුකයිද? මොනව නැති වුනාටද මාරය? නැති වුණා නම් නැති වුනේ මාරය 'තියෙනව කියල හිතපු සිතුවිල්ල පමණයි. මෙන්න මේක තමයි ඔබටත් සිදුවන්නෙ. **ඔබ තියෙනවා කියල ඔබ හිතන් ඉන්න සිතුවිලි ටික විතරයි මෙතන නැති වෙන්නෙ. ඒ සිතුවිලි බොරුවක් බවට පත්වෙනව. අන්න එතන ඔබ නිවන් දකිනව. ඔබ ඔබට ඇහෙන පේන දැනෙන සියල්ලම ඔබ අවබෝධ කරගන්නවා. සත්‍ය අවබෝධ කරනවා.** ඒ සත්‍ය අවබෝධය තුළ ඔබ තියෙනවා කියල ඔබ හැම මොහොතකම මේ ඔබට පේර ගහක් තියෙනවා අඹ ගහක් තියෙනවා, කජු ගහක් තියෙනවා. මෙතන සුදු ජාතිකයෙක් ආවොත් ඔය එකක්වත් නැහැ. ජපන් ජාතිකයෙක් ආවොත් ඔය එකක්වත් නැහැනෙ. මේවා කොහෙද

තියෙන්නෙ? ඔය ශබ්දයයි වර්ණයයි එකතුවන හැටි දකින තැන 'දිට්ඨ සුත' මේකෙ ප්‍රකටයි. අනෙක් දැනීම් සියල්ල 'මුත' කියල ගත්තත්, ඒ සියල්ල ඒ නිසා හටගත්ත විඤ්ඤාණය ඒ සිතුවිලි දිට්ඨ සුත, මුත විඤ්ඤාණ.

**'දිට්ඨෙ දිට්ඨ මත්තං භවිස්සති', 'සුතේ සුත මත්තං භවිස්සති', 'මුතේ මුත මත්තං භවිස්සති', 'විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං භවිස්සති'** දුටු දෙයක් නැත මහණෙනි. දුටු දෙයක් නැත්නම් දුටු කෙනෙක් නැත මහණෙනි. දෙයක් තිබ්බොත් ඒ දෙයක් කියල දැනෙන දැනීමමයි ඒ ආත්ම සංඥාව. ඒ ආත්මීය දැනීම. පුංචි දරුවා ලේ කැටි දරුවට මොනවද දන්නෙ ඒ දරුවා දන්නෙ නෑ මැරෙනවා කියල. ඒ දරුවා දන්නෙ නෑ ඉපදෙනව කියල. ඒ දරුව පොඩ්ඩක් ලොකු වෙනකොට මේ අර ශබ්දවලින් දෙන්නෙ 'පුතේ මේ අම්මා., මේ අයියා, මේ අක්කා. මොන්ටිසෝරි යනකොට කහපාට රතුපාට නිල්පාට ඊට පස්සේ 'අ' යන්න ඇහැට දෙනව, අඳිනව බෝඩ් එකේ කණට දෙනව ශබ්දය. මෙතන තියෙනවා කම්පන වේගයක් මේක දීර්ඝව අපි පැහැදිලි කරගෙන ආවා. මෙතන තියෙන්නෙ කම්පන වේගයක් ඒ කම්පන වේගයට තමයි මේව එකට එකතු වන්නෙ සොබාදහම. ඒ කම්පන වේගය තප්පරයකට කෝටි වාරයක වේගයක්. අර අපි කියනව බිත්තිය දිහා බලාගෙන ඉන්නකොට චිත්තක්ෂණ කෝටි ගණනක් පහල වෙනවා කියල. අභිධර්මය කරන අය නම් මේක හොඳට දන්නවා. 'චිත්තවීථිවල මේවා හොඳට පෙන්වනවා. ඕකම තමයි මේ කාරණාව.

ඒ කියන්නෙ ඇස කියන්නෙ ආයතන කෘත්‍යයක්. හැබැයි අර 'ස්පාර්ක්' වන වේගයට ඇසට එන්නෙ කිරණයක්. මෙතනම මේ යෂ්ටි සෙල කේතු සෙල සමහර අයට රතුපාට පේන්නෙ නෑ. සමහර අයට කොළපාට පේන්නෙ නෑ. මෙතනමයි මේ වර්ණ ටික හැදෙන්නෙ. මේක තමයි ආශ්චර්යවත් බුදුසිරිත. අර හිරු එළියට ප්‍රිස්මයක් ඇල්ලුවාම දේදුන්නක් මැවෙනවා. මෙතන මේ නාභිගත වන ස්වභාවය අනුවයි ඔබට මේ වර්ණ ටික මැවෙන්නෙ. මේ කොහේවත් තියෙනවා නෙවෙයි ඒ ස්පාරක් වන වේගයට ඒ ඇසට එන කිරණ. කිරණ කියන්නෙ අර හිරුඑළියට කණ්ණාඩියක් ඇල්ලුවාම ස්පාර්ක් වෙන්නෙ අන්න ඒ වගේ

නිලංකාර වෙන්නෙ අව්වට ගියාම ඇහැ අන්න ඒ වගේ. එහෙනම් අහසෙ විදුල්ලක් කොටනව වගේ. එහෙම නැත්නම් අර ධනයි ඍණයි ළං කළාම 'චටස්' ගාලා ස්පාර්ක් වෙන්නෙ. අන්න ඒ වගේ ස්පාර්ක් වන වේගය තත්පරයට කෝටි වාරයක්. ඒ තරම් වේගවත් ප්‍රවාහයක් තමයි ගඟ ගලනව වගේ, වැස්ස වහිනව වගේ. ස්පාර්ක් වන වේග ප්‍රවාහයක් තමයි අපේ මේ ඇස.

'චක්ඛු විඤ්ඤාණය' ඒක තමයි මේ ස්කන්ධ විග්‍රහය. රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ රූප කියන්නෙ රුප්පනය. රුප්පනය කියන්නෙ මේ ස්පර්ක් වන වේගය. උජ්ජිත්තදි මේ කම්පන වේගය. එහෙනම් ඒ රුප්පන්තිකෝ ආවුසෝ රූපං වදේති' එහෙනම් මේ රූප කියන්නෙ රුප්පන වේගයක්. ඒක කම්පන වේගයක් ඒක ස්පාර්ක් වේගයක් වචනෙ කිවුවත් එකෙ තියෙන්නෙ රුප්පනය. ඒ වේගෙට, ඒ කම්පන වේගයට ඒ ස්පාර්ක් වන වේගයට අර බල්බ් එකේ ධනයි ඍණයි බල්බ් එකේ වයර් දෙක ඒක ස්පාර්ක් වෙවී තියෙන කොට ආලෝකයක් ලැබුන. අන්න ඒකෙන් බල්බ් එක පත්තුවෙනව. තව විදිහකට කියනව නම් අහසෙ විදුලි කොටන කොට එක දිගට අඛණ්ඩව වේගයෙන් විදුලි කොටනව නවතින්නෙ නැතිව එහෙම තිබ්බොත් එහෙනම් මුළු අහසම ආලෝකමත් වෙනව. මෙන්න මේකම තමයි මේ ඇස කියන මේ නාභිගත වන වීම තුළ සිද්ධ වෙන සිද්ධි.

**ස්පාර්ක් වන වේගෙට අපිට මේ ආලෝකය මැවෙනවා. දැන් ඔබේ ඇස් අන්ධ නම් ඔබට තියෙනවද ආලෝකය. මේක තමයි සිද්ධිය, අන්න ඇසේ ආයතන කෘත්‍යයෙන් මැවෙන හැඩතල. ඒ කියන්නෙ එතන නෑ මේ පුටුද මේසද ඇඳන් ද කියන එක.** අර ඉංග්‍රීසි ජාතිකයන් කියන්නේ ටේබල් චෙයාර් ඒවා නෑ. ඇයි ඒ එතන ශබ්ද නෑ. එතන තියෙන්නෙ ආලෝකයක් විතරයි. ආලෝක හැඩතල ඒ ස්පාර්ක් වන වේගෙට මැවෙන එක තමයි. අර ස්පාර්ක් වන වේගය රුප්පන වේගය 'රූප, වේදනා' ඒක දැනෙන එක, ඒකමයි සංඥාව. ඒකමයි නැවත නැවත නැවත ස්පාර්ක් වෙලා සංඛාර සකස් වන එක. ඒකමයි එතකොට විඤ්ඤාණයේ දැන ගැනීම 'සංඛාර'. බුදුන් වහන්සේ උපමා කරන්නෙ ගිනි බෝලය කැරකෙන වේගෙට වළල්ල පේන එක විඤ්ඤානය. වේගය

සංඛාරා. මේවා ඔක්කොම ප්‍රොසෙස් එකක්. ඒ කියන්නෙ එකකට එකක් වෙන් කරන්න බෑ.

'ස්කන්ධ' විග්‍රහය 'වේග' විග්‍රහය, ඒක තමයි ආශ්චර්යමත් හෙළිදරව් කිරීම. ස්කන්ධයේ වේගය මේක ප්‍රවාහයක්. 'උප්පාද වය ධම්මිනො' එතන පවතින එකක් නොවෙයි. 'ඨිථත්ත අඤ්ඤඨත්තං පඤ්ඤයතී' කියන්නෙ උප්පාද පඤ්ඤායතී - වයෝ පඤ්ඤායතී' කිසි දෙයක් ඒ කියන්නෙ ස්පාර්ක් වන වේගය, ඇතිවන නැතිවන ප්‍රවාහය තමයි. 'උප්පාද වය ධම්මිනෝ, අප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තේසං වූප සමෝ සුඛෝ' ඒක දකින එක තමයි ඔබේ නිවන් මග. මේක නුවණට හසුවෙන්නෙ එතකොට මෙතන ආලෝක හැඩතලය මැවෙන හැටි. ඒ වගේම තමයි කන් බෙරයට එන ශබ්ද වයිබ්‍රේට් වෙන ට්රෑ - ට්රෑ ගගා ඒකත් අර වගේමයි තත්පරයට කෝටි වාරයක් විශාල වේගයක්, ඒ වගේම හර්ට්ස් විස්සයි විසිදහයි කියන්නේ විශාල වේගයක්.

ඔය කන් බෙරය හෙල්ලෙන එක, කන් බෙරය පුපුරළ නම්, කන් බෙරය ගනකම් වැඩි නම්, හෙල්ලෙන් නැතිනම් ඔබට ශබ්දය නෑ. අහසේ විදුලි කොටන කොට මේ ජනෙල් හෙල්ලෙනව වගේ මේ එළියෙ ශබ්ද තියෙනව නෙවෙයි. අංශු කම්පන මේ. මෙතන කන්පටලය කම්පන වෙන එකයි ශබ්දය කියන්නෙ. ඒ කම්පන වේගය ශබ්දය එතකොට, මේකත් මෙතන මේව ඔක්කොම ආයතන කෘත්‍යයක්. ප්‍රොඩක්ට් එකක් නිර්මාණයක් කොහෙවත් තියෙනවා නෙවෙයි. අන්න මව් කුසින් එළියට එන ලේ කැටි දරුවා මුකුත් දන්නෙ නෑ. ඉපදෙනවද මැරෙනවද කියලවත් දන්නේ නෑ. ඒව ඔක්කොම ශබ්ද වර්ණවලින් එකතු කරල තියෙන්නෙ.

'මේ පුතේ, මේ අම්ම' කියන කොට 'අම්ම' කියන ශබ්දය කණට එන්නෙ එතකොට ඇහැට එන්නෙ හැඩතලය. දෙක එකට අන්න ශබ්ද වර්ණ එකට එකතු වෙන්නෙ. ශබ්ද තරංග වර්ණ තරංග එකතු වෙන කොට චිත්ත තරංග. ඒ කියන්නෙ තත්පරයකට කෝටි වාරයක වේගයෙන් මේ එක ක්ෂණයෙන් මේ මොහොතෙම ඒ ඇහැට එන හැඩතලය, ශබ්දය දැම්මොත් ඒ ශබ්දෙත් එකට එන එකයි, ඒක තමයි ස්පර්ශය කියල කියන්නෙ. 'තින්නං සංඝති පස්සෝ' එකට එනකොට දැනෙන එකයි විඤ්ඤාණය. ධම්ම, ධම්ම හැදෙන එක ඒ කියන්නෙ අම්ම, තාත්ත,

අයිය, අක්ක 'මනසංච පටිච්ච ධම්මේසු උප්පජ්ජති මනෝ විඤ්ඤාණං' මනසංච පටිච්ඡ ධම්මෙසු මේ ධම්ම කියන එක. ඒ කියන්නෙ පටිඝ සම්පස්සයට අධි වචන සම්පස්සයක් කියන එක. ඒ ආකාරයට ඒ ලිංග ඒ නිමිති ඒ උද්දේශ ඇති අධි වචන සම්ඵස්සය.

නාමරූප කියන්නෙ පටිඝසම්ඵස්සයට අධි වචන සම්ඵස්සයක් එකම කතාවක්. ඒ කියන්නෙ ඔබ නාම රූප කියල කියන්නෙ ඔබට මේ පුංචි දරුව අර තොට්ල්ලෙ ඉන්න දරුවට දෙන්නෙ මොකක්ද. අර අම්මගෙ ෆෝන් එක දෙනව කිව්ව වගේ. ඒ දරුවාගෙ ස්පාර්ක් වන වේගෙට වර්ණ සෙන්සස්වල ශබ්ද ගන්ධ රස ස්පර්ශවල ඒ දරුවා ඉඹිනවා මිරිකනව ලෙවකනව ඔබනව. ඊට පස්සෙ අන්න ඒ සෙන්සස් වල වේගෙට මේ කම්පන වේගෙට මේකට එනව ආරෝපණ බලයක්. මේ ඇස කියන එක, ආයතන ගත්තත් ඒ කම්පන වන වේගෙට එනව ආරෝපණ බලයක් ඒක 'චිත්ත ආරෝපණය'. ඒක ආරෝපණ බලයක්. අපි සාමාන්‍යයෙන් බඹරයක් කරකවන කොට බඹරෙ විසින් බල ගැන්වෙනව වගේ.

මේක අර පෘථිවිය කැරකෙන වේගෙට උත්තර ධ්‍රැවය, දක්ෂිණ ධ්‍රැවය අර ගුරුත්වාකර්ශන බලය හැදෙනව වගේ චිත්ත ආරෝපණ බලයක්. බලයක් මෙතැන හැදෙනවා. ඒ බලය තමයි මේ එකතු වෙලා දැනෙන ගතිය තමයි ඒක ඝන සංඥා නිරූපනය වෙන්නෙ හේතු වෙන්නෙ. ඒකම තමයි අර 'සාසවීය' ගම් එක බලය. ඒකම තමයි මෙතන කෙලෙස් බවට සාසවිය ආශ්‍රව බවට පත්වෙන්නෙ. එහෙනම් මේ පුංචි දරුවගෙ මේ සෙන්සස් ස්වභාවය සකස් වන ආකාරය ඒක දැක්කොත් ඔබට පෙනෙයි අර ශබ්ද වර්ණ එකතුවෙලා. අන්න ඒකම තමයි අර තොට්ල්ලෙ ඉන්න දරුවට ෆෝන් එක දෙන කොට ඒ දරුව ඒ ස්පාර්ක් වන වේගෙට ඒකට හිනාවෙන කොට ඔක්කොම තියෙනවනෙ අර ආයතනවල ඒ කෘත්‍ය. ඊට පස්සෙ ෆෝන් එක ගන්න ගියාම ඒ දරුව අඬනවා. ඒකට හේතුව එතන සිද්ධ වෙන සිද්ධිය.

හොඳට බැලුවොත් පෙනෙයි, නුවණින් දැක්කොත් මෙතන තියෙන්නෙ 'ස්පාර්ක්' වන වේගෙට කම්පන වේගෙට සකස් වෙනව අර ඒ ඒ ස්පාර්ක් වන වේගෙටම එනව සාසවීය ගතියක්. ඇසට කණට දිවට නාසයට කයට සෙන්සස්වල ප්‍රසාදවල එකටම එනව. සෙන්සස් කියන්නෙ ප්‍රසාද

කියන එක, එතකොට ඒක තමයි දකින්න ඕනෙ. ඒ කම්පන වේගෙට ඒක සකස්වන ආකාරය, ඒක නුවණට හසුවෙනව. එතකොට මෙන්න මෙතන තමයි මේකෙ තියෙන වැදගත්ම තැන. මේ පැහැදිලි කරන තැන. මොකද රූපය පර්ජානාති මේ රූපය අවබෝධ කරන එක. මේ ක්‍ෂණ මේ සිත අවබෝධ කරන එකයි තියෙන්නෙ.

මේ අපිට බිත්තිය පේනව මේ මොහොතෙ. බිත්තිය දකිනවා. බිත්තිය කොහෙන්ද ආවෙ? එතකොට මේ මොහොතෙ, **මේ බිත්තිය මේ මොහොතෙ හැදිච්ච එකක් නොවෙයි. එහෙනම් පෙර සිත කඳ පිළිවෙල දකින්න වෙනව. අන්න 'පුබ්බේ නිවාසනුස්සති ඤාණයට යනව. මේ දකින එක 'චුතූපපාත ඤාණයට' යනව. ඒ පෙර සිත් කඳ පිළිවෙල දකින එක 'පුබ්බේ නිවාසානුස්සති ඤාණය' අන්න යන්න වෙනව අර තොටිල්ලෙ ඉන්න දරුව ළඟට. අර ශබ්ද වර්ණ එකතු වුන ආකාරය පේනව. එතකොට මෙතන නාම රූප කියල ගන්න කොට මෙතන ඔබ දකින්න ඕනෙ මේ නාම රූප වෙන් කරන්න බෑ. ඒකට හේතුව තමයි අර එන රුප්පනය 'රුප්පනයට දෙයක් වගේ දැනෙන එකයි 'නාමය' ඒකමයි විඤ්ඤාණයේ දැන ගැනීම දෙයක් වගේ දැනෙන එක, ඒකයි නාම රූප වෙන් කරන්න බෑ කිවුවෙ.** ඒක ස්පර්ශය කියන කොට පටිඝ සම්පස්ස අධි වචන සම්පස්ස කියන කොට 'නාම රූප පච්චයා විඤ්ඤාණං' තමයි 'තින්නං සංඝති ඵස්සෝ' කියන කොට එකම කතාව තියෙන්නෙ. ඒකම තමයි නන්දිය. ඒකම තමයි අර 'ඵස්ස පච්චයා තණ්හා' 'උපාදාන භව ජාති ජරා මරණ ශෝක පරිදේව, පටිච්ච සමුප්පාදය.'

එතකොට මෙතන අවිද්‍යාව තියෙන්නෙ මෙතන දෙයක් කියල ගත්ත එක දැනෙන එක. ඒකමයි එතකොට අවිද්‍යා පච්චයා සංඛාර, සංඛාර කියන්නෙ වේගෙට සකස්වන එක. 'සංඛාරා' වේගය නිසා තමයි මේක දෙයක් වගේ දැනෙන්නෙ. ඒක චක්ඛු විඤ්ඤාණය ගත්තත් එහෙමයි. සෝත විඤ්ඤාණය ගත්තත් එහෙමයි. එකට එකතු වෙලා එන මනෝ විඤ්ඤාණය ගත්තත් එහෙමයි. මේවා කවුරුත් කරනවා නෙවෙයි. නහිදං අත්ථ කතං බිම්බං නහිදං පරකතං අඝං' මේ ප්‍රතිබිම්බය තමා හැදුවෙත් නෑ. වෙන කෙනෙක් හැදුවෙත් නෑ. 'හේතු පටිච්ච සම්භූතා හේතු භංග නිරුජ්ඣති' මේක සොබා දහමේ නිර්මාණයක්. මේක

ස්වභාවික සංසිද්ධියක්. මේක අවබෝධ කරන කොටයි තේරෙන්නෙ මෙතන සෙන්සස් වල සිස්ටම් එක, මොකක්ද මෙතන ක්‍රියේට් වෙන්නෙ. කොහොමද ආත්මය හැදෙන්නෙ කියන එක. කොහොමද මේ දෙයක් වගේ දැනෙන්නෙ පුංචි දරුවාට කොහොමද?

පුංචි දරුවා ඉපදෙන කොට මුකුත් දන්නෙ නෑ. ඉපදෙනවද මැරෙනවද මොනවත් දන්නෙ නෑ. කොහොමද මේ දරුවාට ආත්මය ඊට පස්සෙ හැදෙන්නෙ කොහොමද මෙන්න මෙතනයි. ඇසේ උපතයි උපත. ජාති ජම්ම සූත්‍රයේ පෙන්වන්නේ 'ස්කන්ධානානං පාතිභාවෝ ආයතනා නං පටිලාභෝ' 'අයං වුච්චති ජාති' මහණෙනි ඇසේ උපතයි. උපත 'සලායතන ලෝකෝ ලෝකෝ' 'සලායතන නිරෝධෝ නිබ්බාණෝ' එහෙනං ඇස අවබෝධ කිරීමයි නිවන කියන්නෙ. එතනයි නිවන තියෙන්නෙ. එහෙනම් මෙතන තියෙන්නෙ මේ මෙහොතෙ මේ අරමුණ අවබෝධ කිරීම.

මේ ඔක්කොම කතාව තියෙන්නෙ එක අරමුණක. එතකොට ඒක දැක්කොත් තමයි අන්න 'ආසාවානම් ඛෙයයම් වදාමි' ආශ්‍රව කෙළෙස් ක්ෂය වෙන්නෙ. මේකට තියෙන ආරෝපණ බලය දියවෙන්නේ. ඒ කියන්නෙ ඔබට එන අරමුණු බලගැන්වෙන්නෙනෑ. ඒකට ඇති ඡන්ද රාගය දුරු වෙන්නේ එහෙම වුනොත් ඔබ අන්න එතනම ඔබ නිවනයි දකින්නෙ. ඒ අරමුණ අන්න 'අජ්ජෝසා තිට්ඨති' බැස ගන්නේ නෑ. ඒකයි අර උපාදාන වෙන්නෙ නෑ කියන්නෙ. 'අජ්ජොසාය තිට්ඨති' බැස ගත්තෙ නැත්නම් 'අජ්ජෝසාය තිට්ඨති' 'යාරූපේ නන්දි' අන්න රූපේ 'නන්දිය', ඒකට අගයක් එන් නෑ. ආරෝපණ බලය එන් නෑ. 'තදූපාදානං' බන්ධන බලය නැති නිසා උපාදාන බලය නැති නිසා 'භවෝ' දෙයක් වගේ දැනෙන්නෙ නෑ. 'භව නිරෝධෝ නිබ්බාණෝ' කියන තැනට එනව. එහෙනං ජාති ජරා මරණ ශෝක පරිදේව එතන හම්බවෙන්නෙ නෑ. අරමුණෝ මේ සත්‍ය දැකීම තුළම නිවන තියෙනව. එතැන නාමරූප පරිච්ඡේද ඥානය තියෙනවා. ඇයි මෙතන දෙයක් වගේ දැනෙන් නෑ.

අර පුංචි දරුවාට අර අම්මා ෆෝන් එක දුන්නම දෙන් නැත්තේ ඇයි. අර ආරෝපණ බලවලට එනව ආකර්ශන බලයක්. ඒ බලයට අර ඊට පස්සෙ, අර 'විකර්ශන බලයත්' එනව. ඒකයි අම්ම ගන්න කොට 'චෑස්'

කියල ගාලා කෑ ගහන්නෙ ඒකයි. මොකද ෆෝන් එක කියල දැනගෙනද? නෑ. අර සෙන්සස්වල ආරෝපණ බලයට තමයි අරක ඇලිල තියෙන්නෙ සෙන්සස්වල ආරෝපණ බලයට. අර ගුරුත්වාකර්ෂණ බලය වගේ විද්‍යුත් ආරෝපණ බලය වගේ මේ චිත්තරෝපණ බලය. ඒ ආරෝපණ බලයට මේක ඇලිල තියෙන්නෙ. ඒක නිසා තමයි 'වෑස්' ගාල කෑ ගහන්නෙ. අපි මෙතන එතකොට දැනෙන ගතියක් එනව. ඒක තමයි මේ දැනෙන ගතිය තමයි අපි කතා කරන්නෙ මෙතන නාමීය ස්වභාවයක් කියල. ඒ කියන්නෙ රූප ස්වභාවයක් රුප්පන ස්වභාවයක් නාමීය ස්වභාවය දෙයක් වගේ දැනෙන ගතියක්.

නම් කරන ලද්දේ නාමයයි. නාමයට සියල්ල යටයි. එතකොට නම් කරන්නේ ශබ්දයෙන්. නමුත් මේක දෙයක් වගේ දැනෙන දැනීමයි මේ ශබ්දය දාල නම් කරන්නෙ. අපි දැන් ගොඩක් වෙලාවට මේක අපිට ප්‍රායෝගික පැත්තෙදි තේරෙන්නෙ. දැන් අම්ම කිවුවොත් මේක අඹ ගහ දැන් පුංචි දරුවට කියනවා. එයා මුකුත් දන්නෙ නැහැ. 'අම්මෙ මේ මොකක්ද? 'මේක ඉර' මේ මොකක්ද අම්මේ ? හඳ එතකොට මේ ශබ්දයක් දැම්මෙ, එතකොට ඇසට ආවෙ රූපයක්. එතකොට දෙයක් වගේ මේ ශබ්ද වර්ණ දැමීමෙන් දෙයක් වගේ එනව. දෙයක් වගේ එනකොට ආ ඒ මොකක්ද තියෙන්නේ, හඳ. හඳ කියන්නෙ ශබ්දයක් ධ්වනියක් කම්පනයක්. එතකොට මේ කම්පන මෙතන තියෙන්නෙ.

ශබ්දය ගත්තත් කම්පනයක් වර්ණය ගත්තත් කම්පනයක්. එතකොට **මේ කම්පනය තුළ දෙයක් වගේ දැනෙන කම්පනයක් එනව. අන්න ඒක තමයි මෙතන මේ නාමිය දැනීම. අර ඒ ආකාර ඒ ලිංග ඒනිමිති ඒඋද්දේශ මෙතන පටිඝ සම්පස්සයක් එතකොට අධිවචන සම්පස්සයක් කිව්වෙ චිත්ත ස්වභාවයක්**. එතකොට මේක ආරෝපණ බලයක්. ඒකයි නාම රූප. මෙතන මේ නාම රූප අවබෝධයමයි තියෙන්නෙ. ඒ අවබෝධය තුළමයි නාම රූප 'උපරුප්ජනය' වෙන්නෙ. මෙතන ආත්මයක් නැති බව. මේ ආත්මය හැදෙන හැටි දකින තැන මෙතනමයි. මෙතනින්මයි ඔබට ආත්මය ගිලිහිලා යන්නෙ. ඒ තාක්කල් 'රූපං පර්ජානාතී' වෙන්නෙ නෑ. රූපං 'පරජානාති නොවන තැන ඔබට බිත්තිය ඇත්ත වෙනව. දැන් කොහොමද ඔබ මේ අරමුණේ සත්‍ය දකිනවා කියන්නෙ. එහෙනං

'යථාභූතං පජානාති' කියන එක තියෙන්න ඕනෙ. දර්ශන ඥානය තියෙන්න ඕන.

එහෙනම් මේ දර්ශන ඥානය ගැන කතා කරන්නෙ. පූර්ව භාග ප්‍රතිපදාව මේකයි සමාජයට ගිලිහිලා තියෙන්නෙ. එහෙනං 'රූපං පර්ජානාති' කියන තැන මේකයි. මේ රූපය අවබෝධ කරන එකක්. ඒ රූපය අවබෝධ කළොත් විතරයි 'ඉති රූපං සමුදයෝ කියන තැනට එන්නෙ. ඒ 'ඉති රූපං සමුදයෝ' ඉති රූපය ඔබ අවබෝධ කළ යුතුයි. එහෙනම් ඒක ප්‍රායෝගික පැත්ත විදර්ශනා ධූරයේ තියෙන්නෙ. මේ සියල්ල විදර්ශනා ධූරයේ ප්‍රායෝගිකව පැහැදිලි කරන්නේ ප්‍රායෝගික පැත්තෙන් ඇයි ඒ. ඔබට න්‍යාය අතහැරිල නෙවෙයි. ග්‍රන්ථ ධූරය අතහැරිල නෙවෙයි, ඒකෙන් අරගෙන පෙන්නන්නෙ. මේ ඔබ අපි දකින දේ අපි අත්දකින දේ ප්‍රායෝගිකව ඒ ආකාරයෙන්ම ඔබට න්‍යායාත්මකව මේක ගලපල පෙන්වන්නෙ බලන්න මේ දේ නොවෙයිද වෙන්නෙ කියල.

ඔබට දැනෙයි මේ ප්‍රොසෙස් එකක් මේක වේගයක්. ඒකයි බුදුන් වහන්සේ 'දිට්ඨි' සංයුතියට ගියහම කියන්නේ වාත සූත්‍රයෙන් පලවෙනියට පටන් ගන්නෙ. අන්න තියෙනවා කියල ගත්තොත් හුළඟ හරි තියෙනවා. ගඟ තියෙනවා කිව්වොත් මිථ්‍යාදෘෂ්ටියක්. ඇයි ඒ ගඟ කියන්නේ වේගයක් ගලනවට. ගඟ කියල දෙයක් කොහෙවත් නෑ. ඇල්ලුවොත් වතුර ටිකක්. ගලන වේගෙට ගඟ කිව්වෙ. වැස්ස කියන්නෙ වතුර බිංදු වැටෙන වේගෙට. වැස්ස කියල දෙයක් කොහෙවත් නෑ. එතකොට සුළඟ කියන්නෙ වේගයක් වේග රූපයක්. අර ඨිථියක් කියල ගත්තොත්, ඒ කියන්නෙ 'වාත සූත්‍රයේ' පෙන්වන්නේ. මේ අපි ඒකයි කිවුවේ 'උප්පාද පඤ්ඤායති - වයෝ පඤ්ඤායති' ඨිථත්ත අඤ්ඤථත්තං පඤ්ඤායති' ඨිථියක් නෑ. හැබැයි ඨිථියක් ගත්තොත් ඨිථිය ගඟ තියෙනව කියල ගත්තොත් 'වාතයෝ නොහාමති' කිව්වොත් මහණෙනි මිථ්‍යා දෘෂ්ටිකයි කියලයි කියන්නේ.

ඒ කියන්නේ වාතයේ සුළඟ තියෙනවා කියල ගත්තොත්, ගඟ තියෙනවා කියල කිවුවොත්, වැස්ස කියල දෙයක් තියෙනවා. අපට සුළඟ කියල දෙයක් තියෙනවා. අපට ගඟ කියල දෙයක් තියෙනවා. එහෙම නැත්ද තියෙනවා මේක කොහේ හරි තියෙනවද නෑ. ඔන්න ඕකයි ඇත්ත.

මේක **'අවබෝධ ඥදනයක්' ගඟ කියල දෙයක් නෑ කියන එක අවබෝධ ඥානයක් වැස්ස කියල දෙයක් නෑ කියන එක. ඇයි අර හැඩතලයට ශබ්දයක් දාල තියෙන්නෙ. අර වතුර බිංදු වැටෙන හැඩතලයට ශබ්දයක් දාල තියෙන්නෙ වැස්ස.** අර සුළඟට වේගෙට දාල තියෙන්නෙ ශබ්දයක්. එතකොට හබ්දය කියන්නේ නම් කරන ලද්දේ නාමයයි. නාමයට සියල්ල යටයි කිවුවෙ ඒකයි. එතකොට ඒකම තමයි නාම වෙන්නෙ. ඒකම තමයි නාම රූප වෙන්නෙ.

නාමරූප මේ පෙන්නන්නේ ප්‍රායෝගික පැත්තෙන් ඔබට කියනව දැන් මේ පැත්තෙන් පිච්ච මල කියල. ඔබට රූපයක් මැවෙන් නැත්ද. අර රූපය කොහොමද ආවේ ශබ්දය නිසා. දැන් මේව එකතු වෙලා නැත්ද? කාටහරි කියන්න පුළුවන්ද බොරු කියල. ඇයි ඒ එයා ඒක කිවුවම එයා එකතු කරගෙන ඉන්නෙ, එයා හැදිල තියෙන්නෙම එකතු වුණා කියන එකමයි එයා කියන්නෙ. ඒකට හේතුව ඔබට දෙයක්, තියෙන දෙයක් වගේ දැනෙන එකමයි ආත්මය කියන්නෙ 'එතං මම' 'එතෝ හමස්මිං' 'එ මේසෝ අත්තා' බිත්තිය ආත්මය කියන්නෙ, බිත්තියෙන් තොර ආත්මයක් නෑ. බිත්තියේ නිරූපනය ආත්මීය දැනීමමයි පුංචි දරුවට ආත්මය වෙන්නෙ අම්මේ මේ මොකක්ද? මේ ඉර මේ මොකක්ද? මේ සඳ. දැන් කවුරු හරි කියනවා පුතේ මේ අම්ම ම්...ම්.. ගාලා. අන්න කර්ණසංඛ පටලය කම්පනය වන සංඛ්‍යාත පටලයට සමාන සංඛ්‍යාතයකට අර ප්‍රාස්වාස වාතය සමග ස්වරාලය පටලය අර වයිට්බ්‍රේට් වෙනව මම්...ම්ම්... ගාලා 'අම්ම' කියල කතා කරනව කියන්නෙ ඕකටයි.

ප්‍රතිකම්පන තියෙන්නෙ භාෂාව කියන්නෙ කතා කරනවා කියන්නෙ ඔතන ආත්ම කතාවක් නැහැ සිස්ටම් එකක් තියෙනව අවබෝධ කරන්න. ඒ කොහොමද වෙන්නෙ කියල. දිගටම අපි මහා නිදාන සූත්‍රය බලන්න පොඩ්ඩක්. පැහැදිලි කරන ආකාරය. මව්කුසේ ඉඳන්ම යුක්තානුවේ ඉඳන්ම ශෛලවල විභේදනයේ ඉඳන්ම මේ කතාව දිගින් දිගටම පැහැදිලි කරනවා. විඤ්ඤාණය කියන්නෙ කොහෙවත් තියෙන එකක් නොවෙයි. විඤ්ඤාණය කියන්නෙ එතන එතන අපි ගත්තොත් යුක්තානු ශෛල වර්ධනය වෙන කොටම එතන දැනෙන ස්වභාවයක් තියෙනවා. ඒකත් විඤ්ඤාණ දැනීමක් තමයි. විඤ්ඤාණය කියන්නේ, පිදුරු නිසා

හටගත් ගින්න පිදුරු ගින්න. දර නිසා හටගත් ගින්න දර ගින්න මේක බුදුන් වහන්සේමයි දේශනා කරන්නෙ. මේ වගේ තමයි ශබ්දය 'සෝත විඤ්ඤාණය' 'වර්ණය' අන්න නම් කියනවා. අපි කියනව මේ චක්ඛු විඤ්ඤාණය. මේක සෝත විඤ්ඤාණය. මේක ඝාන විඤ්ඤාණය. මේක ජිව්හා විඤ්ඤාණය. මෙය කාය ප්‍රසාද විඤ්ඤාණය.

මොනවද විඤ්ඤාණය කියන්නෙ. එතන ශබ්දය දැනෙන එක (ශබ්ද) සෝත විඤ්ඤාණය. ඒක වචනයක් විතරයි. විඤ්ඤාණය කියල දෙයක් කොහේවත් නැහැ. ඒක තමයි ඇත්ත කතාව අපි මේ භාෂාව මත ලැගල ඉන්න එපා කිවුවෙ. භාෂාව මත ප්‍රතිෂ්ඨාපනය වෙන්න යන්න එපා. එය රැවටීමක්. භාෂාව බොරුවක්. එහෙම එකක් කොහෙවත් නෑ. ඒක තමයි විඤ්ඤාණ මායාව. විඤ්ඤාණය කියල දේකුත් කොහෙවත් නැහැ. මේක 'අභිසංකරණය' වෙලා. දෙයක් වගේ දැනෙන කොට මේක අභිසංකරණ විඤ්ඤාණය. ඒක කොහෙද තියෙන්නෙ. එහෙම එකකුත් කොහේවත් නැහැ. මේක දැන් ඊට පස්සෙ ධර්මය අවබෝධ වෙනකොට මේක නොදැනෙන ස්වභාවයක් එනව. **ජේනව දැනෙනව ඇහෙන කොට ඒ වුනාට ඒවායේ අගය නැති වෙනවා. ඒකට කියනවා 'අනිදස්සන විඤ්ඤාණය' ඒක කොහේද තියෙන්නෙ. එහෙම එකකුත් නැහැ. දැන් ඊට පස්සෙ දෙයක් තියෙනව කියල ගන්නකො. ඒක 'පටිච්චිත විඤ්ඤාණය' වචනයක් විතරයි.** මේක හඳුනාගන්න. භාවිතා කරන වචන ටිකක් විතරයි. ශබ්ද ටිකක් විතරයි.

සන්නිවේදනය කියන්නෙ ශබ්ද ටිකක් එච්චරයි. මරණය ගැන අරන් බලන්නකො. අම්මෙ, මේ මොකක්ද. පුතේ ඕක මරණයක්. ඈ අම්මෙ. ඒක මරණයක් පුතේ. ඕක තමයි මරණය කියන්නෙ. ඔව් මරණය කියන්නෙ රූපයට දා ගන්න ශබ්දයක් විතරයි. ශබ්දයයි රූපයයි එකතු වුනාම ආ ඒක තමයි මරණය. එතකොට අම්මෙ ඉපදීම එහෙනම් අම්මෙ අර ඉපදීම? **ආ... ඒකත් රූපයක් දාගෙන තියෙනව ශබ්දය වර්ණයයි විතරයි මෙතන. මරණයක් නැහැ. ඉපදීමක් නැහැ. මේකෙ තියෙන්නෙ ස්පාර්ක් වන වේගයට ශබ්දයයි වර්ණයයි එකතුවන සිස්ටම් එක අවබෝධ කරන එක විතරයි. ආත්මයක් කොහෙවත් හම්බවෙන්නෙ නැහැ.** මෙතන පෙන්වන්නේ ඔතනින් තමයි ආරෝපණය හැදෙන හැටි දකින්න ඕනෙ.

මෙහෙම දැක්කොත් තමයි ඔබ අන්න 'චක්ඛුං උදපාදී - ඤාණං උදපාදී' විජ්ජා උදපාදී ආලෝකෝ උදපාදි' අන්න ප්‍රඥා උදපාදී 'පඤ්ඤා භාවේ තබ්බං විඤ්ඤාණං පරිඤෙය්‍ය' කීවේ, විඤ්ඤාණ මායාවට නොරැවටී ඉන්න එකමයි ප්‍රඥාව කියන්නෙ.

ප්‍රඥාව කියන්නෙ දැනුමක් නොවේ. පඤ්ඤා භාවේ තබ්බං විඤ්ඤාණං කිව්වෙ එහෙම විඤ්ඤාණය පර්ජානාති ඒ කියන්නෙ විඤ්ඤාණ මායාවේ සත්‍ය දකින එකයි ප්‍රඥාව. විඤ්ඤාණ මායාව දෙයක් කියල හැම තිස්සෙම පෙන්වනව පුටුව, මේසය, ඇඳ, අම්මා, තාත්තා. එතකොට වේගයට සකස් වෙනවා. ශබ්ද වර්ණ එකතුවන වේගයට අනුව සකස් වෙනවා අන්න සංඛාරා සියල්ලම සංඛාරා. ශබ්ද වර්ණවල දෙයක් නැහැ. මේ ධර්මය අවබෝධ වුනොත් ඔබ සාමාන්‍යයෙන් වෙනදා විදිහටම වැඩ කරනව පේනවා දැනෙනවා ඇහෙනවා. ඔබ අන්ධ වෙලා නෑ. බිහිරි වෙලා නැහැ. රහතන් වහන්සේත් මන්ද බුද්ධික වෙලා නෑ. සාමාන්‍ය විදියම තමයි. මුකුත් වෙනස් වෙලා නෑ. කණ්ණාඩියෙ දෙයක් නැහැ කියල. කණ්ණාඩියේ සේරම පේනවා ඒත් කණ්ණාඩියේ දෙයක් නැහැ කියල අපිත් දන්නවා. ඕකම තමයි අවබෝධ ඤාණය. ඕක උපමාවක් ඉතින් ඕකම තමයි ඇත්ත.

ලෝකය ඔක්කොම පේනව ඇහෙනවා දැනෙනවා, නමුත් එහෙම දෙයක් සාමාන්‍යයෙන් ඔබට අවබෝධයි කණ්ණාඩියෙ දෙයක් නැහැ කියල. ඔබට අවබෝධයි ඇත්ත ලෝකයෙත් දෙයක් නැහැ කියල. එහෙම වුනොත් මොකද වෙන්නෙ පුදුම සැහැල්ලුවක්නෙ දැනෙන්නෙ. ඇයි අඬන්නෙ මොකටද, මොකටද වැළපෙන්නෙ කොහෙද තියෙන්නෙ. ඔය සිතුවිලිනෙ දැන් මරණය කියන්නෙ මොකක්ද සිතුවිල්ලක්. ඉපදීම සිතුවිල්ලක්, ශබ්ද වර්ණ විතරයිනෙ. ඔබට ඔබ අහිමි වෙන තැන ඔතනයි. බිත්තියෙන් තොර මමෙක් නැහැ කියන්නෙ, ඔබට දැන් සෙන්සස් ටික විතරයි පේන්නෙ. මොකක් හරි දැක්කොත් ඒක ඇහැ. ඇහුනොත් ඒක කණ. ඒ කියන්නෙ බිත්තිය නම් බිත්තියටම තමයි ආත්මය කියන්නෙ. 'ඒතං මම' ඒක තියෙනව කියන්නෙ එතන මාත් ඉන්නවා. 'ඒතෝ හමස්මිං' 'එ මේසෝ අත්තා' 'මම' 'මගේ' 'මගේ ආත්මය' කියන්නෙ අර

දැනෙ ආරෝපණය, අර බඹරෙ කැරකෙන කොට දැනෙන බලය වගේ ආරෝපණ බලය.

ස්පාර්ක් වන වේගයට මෙතන හැඩතල එනව ශබ්දයත් ඒ වේගයෙන්ම එනව. දෙක එකට එකතුවෙලා දෙයක් වගේ දැනෙන කොට, ඊට පස්සෙ දිගටම ස්පාර්ක් වෙන්නෙ 'මම' දේවල් දැන් තොටිල්ලෙ ඉන්න දරුව මේක දන්නෙ නැහැනෙ. මේ ලෝකෙ මොකක්ද ගෑනුද, පිරිමිද, ඇමරිකාවද, ලංකාවද මුකුත් දන්නෙ නැහැනෙ. තොටිල්ලෙ ඉන්න දරුව ඊට පස්සෙ ලොකු වෙනකොට මොන්ටිසෝරි යන කොට ශබ්ද වර්ණ දෙනවනෙ. ලෝකය හදනවනෙ. දැන් ශබ්ද දි දී, වර්ණ දිදී හදන්න එපැයි. හදල දොස්තර වෙනව. ඉන්ජිනියර් වෙනව ඔක්කොම තියෙන්නෙ සංඛාර බොරුවක් තියෙන්නෙ. මේකෙ ඇත්තක් නැහැ කොහෙවත්. අර ආරෝපණ ටිකක් විතරයි. දොස්තර මෙහෙමනෙ දැක්කනෙ ඉංජිනියර් මෙහෙමනෙ. ටයි දාගෙන අරව දාගෙන දැක්කනෙ. ලොකු පුටුවකුත් හම්බවෙනවනෙ. මේ නිකං සංඛාර ගොඩක් විතරයි. මේ ආරෝපණයක් විතරයි.

**මොකද ඔය කටට දාන ටික සැපද, ඔය ඇහැට දාන ටික සැපද ඇහැට පේන ටික සැපද කණට ඇහෙන ටික සැපද. එතකොට මේ ඇස කණ නාසය දිව කය තියෙනවා නේද සැප විඳිනවා කියල. කව්ද වින්දෙ. කොහෙද ඉන්නෙ.** දැන් අපිට වතුර තිබහයි. එතකොට වතුර දානව කටට නේ. එතකොට බඩට යනවා. එළියට යනවා. දැන් කවුද වතුර බීල තියෙන්නෙ. හිතට පුළුවන්ද වතුර බොන්න. ඔබට පුළුවන් වතුර බොන්න. හිතට බත් කන්න පුළුවන්ද. හිත බත් කාල තියෙනවද? හිතට ඇවිදන්න පුළුවන්ද? හිත ඇවිදල තියෙනවද? **හිත කියන්නෙ ශබ්ද වර්ණ ටිකක් කම්පනයක් විතරයි. හිතට එළවළු කපන්න පුළුවන්ද? ඔබට ඔබ අහිමි වෙනවා සත්‍ය දැක්කට පස්සෙ.**

මහණෙනි කල්පයක් හිටියත් වැඩක් නැහැ මහණෙනි මේ සත්‍ය මොහොතක් නොදැක. මේ සත්‍ය නොදැක කල්පයක් හිටියත් වැඩක් නැහැ. මේ ක්‍ෂණයක්වත් නැහැ බලනකොට. සත්වයෙක් නෑ පුද්ගලයෙක් නෑ දෙයක් නෑ. මේකෙ ප්‍රායෝගික පැත්ත හරි ආශ්චර්යයි. ඊට පස්සෙ මේක එදිනෙදා පේන්න ගන්නවා, මේකෙ 'සත්‍ය ඥානය' දැන ගන්නට

පස්සේ 'කෘත්‍ය ඥානය' කරන එකක් නොවෙයි. පූර්ව භාග ප්‍රතිපදාව තුළ දැනුමෙන් මේ ටික එනව කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය. දැන් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා 'ශ්‍රැතමය ඥානය' ඒ කියන්නෙ මේක අසා දැනගත් දැනුම තියෙන්නෙ, දන්නව මේකෙ මොකක්ද වෙන්නෙ කියල. දැන් ඒ වුනාට එදිනෙදා කාලයක් තිස්සෙ අභිසංස්කරණයට ලක්වෙලා තියෙන්නෙ. ඒ කියන්නෙ බඹරෙ කැරකිලා තියෙන්නෙ. ආරෝපණය වෙලා තියෙන්නෙ. දැන් දිගටම ස්පාර්ක් වෙනවා. ස්පාර්ක් එක මේක හරියට ගඟ වගේ වේගයක් දිගටම ස්පාර්ක් වෙනවා. ස්පාර්ක් වෙන්නෙ 'ධම්ම', ධම්ම ස්පාර්ක් වනවා දිගටම. හැබැයි එතන එතන ස්පාර්ක් වන එක විතරයි. මේක ප්‍රොසෙස් එකක්. සිස්ටම් එකක්. සිස්ටම් එක වැඩ කරනවා. ඊට පස්සෙ මොකද මේකෙ අගයක් තමයි හැදෙන්නෙ. හැම තිස්සෙම මේකට එනව ආරෝපණ බලයක්. ඒ ආරෝපණ බලය තමයි බැටිරියේ දිගටම කරන්ට් එක තියෙනවා, නිතරම දැනීමක් තියෙනවා මම ඉන්නවා කියල මම ජීවත් වෙනවා ලෝකේ තියෙනවා කියන්නෙම හැම තිස්සේම එන්නේ අරමුණක්. ඒ අරමුණ අපි හිතමු දෙයක් නිරූපණය කරනවා කියන්නේ දෙයක් තියෙනවා කියන්නෙ ලෝකයක් තියෙනවා කියලා.

ලෝකෙ තියෙනවා කියල හැබැයි හැම තිස්සෙම පෙන්වන්නෙ ස්පාර්ක් වන එකමයි. 'ධම්ම' ස්පාර්ක් එකක්. හැබැයි ඊට පස්සෙ මේක අවබෝධඥානය තුළ ඒක කුඩු වෙනව එහෙම දෙයක් නැති බව අවබෝධ වෙනවා. ඊට පස්සෙ මොකද වෙන්නෙ අර ආරෝපණය තියෙනවනෙ. ඒ ආරෝපණ බලය බන්ධන බලය, අන්න ඒක දියවෙන්න ගන්නවා. ඡන්ද රාගය දුරු වෙනවා කිව්වෙ ඒකයි. අන්න **'ආසෘවානම් ඛෙයයම් වදාමි'** ඇයි එහෙම කියන්නේ **'ජානතො අහං භික්ඛවේ පස්සතෝ ආසෘවානම් ඛෙයයම් වදාමි'** ආශ්‍රව කෙළෙස් දිය වෙනව කියන්නෙ ඕකමයි. 'ජානතෝ අහං භික්ඛවේ පස්සතෝ ආසෘවානං ඛෙයයම් වදාමි නො අජානතෝ නෝ ආපස්ස තෝ' දන්නහුටයි, දක්නහුටයි ආශ්‍රව කෙළෙස් ක්ෂය වෙන්නෙ. 'නො අජානතෝ නෝ අපස්සතෝ' නොදන්න කෙනාට. ඒ කියන්නෙ ශබ්ද වර්ණ සත්‍ය ඥානය නැති කෙනාට 'ආසවානං ඛෙයයම් වදාමි' කියල එකක් නම් සිද්ධ වෙන්නෙ නැහැ. ඒ කියන්නෙ ඇස් දෙක පියාගෙන භාවනා පන්තියෙ වාඩිවෙලා හිටියට සමථය වැඩුවා කියල ඒක වෙන්නෙ නෑ.

මේක විදර්ශනා ඤාණයෙන් අවබෝධ කරන දහමක්. ඒකයි මහණෙනි අවබෝධ කළ යුතු දහමක් තියෙනවා මහණෙනි. 'සංඛීතේ නිබ්බදාය' කිව්වෙ අවබෝධ කළ යුතු දහමක්. අවබෝධ කළොත් තමයි නිවන් දකින්නෙ. එහෙනම් මේ විදර්ශනා සමාධිය කිසි දවසක හිතන්න එපා අවබෝධ ඥානය පහළවන තෙක් නිකම්ම අර ඇස් දෙක පියාගෙන හිටියට හම්බවෙන්නෙ නෑ. පොට්ඨපාද අරූප ධ්‍යානයේ සිටියත් හම්බවෙන්නෙ නැත්තෙ ඒකයි. 'පොට්ඨපාඳ ඔබට මේක තේරෙන්නෙ නෑ. ඔබ ඉන්න ආත්මදෘෂ්ටිය ගිලිහුණ දවසටයි පොට්ඨපාද ඔබට මේ ධර්මය වැටහෙන්නෙ. ඒ කියන්නෙ ආත්ම දෘෂ්ටියෙ ඉඳගෙන විශ්ව ශක්තියට වැටුණා කියල හිතාගෙන ඉන්නවා පාවි පාවි. එයා නැතිවෙන්නෙ නැහැ. ඇයි ඒ නැති වෙන ක්‍රමය කොහෙද? අන්න ඇස් දෙක පියාගෙන හුස්ම දිහා බල බලා හිටියට සිද්ධ වෙනවද නැහැනෙ.

අපට කියනවා ආර්යයන් වහන්ස අවුරුදු තිහක් කළා. අවුරුදු විස්සක් කළා. ඒත් මේ ඔබ වහන්සෙ කියන දේ බැලුවම අපි ඉන්නෙ හිටින තැනමයි. මේක හරි පරිස්සම් වෙන්න ඕන. මේක ප්‍රායෝගික දහමක් මේ විදර්ශනා ධූරය. ග්‍රන්ථ ධූරය නොවෙයි. මේක පොතක ලියන්න බැහැ. ලුණු රස කොහොමද පොතේ ලියන්නෙ. තණ්හාව කොහොමද පොතේ ලියන්නෙ. නිවණත් කොහොමද පොතේ ලියන්නෙ. ඒකයි **'මාපිඨක සම්පදාය' පොතේ තිබ්බත් පිළිගන්න එපා මහණෙනි, කිව්වත් පිළිග න්න එපා. දැක්කත් පිළිගන්න එපා. ඇයි එහෙම කියන්නෙ. ධර්මයට විනයට ගලපන්න කියන්නෙ ඔබට මේක ප්‍රත්‍යක්‍ෂ ධර්මයක්. මේක ඔබට දැනෙනවා මේක ඔබට වැටහෙනවා.** මේ දහම අවබෝධ කළයුතු දහමක්. මේ විදර්ශනා සමාධි උපදින්නෙ අවබෝධක්ඥානය තුළයි. මේ විදර්ශනා සමාධිය කිසි දවසක ඔබට සමථය තුළ සමුවෙන්නෙ නැහැ. පොතක හමුවෙන්නෙත් නෑ. එය ඔබ අත්දකින දෙයක්. ඔබේ අත්දැකීම ඔබ කොහොමද කියන්නෙ. අපි දැන් මේකෙ අවසානයට ගිහිං පොඩ්ඩක් පෙන්නමු දැන් ආත්මයක් තියෙන බව ඔබට දැනෙනව. එතකන් ඔබට දුක තියෙනව. මැරෙනව කියල මර බියක් තියෙනවා. අලියෙක් ආවොත් ඔබ අනිවාර්යයෙන්ම පැනල දුවනවා. මේ දහම අවබෝධ වුනාට පස්සෙ ඒ කියන්නෙ දැනුම නොවේ. ඔබේ අභ්‍යන්තරයට ආත්මය ඔබට තියෙන බවට තියෙන බව දැනෙන එක ආරෝපණ බලයකින් හැදෙන

අපිකිච්චනෙ. මේක ආරෝපණ බලයක් මිසක කම්පන බලයක් සකස් වෙනව කියන එක. ඔබට මේ අවබෝධ ඥානය තුළ අවබෝධය තියෙන්නෙ කොහොමද? ලෝකය තියෙනවා කියන අවබෝධයක් ඔබට තියෙනවා කෙමෙස්ට්‍රි දන්නවා. ෆිසික්ස් දන්නවා. ලෝ එකත් දන්නවා. ඒ ඒ විෂය හදාරන කෙනා දන්නවා හරි වෛද්‍ය වෘත්තිය ගැන ඒක දන්නවා. නීතිය හදාරන කෙනා ඒක දන්නවා. විද්‍යාව දන්නවා. ඒ ඒ විෂයන් දන්නවා. හරි මොකක්ද දැන් වෙලා තියෙන්නෙ. **ඔබට ලෝකයක් තියෙනවා. ඔබට තියෙනවා කියන්නේ ඔබ ඉන්නවා කියන එකම තමයි. ඔබට තියෙනවා කියන එකම ඔබ ඉන්නවා කියන්නේ ඔබ ආත්ම ආරෝපණය,** ආත්මයක් තියෙනවයි කියන එකයි තේරුම.

ඔබ හදාගෙන තියෙන්නෙ මුකුත් නෙවෙයි ඔබ ඔබවමයි. දැන් ඔබට ඔබ ඉන්නවා කියල දැනෙනවා. මේකයි තියෙන්නෙ මෙතන. දැන් ඕක අවබෝධයක්. අවබෝධය දැන් ඔබට ඔබ ඉන්නවා කියල. දැන් මේ දහම අවබෝධ වුනාම මොකද දන්නවද වෙන්නෙ. **ඔබට ඝනට, ඝන සංඥාවෙන් ඔබ ඉන්නවා කියල දැනෙන ගතිය, ඔබේ අවබෝධය තුළ අන්න ඒ ඝනට තියෙන ඉන්නවා කියන දැනෙන ගතිය දියවෙන්නට ගන්නවා. දිය වෙන දියවෙන දියවෙන ස්වභාවය තමයි අර 'නිබ්බිදන්ති විරාගන්ති නිරෝධන්ති පටිනිස්සග්ගානුපස්සී' නිබ්බිදාවට එනව හරයක් නැති බව දැනෙනවා. මේක පෘතග්ජන නිබ්බිදාව නොවේ. මේකෙ තියන්නෙ සත්‍ය දකින කොට කිසිම දේක හරයක් නැහැ. ඒවායේ වටිනාකමක් නැහැ. ඒකයි වෙන්නෙ. ඒක විරාගයට යනව. රාගය නැහැ.** ඒකට තියෙන නන්දිය නැහැ පිනවන එක ඒව ඔක්කොම දියවෙනවා. දැන් මොකක්ද මේ කියන්නෙ. මේ වචනවලින් මේ ටික දාල තියෙන්නෙ. නමුත් වෙන්නෙ මොකක්ද මේ ලෝකයේ තියෙනවා කියල ගත්ත සිතුවිල්ල ඉස්සෙල්ලාම බිඳ වැටෙනවා. ඒක තමයි සක්කාය දෘෂ්ටිය ප්‍රහීන වෙනවා.

ඔබ ඉන්නවා කියන සිතුවිල්ල අර කණ්ණාඩියෙන් දැක්ක රූපය 'නිමල්' කියල ආ... මේ මම ඉන්නවා කියල සිතුවිල්ලක් තියෙනවා. අන්න ඒ සිතුවිල්ල කුඩුවෙලා යනවා. ඉස්සෙල්ලාම 'සක්කාය දිට්ඨිය ප්‍රහීන වෙනවා ඔබ ඉන්නවා කියන දිට්ඨිය. ඔබ මේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා, ඒ කියන්නෙ කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය මත ඔබ දැන

ගන්නවා, මේ දෙයක් තියෙනවා, බිත්තිය තියෙනවා කියන එකම තමයි ආත්මය කියන්නෙ. ඔබ දන්නවා ඒක දෘෂ්ටියක් කියල. ඔබ දැන් ගන්නවා ඇත්තටම මෙතන ඇවිදින කෙනෙකුත් නැහැ. කන කෙනෙකුත් නැහැ. බොන කෙනෙකුත් නෑ. මම කියල කෙනෙකුත් නැති බව. මේ ඔක්කොම ශබ්ද වර්ණ බොරු ගොඩක් කියල දැන ගන්නවා. ඔන්න ඕක තුළ ඉස්සෙල්ලාම ඔබේ සිතුවිල්ලෙන් ඔබ සත්‍යය අවබෝධ කරනවා. ඒකයි මෙතන 'නියත සම්බෝධි පරායනයි' කිවුවෙ. බුදුන් වහන්සේ ඕක උපමා කරන්නේ හිමාලය පර්වතයට.

මේ හිමාලය පර්වතය ද විශාල මේ අතේ තියෙන ගල් කැටයද? ස්වාමිනී, හිමාලය පර්වතය කොයිතරම් විශාලද? අතේ තියෙන ගල්කැටය නොසැලකිය හැකි තරම් කුඩාය ස්වාමිනි. අන්න ඒ වගේ ආනන්දය හිමාලය පර්වතය වගේ කෙලෙස් සංසිදෙනවා ආනන්දය. ඒ පූර්ව භාග ප්‍රතිපදාව සත්‍ය ඥානය. ඒ බුද්ධ දර්ශනය යමෙක් අවබෝධ කරයිද හිමාලය පර්වතය වගේ කෙලෙස් සංසිදෙනවා. 'දිට්ඨංච අනුපගම්මසීලවා දස්සනේන සම්පන්නො' කියන තැනයි ඕක තියෙන්නෙ. එතනයි නියත සම්බෝධි පරායනය. ඊට පස්සෙ එයාට ආත්මයක් නැතිබව දැනෙනවා. මෙහෙම දැනෙන කොට කම්පනය නැතිවෙනව. මෙතන දෙයක් වගේ දැනෙන කම්පනයේ ආත්ම කම්පනයක් තියෙනවා, ඔබ දන්නෙ නැතිවුනාට සිතුවිල්ල තුළයි තියෙන්නේ. ඒක ඔබට සිතුවිල්ලක් තියෙනවා ඔබ ඉන්නවා කියල. අන්න ඒක කුඩුවෙන්න ගන්නවා. එයාගෙ සක්කාය දිට්ඨිය ප්‍රහීනයයි. හැබැයි ඒකෙ විචිකිච්ඡා සැක තියෙන්න බැහැ ඒකයි 'සක්කාය දිට්ඨි' විචිකිච්චා, සිලබ්බත පරාමාස කියන්නෙ. මේක අපි හොඳට දීර්ඝව පැහැදිලි කරනවා. බුද්ධාදි අට තැන්හි ඇති සැකය මොකක්ද කියල.

බුද්ධ ස්වභාවය කියන්නෙ මෙතන දෙයක් නැති බව දැනගැනීමයි. 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' අනිමිත්තයි ශූන්‍යනයි අප්‍රනිහිතයි කියන මේ ස්වභාවය, සත්‍ය දැනගන්නව. කොහෙද මේව තියෙන්නෙ. බිත්තිය තියෙනවද ආත්මයක් තියෙනවද 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' 'න පඨවි, න අපෝ, න තේජෝ, න වායෝ, න ආකිඤ්ඤායතනය, න විඤ්ඤායතනය, නේවසංඥා නා සංඥා, නායං ලෝකෝ' මෙලොවක්

නෑ, න පරලෝකෝ පරලොවක් නෑ, 'න උභෝ චන්දිම සූරියෝ' සඳහිරු කියල දෙයක් නෑ, 'න අගතිං න චුතිං න උපවත්තිය න අපවත්තිය න අපටිත්තං න අපවත්තං න අණාරම්මනං ඒ සොවත්තෝ දුක්ඛස්සාථි' මෙයයි මහණෙනි දුකින් මිදීම. මේ ශබ්ද වර්ණවල බිත්තියක් තියෙනවද නැහැ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ තියෙනවාද නැහැ. දැන් මෙතන ඔය කියන එක ධ්‍යානයක්වත් නැහැ. ඕකෙ ඉර තියෙනවද සඳ තියෙනවද, මොකක් වත් හම්බවෙන්නෙ නැහැ. ඔක්කොම ශබ්ද වර්ණ දැන් ඉපදීමක් තියෙනවද. ඉපදෙන්නෙ කොහෙද ඉපදෙන්ට දෙයක් කියල එකක් ගත්තොත් ඒකමයි උපත. ඒකත් නැහැ. එහෙනම් මරණයක් තියෙනවද, ඒකත් නැහැ. ඇයි ඉපදෙන්නෙ නැත්නම් මරණයක් තියෙනවද ඒකත් නැහැ.

**ඔබ ඉපදෙන්නෙ අරමුණේ දෙයක් කියල ගත්ත තැන. අරමුණේ දෙයක් නැත්නම් ඔබ ඉපදෙන්නෙ නැහැ. මෙතන දෙයක් කියන්නෙ ආරෝපණයට. දැනෙන එකට.** බිත්තිය කියන ශබ්ද වර්ණ ඇති වෙන්නෙ නෑ ඔබට. ඒ දැනුම හැමදාම තියෙනව. බිත්තියක් තියෙනවා. හැබැයි බිත්තියේ දෙයක් වගේ තියෙන වටිනාකම 'කාම භූමිය' නැතිවෙනව. එතකොට ඒකෙ තියෙන 'රූපය, රූප භූමිය' එහෙම රූපයක් තියෙනවද නැහැ ඒකත් නැති වෙනව. ඊට පස්සෙ අරූපය ආත්මය ආත්මය බිත්තිය ඒකත් නැතිවෙනවා. තුන් භූමියම ජයගෙන 'ත්‍රෛයිලෝකනාථ' සම්මා සම්බුද්ධ වුනා වගේම, ඔබත් ශ්‍රාවක බුද්ධ බවට පත්වෙනවා. මේ අරමුණේම ඔබ නිවන් දකිනවා. ඔබ බිත්තිය වගේම හැම අරමුණම දකිනවා. ඒ දකිනවා කියන්නේ 'සංඝං සරණං ගච්ඡාමි' 'ධම්මෝ මේ සරණං වරං' මේ ධර්මය දකිනකෙනාට දෙයක් නෑ. සැප විඳින්නවත් දුක් විඳින්නවත්.

දෘෂ්ඨිය තියෙන්නේ දෙයක් තියෙන නිසයි. දෙයක් ඔබට හම්බවෙන්නෑ කියන්නේ ඔබ දුකින් මිදෙනවා. ඔබ අසරණයි දෙයක් තියෙනව නම්, දෙයක් තියෙන තාක්කල් ඔබ දුක් විඳිනව. එහෙනම් 'නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං' මේ ධර්මය හැර වෙන සරණක් නෑ. 'ධම්මං විනානත්ථි පිතාවමාතා' කිව්වේ ඒකයි. **ධර්මය දැක්කොත් ඔබ අවදි වෙනවා. 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' 'අනිමිත්තයි ශූන්‍යනයි**

**අප්‍රනීහිතයි' නිමිති නෑ දෙයක් කියල පෙන්නන් නෑ. අනිමිත්තයි ශූන්‍යතයි එතන ශූන්‍යතාවය. මේ ඔක්කොම පේනව ඇහෙනව දැනෙනවා වුනාට වටිනාකමක් අගයක්නෑ අප්‍රනීහිතයි. ඒ ස්වභාවයයි 'බුද්ධ ස්වභාවය' 'නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං' අන්න තේරුවන් සරණ යන්නේ සෘතවත් ආර්යය ශ්‍රාවකයා පමණයි.** ඒ සෝතාපන්න ආර්යය වහන්සේ නමක් පමණයි තෙරුවන් සරණ යන්නේ. මිථ්‍යා දෘෂ්ටික භූමියේ අනුසෝතය තුළ ඔබට තෙරුවන් සරණ නෑ. **තෙරුවන් සරණ තියෙන්නේ හිත දැකල මිදෙන තැන ස්කන්ධයේ උදයවැය දකින තැන ස්කන්ධයමයි අරමුණ කියන්නේ ආර්යකාන්ත ශීලය ආර්යය භූමිය සත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ වැටෙන තැන. ඒක තමයි 'අරියානං දස්සාවි - අරිය ධම්මේසු කෝවිදෝ - අරිය ධම්මෝ විනයෝ' කීවේ ඒකයි ඒක දකින්න දක්ෂ වෙන්න. ඒ ආර්යය විනය තුළ ඔබ දෙයක් නැති බව දකිනවා. ඒ ආර්යය විනය භික්ෂුවයි. ඒ සැබෑම උපසම්පදා භික්ෂුවයි.** ඒ උපසම්පදාව ආධ්‍යාත්මික උපසම්පදාවයි.

ඒකේ දෙයක් ඔබට කිසිම තැනක හමුවෙන්නෙ නැත්නම්, ඔබ ඒ මාර්ගය තුළ කටයුතු කරයි නම් අන්න 'දිට්ඨංච අනුපගම්ම සීලවා' අන්න එතනින්ම තමයි ඔබ සම්මා දිට්ඨියට එන්නෙ මාර්ගයට පිළිපන්නයි. හැබැයි ඒක අභ්‍යන්තරයටම දැනෙන්න ඕන. ආත්මය දියවී ගෙන යන බව. ආත්ම සංඥාව දියවීගන යන බව 'ආසවක්‍ෂය ඥානය' තියෙන්නෙ එතනයි. ඒ කියන්නෙ කම්පනය වන දේවල් කියල මේකෙ තියෙනවා විශාල පැහැදිලි කිරීමක් කරන්න අර අතේ තියෙන ගල් කැටය වගේ, ඒ කියන්නෙ මේ සත්‍ය ඥානය තියෙන කෙනා. කෘත ඥානය කරන එකක් නොවෙයි. මේ සත්‍යය ඔබ දකී නම් ඔබ මේ සත්‍ය ඇසුවාට පසුව ඔබ අසා දැන ගත්තාට පස්සෙ හැම තැනම ඔබට තියෙන එකක් දැනෙන්න ගන්නවා මොකක්ද? දෙයක් නැති බව, ඒකටයි කෘත්‍ය ඥානය කිව්වේ. **කෘත්‍ය ඥානය කිව්වෙ ඔබ කරන එකක් නෙවෙයි ඔබට වෙන එකක්. ඒකයි සත්‍ය ඥානය ඇති අයටයි කෘත්‍ය ඤාණය කිව්වෙ. ඒකයි සත්‍ය කෘත්‍ය කෘත කිව්වෙ.** ඔබට ඊට පස්සෙ ශාන්ත සුවක් අත්දකින්නට ලැබෙයි හැමතැනම. ඔබේ ගින්න නිවිල ශාන්ත සුවයක් ඔබ අත්දකිනවා එයයි නිර්වාණ සම්පත්තිය කිව්වෙ. එයයි නිවන් සුවය කිව්වෙ.

හිතල නිවන් දකින්න බැහැ. ඔබට වෙන දේ දකින්න. ඔබ අත් දකිනවා මේක සාන්දිට්ඨික ධර්මයක්. මේ ප්‍රත්‍යක්‍ෂ ධර්මයක් ඔබ නිවන් දකිනවා. ඔබට ඒ සත්‍ය හමුවෙනවා. අපේ අභ්‍යන්තර පරිවර්තනය අපි ලෝකයට හෙළි කරන්නෙ. අපි අත්දකින ප්‍රත්‍යක්‍ෂයක් හිතලුවක් නොවේ. පොත් බලල කියන එකකුත් නොවෙයි. ඔබ අත් දකින හැම අත්දැකීමක්ම අපි අපේ මේ ස්වරාලය පාවිච්චි කරල ශබ්ද වර්ණවලින් ඒක නිරූපනය කරන්න උත්සාහ කරල තියෙනවා. ඒකයි දේශනා දෙදහස් ගණනක් ඔබට අසන්නට ලැබෙන්නෙ. ඒත් ඔබ ප්‍රායෝගිකව ලබන අත්දැකීමමය. ඊට පස්සේ වැදගත්වෙන්නෙ දිගටම. ඒ වෙනුවෙන් තමයි ඇත්තටම අපි Zoom දේශනා හැමෝටම වැදගත් කියල කියන්නෙ. අපිට ඕනෙ ඔබේ අත්දැකීම් පමණයි. ඒකට හේතුව ඔබට අවශ්‍යයයි ඒ උපකාරය ඔබ මාර්ගයේ සිටී නම් ඔබ මේ දේ අසයි නම් මේකට ඔබ මේ ඉගෙන ගන්නවා වේවා රැකියාවක් කරනවා වේවා මොකවත් එයට අදාළ නැහැ. භික්ෂු භික්ෂුනි උපාසක උපාසිකා සිව්වනක් පිරිසටම මේ සත්‍ය අවබෝධ කළ හැකියි.

හිතක් තියෙනව නම් ඒ හිතෙන් මිදීමකුත් තියෙනවා. හැබැයි ඔබ සත්‍ය අවබෝධ කිරීම පමණයි කළ යුත්තේ. මේ සත්‍ය අවබෝධය තුළ මේ දේශනා ප්‍රාතිහාර්යය තුළ ඔබ නිර්වාණ සම්පත්තිය අත් දකිනව. ඒකාන්තයෙන්ම ඔබ නිර්වාණයෙන් සැනසීම ලබනවා. ඒකට හේතුව අනාත්ම ධර්මය ඔබ අත්දකිනවා, ආත්මයක නැති බව අත්දකිනවා ලෝකයක් නැති  බව අත්දකිනවා. ඔබ සියලු ලෝකයෙන්ම මිදෙනවා. 'නියතසම්බෝධිපරායනයි" ඉතින් මේක සුවිශේෂියි. මේ පූර්ව භාග ප්‍රතිපදාව කෙටියෙන් කීමත් දීර්ඝව කීමත් යමෙකුට මේක වැටහේ නම් කොයිතරම් භාග්‍යයක් ද? එයාට අඬන්න හේතු නැහැ. ඇයි මරණය කියන්නෙ සිතුවිල්ලක්. ශබ්ද වර්ණ දෙකක් විතරයි ඔබ කතා කරන ඕනෑම දෙයක් අපට කියන්න.

මේකෙ තියෙනවා ඉතාම ගැඹුරු පැත්තක්. මේ ආයතන ටික ඔබ දකින්න ඕනෙ. **ඇස කණ දිව නාසය කය මන මේ ආයතන, ද්වාර හයෙන් තමයි අරමුණු එන්නෙ. ඒ හැම අරමුණක්ම ඔබ බලන්න ඕනෙ. මේක සෙන්සර් එකක් විතරයි. කොහෙද ආත්මයක් තියෙන්නෙ. ඇසට**

**වර්ණයක් පේන එක සෙන්සර් එකක් විතරයි. කොහෙද ආත්මයක් තියෙන්නෙ. ඔන්න ඔබ ඔබෙන් මිදල මෙතන ආයතන ටික දකිනව නම් සලායතන නිරෝධය. ඔබ ආයතනවලින් මිදිල නිවන් දකිනවා. මේකෙ වටිනාම තැන තමයි මනායතනයෙන් මිදෙන එක, මේ සිතුවිලිවලත් දෙයක් නැහැ කියන එක.** ඒක තමයි මේ අන්දෝලනාත්මක දේශනා මාලාවේ දැන් දේශනා තිස් දෙකක් දාලා තියෙනවා. මේකෙ සුවිශේෂි තැන් ගොඩක් තියෙනවා.

මේ මනෝ සෙන්සර් එක තමයි වැදගත්ම දෙය. ඔබ හිතන සිතුවිලිවල දෙයක් නෑ. ඔබ හිතනවා මේක ලස්සනයි, මේක කැතයි මේ එක එක ඒවා ඔබ හිතනවා. එහෙම දේවල් කොහෙද තියෙන්නෙ. එහෙම දෙයක් තියෙනවද ලස්සනයි කැතයි කියල දෙයක් තියෙනවද? සිතුවිල්ලෙවත් දෙයක් තියෙනවද මේව ඔක්කොම ශබ්ද වර්ණ කම්පන වේගයට සකස්වන ඒවා. දිගටම ඊට පස්සෙ ෂොට් එකක් වගේ ඊට පස්සේ තියෙන්නෙ මේස පුටු ඇඳන් විතරයි. ස්පාර්ක් එකක් විතරයි. ඒක මනෝ ස්පාර්ක් එකක්. ඒක ඔබ හොඳින් මෙනෙහි කරල බලන්න. මේ දේශනා හොඳින් අධ්‍යනය කරන්න. මේ නිවන් මග හොයන හැමෝටම මාණික්‍ය රත්නයක්. එතනින් නිවන විවර වෙනවා. 2023 වසර මේ ගෞතම බුද්ධ ශාසනය නැවත පිබිදීමයි කිව්වේ අන්න ඒ නිසයි. ඔබ නිවන් දකිනවා. අපිට හිතෙනවා පූර්ව භාග ප්‍රතිපදාවට මේක ප්‍රමාණවත්.

අපිට මීට පස්සෙ එදිනෙදා අත්දකින ආකාරය තමයි කතා කරන්න තියෙන්නෙ ශබ්ද වර්ණ ගැන. ඒකෙදි අත්දැකීම්වලින් කතා කරනවා නම් තමයි හොඳ හැබැයි එක් එක් කෙනාගෙ ස්වභාවය අනුවත් ඔබට හමුවෙනවා මේ දේශනාවල ලේයර්ස් දේශනා වගයක්. ඔබ බාහිරය ඇත්ත කරගෙන නම් අන්න එතන බැසගෙන තියෙනවා නම් එතන ආත්ම සංඥාවක් තියෙනවා. ඔය ආත්ම සංඥාව තියෙන හැම තැනකම දුක තියෙනවා. ඔබ දුකෙන් මිදෙන්නෙ නැහැ. බාහිර දෙයක් තියෙනව කියල හිතුවොත් එතනමයි ඔබගෙ ආත්මය තියෙන්නෙ. සිතුවිල්ලෙත් දෙයක් තියෙනවා නම් එතෙනමයි ආත්මය තියෙන්නෙ. ඔබට එන අරමුණ කුමක් හෝ වේවා එය දෙයක් කර ගත්තොත් දෙයක් කියල දැනෙන තැන එතනමයි ඒකමයි ආත්මය කියන්නෙ. ආත්මය තියෙනව කියන්නෙ

'**අජ්ජෝසාය තිට්ඨති**' කියන්නෙ එකම කතාව. ඒ බැසගත්තා කියන එක. එහෙම වුනොත් තමයි 'යාරූපේ නන්දිය' ඔක්කොම තියෙනවා පටිච්ච සමුප්පාද ධර්මය ඇත්ත වෙනවා. එතකොට තණ්හාව තියෙනවා ආශාව තියෙනවා **"තධූපාදානං භවෝ"** 'ජාති ජරා මරණ ශෝක පරිදේව.

**මොකද දෙයක් කිවුවොත් දුකක් තියෙනවා. ඔක්කොම තියෙනවා ඒ අනුසෝතය. එහෙනම් මේ සෝගාවචර භික්ෂුවක් කියන්නෙ එහෙම නැත්නම් ඔබ උපසම්පදා භික්ෂුවක් කියන්නෙ මෙතන දෙයක් නැති බව දකිනවා කියන එකමයි. ඒක තමයි භික්ෂුත්වය කියන්නෙ. ඒක තමයි අධ්‍යාත්මික උපසම්පදාව. ඒක ඔබ දෙයක් කියල ගත්තොත් ඒක 'සමුදය' දෙයක් කියල ඒකෙ ධර්මය දැක්කොත් අන්න 'අත්තගමය' කියන එක එහෙම වුනොත් ආදිනවය දැක්ක. එහෙම වුනොත් 'නිස්සරණයට' යනව.** එහෙම නොවුනොත් ඔබ ආයතන පිනවීමට යන්නෙ 'ආස්වාදය' ආදීනව' නිස්සරණය' 'සත්තට්ඨාන කුසල් සූත්‍රය, අරහත්ත සූත්‍රය තුළ පෙන්නනව භික්ෂු සූත්‍රය බලන්න. සූත්‍ර ඕන තරම් තියෙනවා. භික්ෂු සූත්‍ර අරහත්ත සූත්‍ර කොච්චර තියෙනවද? ඔක්කොම කියන්නෙ එකම කතාව.

**ස්කන්ධයේ උදය වැය දැකීමමයි මහණෙනි කළ යුත්තේ වෙන එකක් නැහැ එයයි උපාදානස්කන්ධයෙන් මිදෙන සීලය. එයයි ආර්යකාන්ත සීලය. එයයි 'නරෝ සපඤ්ඤෙ‍ෙඩා්', 'නරෝ' කියන්නෙ භික්ෂුව. භික්ෂුව 'නරෝ සම්පන්න' වෙන්න ඕනෙ. ඒ කියන්නෙ ධර්මය දකින සම්පන්නතාවය තියෙන්න ඕනෙ 'ජටා සූත්‍රයෙ' තියෙන්නෙ.** අන්තෝ ජටා බහි ජටා - ජඨාය ජඨිතා පජා - තං තං කුච්ඡම ගෝතෝම් - කො ඉමං විජටේ ජඨං. ස්වාමීනි මේ ජටා කවුද ලිහන්නෙ. එළියෙත් ගැටයක් ඇතුළෙන් ගැටයක්. ගැටෙන් ගැටේ ගැට ගැහිල. මේ ප්‍රජාව දුක් විඳිනවා. කවුද ස්වාමිනි මේ ගැටය ලිහන්නෙ. බුදුන් වහන්සේ දේශනා කළා. 'සීලේ පඨිත්ඨාය නරෝ සපඤ්ඤෙ‍ෙඩා්', චිත්තං පඤ්ඤදංඨ භාවයං' අතාපි නිපකො භික්ඛු කෝ ඉමං විජටේ ජඨං'

ජටා සූත්‍රය බලන්න. මජ්ඣිම නිකායෙ ඔබට හමුවෙනවා. හැමතැනම සූත්‍රවල ඔබට දකින්න ලැබෙනවා. ඉතිං 'සිලේ පඨිත්ඨාය නරෝ සපඤ්ඤෙ‍ෙඩා්' දකින තැන. මේ ස්කන්ධයේ උදයවැය දකින

සීලය දෙයක් නැති බව දකින තැන පංච සීලය නොවෙයි. දස සීලයයි රැකෙන්නෙ. හේතුඵල දහමේ ඉන්න අය දස සීලයේ ඉන්නෙ, ඒ කියන්නෙ ආර්යකාන්ත සීලයේ ඉන්න අය. ඒකට හේතුව මෙතන දෙයක් හමුවන්නෙ නැහැ, හොරකම් කරන්න දෙයක් නැහැ, මංකොල්ල කන්න දෙයක් නැහැ, මරන්න සතෙක් හම්බවෙන්න කොහෙද දෙයක් තියෙන්නෙ. ශබ්ද වර්ණවල දෙයක් තියෙනවද. ඊට පස්සේ 'පානාතිපාතා, අදින්නාදානා, කාමේසුමිච්ඡාචාරා, මුසාවාදා, සුරාමේරය' සියල්ල රැකෙනවා. ඒත් හේතුඵල දහම දන්නෙ නැති එකයි තියෙන්නෙ. හේතුඵල දහම කවුරුත් කියන්න දන්නෙ නැහැ. ටිකෙන් ටික මේ සමාජය පරිවර්තනය වෙනවා. ඒක හොඳයි.

ඔබ සූත්‍ර පිඨකවලින් එහාට කියල යන්න එපා. ඔය සූත්‍ර පිඨකවල තියෙන පොඩ්ඩ හරි කමක් නෑ. ඒ ටිකේ ධර්මය තියෙන්නෙ. ඔය මහා නිදාන සූත්‍රයේ සලායතන සූත්‍ර සංචේතනා සූත්‍ර ඔය සූත්‍රවල තියෙනවනෙ නිවන. ඒක ඔබට ප්‍රායෝගික නොවන නිසා, ඔබ දන්නෙ නැති නිසා මේක ලේසි නෑ අපි ඒක දන්නවා. හැබැයි ඔබට මේ බුද්ධෝත්පාද දේශනා සියල්ල ගලපලා දෙනවා. ප්‍රායෝගික අත්දැකීම් සහිතවම දෙනවා. එය අපගේ අභ්‍යන්තර පරිවර්තනය ඔබටත් දැනෙන දවසක් එනවා. ඒ පරිවර්තනය ටිකෙන් ටික සිද්ධ වෙනවා. ඒක වටිනවා ඔබට. ඔබට මේ මොහොතේ මේ ක්ෂණයේම දැනෙයි. ඒකයි 'ක්‍ෂණ සම්පත්තිය' ඉතින් මේකෙ ප්‍රායෝගික පැත්ත තමයි ගොඩක් වටින්නෙ. ඔතනින් එහාට හැබැයි පූර්ව භාග ප්‍රතිපදාව ඔතනින් එහෙමයි කියල ඉවර කරන්න පුළුවන් එකක් නෙවෙයි. මොකද මේක අවබෝධ වන තරමටයි ඔබ නිවන් දකින්නෙ. ඒ තරමටම ඔබ සෝතාපන්න වෙනව කිසිදාක දුගතියකට වැටෙන්නෙ නැහැ. 'නියතසම්බෝධි පරායනය' වෙනව.

ඔබ මේ දේශනා හොඳින් අධ්‍යයනය කරන්න. ඔබ දිගටම අහගෙන යන්න. පුළු පුළුවන් විදිහට ඔබට හොඳයි කියල හිතෙන දේ දැනෙන දේ හොඳින් අහන්න. මොකද ගොඩක් වෙලාවට විශේෂයෙන්ම අපේ භික්ෂූන් වහන්සේලා කැමති සූත්‍රවලින් අහන්න ඒ පැහැදිලි කිරීම අති විශිෂ්ඨයි. සමහර අය කැමතියි සරලව අහන්න. සාකච්ඡාවලට කලින් තියෙනවා ධර්ම දේශනාවක්. ඒවා හොඳින් පැහැදිලි කරනවා. ඒවා හැම එකම

වැදගත්. වටිනව. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ විද්‍යුත් නාලිකාව බලන්න. 'යූ ටියුබ්' නාලිකාවේ සරලව හැමදේම මේ මොහොතේ සකස් කරගෙන යනවා. බුද්ධෝත්පාද ප්‍රධාන නාලිකාව 'බුද්ධෝත්පාද' කියන ප්‍රධාන නාලිකාවේ මේ ගැඹුරු තැන් හොඳින් අධ්‍යයනය කරල ලෝකයට හෙළි වෙනවා. නිවන් මග හොඳින් විවර වෙනවා. www.බුද්ධෝත්පාද.com කියන 'වෙබ් සයිට්' එක වගේම ඔබට ඉදිරියේ දී ධම්ම වෙබ් සයිට් දකින්නට ලැබෙයි. සකස් කරගෙන යනවා සියල්ලම ඔබට ඒ මහඟු අවස්ථාවක් තියෙනවා.

ඔබ ඉතාම භාග්‍යවන්තයි. ඔබට ඒ ධර්මය හොඳින් ඇහෙන්න ගනීවි. මෙතන කෙනෙක් පුද්ගලයෙක් නෑ. ඇත්තටම මෙතන තියෙන්නෙ සොබා දහමක් පමණයි. ඒ සොබා දහම තුළ දෙයක් නැති බවයි අවබෝධ කළ යුත්තේ. අර 'මූලපරියාය සූත්‍රයේ' ඔබට හමුවෙනවා අශ්‍රැතවත් පෘථග්ජනයා නිවන කියල දෙයක් තියෙනවා කියල හොය හොයා යනවා. හැබැයි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා මේ මොහොතේ නිවන අත්දකිනවා.

මේ අරමුණේ බිත්තිය කියල දෙයක් නැති වෙන කොට ඒ බිත්තිය සාමාන්‍ය විදිහට පේනවා. ඒකට සිහියක් තියෙනවා. මේකෙ වටිනාකම දෙයක් වගේ දැනෙන ගතිය ඒක සිහියටයි අසුවන්නෙ. වටිනාකමක් දැනෙනවනෙ. දැන් රත්තරන් වටිනව නේද? යකඩ කිච්චහම වටින්නෙ නැහැ. එතකොට ඒක කොහෙන්ද ආවේ අන්න ඒක සිහියට අහුවෙනව. අන්න ඒක දියවීගෙන යනවා. අන්න ඒක ඔබට ආශ්‍රවක්‍ෂය ඥානය කියන්නේ දියවීගෙන යන ස්වභාවය ඔබට අසුවෙනවා. ඔබගේ ස්වභාවය මේ දහමත් එක්ක පරිවර්තනය වෙනවා. දැන් කේන්ති යන්නෙ නැහැ. ඉස්සර හැම තිස්සෙම කේන්ති ගිය කෙනෙක් දැන් අවුරුද්දටම එක පාරයි. සමහර විට කේන්ති යන්නෙත් නැහැ. සමහර විට කේන්ති ගියාට ඒක දැනෙන්නෙත් නැහැ අභ්‍යන්තරයට. කම්පනයකුත් නෑ. විවිධාකාර ස්වභාවයන් තියෙනවා. මේක පැහැදිලි කරන්න. 'ආසවක්‍ෂය ඥානය' මේ අවස්ථා කෙසේද ඔබට අත්දකින්න ලැබෙන්නෙ කියල.

මේකෙ වටිනා දේ තමයි ආන්දෝලනාත්මක දේශන මාලාවක් ඔබට අහන්නට ලැබෙනවා. ඒ කියන්නෙ සෙන්සර් විතරයි. **දිවට රස දැනෙනවා, කියන්නේ සෙන්සර් එකක් විතරයි. දැන් අපි හිතමු මිරිස් කෑව කියලා.**

**එතකොට දැවිල්ලක් දැනෙනවා. ඒක නවත්වන්න පුළුවන්ද? නැහැ. ඒක සෙන්සර් එකක්. ඇහැට වර්ණ පේන එක සෙන්සර් එකක්. එතකොට දිවට වර්ණ පේන්නෙ නැහැනෙ. ඒ අර සෙන්සර් එකටයි පේන්නෙ. ඒ සෙන්සර් එකමයි සකස් වෙන්නෙ. එතකොට සාමාන්‍යයෙන් පේන එක නවත්වන්න පුළුවන්ද? නෑ ඒක සාමාන්‍ය විදිහට පේනවා.** සෙන්සර් එක වැඩනෙ. ශබ්ද ඇහෙනවා. සාමාන්‍ය විදිහයි. ගෝෂාව කියල දන්නවා. සිහියට අසුවෙනවා. සෙන්සර් එකට අසු වෙනවා. ලස්සන කැත බලන කොට පේන දේවල්.

රමණීය වනපෙත හරි සුන්දරයි අර බුදුන් වහන්සේ කිව්ව වගේ. ඒක සෙන්සර්වලට අසුවෙනවා. එතන ආත්මයක් නැහැ. දිවට මිරිස් කනකොට දැවිල්ල එනකොට ඌයි ඌයි කියල කෑ ගැහුවට එතන ආත්මයක් නැහැ. ඇයි ඒ එතන ඒක සෙන්සර් එකක් විතරයි. ඒක දකින කෙනාට 'ජානතෝ අහං භික්ඛවේ පස්සතො' 'ආසවානම් ඛයම් වදාමි' කිව්වෙ මේක දැනගන්නත් ඕනෙ මෙතන සෙන්සර් එකක් විතරයි කියල හැබැයි ඊට පස්සෙ එයාට දැනෙන්නත් ඕනි මෙතන ආත්මය නැත්ද කියල. එතකොට එයාට දැනෙන්නෙ මෙතන දිවට දැවිල්ල දැනෙනවා, ඒක සාමාන්‍යයෙන් සෙන්සර් එකක් විතරයි. ස්පාර්ක් වෙනවා. හැබැයි එතන ආත්මයක් තියෙනවාද ඒක සෙන්සර් එකක් විතරයි. නාසයට ගන්ධය දැනෙනවා. පිච්ච මල සුවඳ කියල දන්නවා. හැබැයි එතන ආත්මයක් තියෙනවද නැහැ. ඒක සෙන්සර් එකක් විතරයි.

ඇහැට වර්ණ පේන එක දෑස් අන්ධ නම් පේන්නෙ නැහැ ඇයි? සෙන්සර් එක නැහැ. කන් බෙරය හිල්වෙලා නම්, එහෙනම් ශබ්ද ඇහෙන්නෙ නෑ. ඇයි සෙන්සර් එක නැහැනෙ. එහෙනම් ඔබට පිළිකාවක් හැදෙනව නම් රස දැනෙන්නෙ නැහැ ඇයි සෙන්සර් එකනෙ. අර ඔබට ඉන්ජෙක්ෂන් ගහන්නෙ හිරිවැටෙන්න. හිරිවැටුනොත් හංකඩේට සෙන්සර් එකටනේ. ඉදිකට්ටෙන් ඇන්නත් දන්නෙ නැහැ. ඇයි සෙන්සර් එක වැඩ කරන්නෙ නැහැ. ඒ සෙන්සර් එකනෙ. ආත්මය කොහෙද තියෙන්නෙ. ඔය ටික සේරම ශුද්ධ කළාම ආත්මයක් කොහෙවත් නැහැ. සෙන්සර් ටික ශුද්ධ කළොත්, මේ ඔක්කොම සෙන්සර් කියල දැක්කොත් මේ සිතුවිලි එන එක ඔබද?

ඔබ සමථය වඩනවා. ඔබ දැන් ඇස් දෙක පියාගෙන හුස්ම දිහා බලනවා. ඊට පස්සෙ සති නිමිත්ත අල්ලන්නෙ. එතකොට තොල අග්‍රය දිහා හුස්ම දිහා බලාගෙන ඉන්නවා. දැන් ඊට පස්සෙ හිත විසිරෙනවා. පරණ ඒව මතක් වෙනවා. අනාගතය හිතෙනවා සමථය වඩන අය මේක දන්නවා. එතකොට මේ සිත අතීතය මතක් වෙන්න මට ඕනෙ නෑනෙ. මට ඕන නෑනෙ අනාගතය හිත හිතා ඉන්න. ඇයි එහෙනම් මේව එන්නෙ. මේක සෙන්සර් එකක්නෙ. මම නෙවෙයිනෙ. එහෙනම් මට ඕන විදිහට නවතින්න එපායැ සිතුවිලි එහෙම වෙන්නෙ නැහැනෙ. ඇයි ඒ ? ඒක සෙන්සර් එකක් නෙ. ඒකත් සෙන්සර් වෙනවනෙ අර විදිහටම **මනෝ සෙන්සර් එක වැඩ. මේ සෙන්සර් ටික හරියට දැක්කොත් ඔබ කොහෙද ඉන්නෙ. ඔබ කොහෙවත් නැහැ. සිතුවිලි ඔබද? නැහැ. ඔය දිවට දැනෙන රස ඔබද. නැහැ. කොහෙද ඔබ ඉන්නෙ. ඔබ ඔබව ඉස්සෙල්ලා හොයල බලන්න කොහෙද ඉන්නෙ කියල. හැංගිල හරි ඉන්නව නම් ඇදල ගන්න එළියට. එතකොට ඔබට තේරෙයි ඔබ කොහෙවත් නැතිබව. එතකොට ඔබ කොහෙවත් නැත්නම් ආ... නැති කෙනෙක් ගැට ගහගෙන ඉන්නවා. ඒ ආත්මදෘෂ්ටිය කිව්වෙ ඒකයි. 'සක්කාය දෘෂ්ටිය' අන්න ඔබට හමුවෙනවා.** ඔබට හමුවෙනවා තියෙනවා කියල ගත්ත දෘෂ්ටිය අන්න ඔබ එළවල දමනවා බොරුකාරයෝ නෑ. ඒ කියන්නෙ විඥ්ඥාණ මායාවට ඔබ රැවටෙන්නෙ නැහැ. ඊට පස්සෙ මොකක්ද වෙන්නෙ. අන්න ඔබට දැනෙන්න ගන්නවා අභ්‍යන්තර සිහිය. අන්න ඔබට එනව දර්ශන ඥානයෙන් මතුවන සිහිය. ඒකට අපි කියනවා 'ඥානය' කියල. ඒකට සිහිය කියන්න බැහැ. සාමාන්‍යයෙන් දර්ශනය නැති කෙනෙකුට එන සිහිය වෙනයි.

දැන් දර්ශන ඥානය උපදින කොට එනකොට ඥාන සම්ප්‍රයුක්ත කුසලයක් තියෙන්නෙ. ඒ කුසල කියන එක සිහිය, කවදාවත් විඥ්ඥාන මායාවේ කුසල් තියෙන්නෑ. විඥ්ඥාන මායාව කියන්නෙ මායාවක්. ඒකෙ කොහෙද කුසල් තියෙන්නෙ. ඒකෙ කුසල් නැහැ. එහෙනම් මායාව නෙවෙයි මේ කුසලය කියන්නෙ සිහියට අසුවන්නෙ, ඒකයි **'සබ්බ පාපස්ස අකරණං'** කිව්වෙ සියලු සිතුවිලි අකුසල් **'සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා'** කියන්නෙ සිහියට අසු වෙන්නෙ. ඇයි මේ අරමුණ සියලු අරමුණු විඥ්ඥාණ මායාව. එහෙනම් සබ්බ පාපස්ස අකරණං

එහෙනම් කුසලස්ස උපසම්පදා - එහෙනම් මේ සිතුවිල්ල මායාවක් බවට දකින එකයි කුසලය කියන්නෙ. කුසලස්ස උපසම්පදා කියන්නේ එතනයි. ඒකයි ඥාන සම්ප්‍රයුක්ත කුසලය. අන්න මේ අරමුණට රැවටෙන්නෙ නැතුව මේක දැක්කොත් මෙතන දෙයක් නැති බව දැක්කොත් බාහිර ඒවත් එහෙම දෙයක් නෑ කියල දැක්කොත් අජ්ජත්ත බහිද්ධ අන්ත දෙකෙන් මිදුනා කියන්නෙ නාමරූපවලින් මිදිල 'පච්චේ පරිග්ගහඥානය' නාමරූප පරිච්ඡේද ඥානය' නාම රූප මිදිල එතකොට.

හිත කොහෙද තියෙන්නෙ ආත්මය කොහෙද තියෙන්නෙ දැන් බිත්තිය දැක්කොත් බිත්තිය දෙයක් කියල දැනෙන එකමයි ආත්මය. දැනෙන්නෙ නැති වුනොත් එතන ආත්මයක් නැහැ. ඒක සිහියටයි අසුවෙන්නෙ. මේක 'ඥායස්ස අධිගවාය' කිව්වෙ ඒකයි. 'සම්මා ඥාන' අපි පෙන්නුවෙ. ඒකයි අපි පෙන්නුවෙ මෙකෙ සිහිය වෙනයි සතිය වෙනයි ඥානය වෙනයි 'සම්මා ඥාන' වෙනයි කියල. 'ඥායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්චකිරියාය' 'දසාංග සමන්නාගත අරිඅටමග්ග' කියන කොට සම්ම දිට්ඨි සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව සම්මා වායාම සම්මා සතිය එහෙනම් මොකද්ද මේ 'සම්මා සතිය' දෙයක් නැති බවට දැනෙන සිහිය. එහෙනම් සති නිමිත්ත වචන එක නෙවෙයි 'සම්මා සතිය' කියන්නෙ. 'සති නිමිත්තටත්' තියෙන්නෙ සිහියක්. මේ සතිය පිහිටන්නෙ නැතිබව සිහියටයි අසුවන්නේ.

මේ සිහිය කියන්නෙ සිතුවිලි නෙවෙයි. මේ සිහිය තමයි 'ඥානය බවට පත්වන්නෙ. ඒ දර්ශන ඥානයෙන් එන්න ඕන එකක්. එහෙම වුනොත් තමයි අන්න දෙයක් නැති බව දැනෙන සිහියයි 'ඥානය' කියන්නෙ. එහෙනම් 'ඥායස්ස අධිගමාය' එහෙනම් 'අධිගත' කියන්නේ ඥානය කියන්නෙත් 'අධිගමායා' කියන්නෙත් සතර ඉරියව්වෙම කිසිම අරමුණක බැස ගන්නෙ නැති ස්වභාවය ගින්නක් නැහැ. එතන ආත්මයක් නැහැ. ඒ 'අධිගත සමාධියයි' 'අලමරිය ඥාන දර්ශන සමාධියයි' ඒ විදර්ශනා සමාධි අවබෝධයෙන් මිදුණු ඒ මිදීම තුළ උපදින සමාධිය. ඒ ආකාර හතරකට සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් කියල පෙන්නුවේ පෙන්නන ආකාරයත් අපි ඔබට දේශනා කරල තියෙනවා දීර්ඝව. හැබැයි මේ විදර්ශනා සමාධි එකක්වත් ඔබට සමථයෙන් හම්බවෙන්නෙ නෑ.

ඒක පිටකයෙහි බැලුවොත් ඔබට පෙනෙයි. සමථ විපස්සනා යුගන්ධන ගමනක් තමයි තියෙන්නෙ. 'සමථයානිකයා සමථ පුබ්බං ගමා ධම්මා' විපස්සනා පුබ්බංගමා ධම්මා ඒ කියන්නෙ මේකෙ අර සිත විසිරෙන බව පේන්නෙ නෑ.

ඒකෙ හිත විසිරෙන එක තැන්පත් කරන එක සමථය වඩනව වැඩියෙන් 'සමථයානික' කියල එතකොට 'විදර්ශනායානිකය' කියනවා. විදර්ශනාව ක්ෂණිකව සිද්ධවෙනවා 'සමථ පුබ්බංගමා ධම්මා' එතනම 'විදර්ශනා පුබ්බංගමා ධම්මා', එතකොට ඒ කොහෙන් ආවත් නිවන් දකින්නෙ 'විපස්සනා ඛනික සමාධියෙන්. විපස්සනා 'ඛණික' සමාධිය සමථ යානිකයා පවා නිවන් දකින්නෙ විපස්සනා ඛණික සමාධියෙන්. විපස්සනා ඛණික සමාධියක් කිසි දවසක සමථය තුළ හමුවෙන්නෙ නැහැ. හිතට එන අරමුණේ සත්‍ය දැකල මිදෙන තැනයි ඒ ස්කන්ධයේ උදය වැය දකින සීලය. ඒ උපාදානස්කන්ධයෙන් මිදෙන සීලයයි. එයයි විදර්ශනා සමාධිය.

යංහී යංහී තත්‍ර තත්‍ර විපස්සති එතන එතනම දකින එකයි. එතන එතන මිදීමක් ඔබේ සිහියට අහුවෙනවා. ඒ මිදීම සිහියට අහුවෙන එකයි. අන්න අන්තුඩු පිරිවැඩියන් කිවුව තථාගතයන් වහන්සෙ 'නිරෝධ සමාපත්තිය' පරම සුඛයයි නොකියයි. මොකද ඒකෙ ආත්මයක් තියෙනවා. ඒකෙ තියෙනවා ජීවිත ඉන්ද්‍රිය රූපය. ඒක නොදැනෙන ස්වභාවය තුළ පවතින ආත්ම ස්වභාවය. ඒක අති ගැඹුරුයි. ගාම්භීර ධර්මයක්. ඒ අසංඥතලයේ ආපු සංඥාව කොහොමද තියෙන්නෙ කියල. එකම ස්වභාවය නොදැනෙන ස්වභාවයකට පත්වෙනවා. ඒකට හේතුව ආත්මය හැදෙන හැටි දන්නෙ නැතිකම, විදර්ශනාව නැතිකම, සත්‍ය ඥානය නැතිකම දර්ශනය නැතිව කිසි කෙනෙක් නිවන් දකින්නෑ. මේක ශූන්‍යත සූත්‍රවල හමුවෙනවා. තථාගතයන් වහන්සේ 'නිරෝධ සමාපත්තිය' පරම සුඛයයි නොකියම්යි. තථාගතයන් වහන්සේ 'යන්හි යන්හි තත්‍ර තත්‍ර' එතන එතන සුවයක් දේශනා කරනවා. ඒ 'විමුක්ති සාර' නමින් එයයි කතාව.

එහෙනම් ඒ අනුත්තර ස්වභාවය, විමුක්ති සාරා කියන්නෙ. 'නිරෝධ සමාපත්තිය' නොවේ. ඒ අරහත්ත සමාධියවත් නිරෝධ සමාපත්තියවත්

නොවේ. එතන එතන අරමුණ ආත්මයක් නැති ස්වභාවය. අන්න අභ්‍යන්තරයට දැනෙන ස්වභාවය. **ඔබට දැනෙනවා ඔබ ඉන්නවා කියල ආත්මයක් තියෙනවා කියල. ඔබේ ආත්ම ස්වභාවය ඔබට දියවී යන ස්වභාවය ඔබට දැනෙනවානෙ. ඔබට ආත්මයක් තියෙන තාක් කල් අලියෙක් ආවොත් ඔබ දුවනවාම තමයි. ඇයි ඔබ ඉන්නවනෙ ඇයි දැනෙනවනෙ. නෑයි කියල හිතුවට වැඩක් නෑ. සිතුවිලිවල නෑයි කියල හිතනවා. නෑයි කියල හිතුවට වැඩක් නෑ. ඇයි ඒ ආත්ම සංඥාව තියෙනවා ආත්ම සංඥාව කියන්නෙ ඔබට දැනෙනවනෙ ඉන්න බව. අන්න ඒක දියවෙන එකයි අරහත්වය. ඒක දියවෙන එකයි 'විමුක්ති සාරා' කිවුවෙ. අනුත්ත කියල කිවුවෙ** ඒ කියන්නෙ ඔබට අභ්‍යන්තරයෙන් දැනෙන ස්වභාවය. අභ්‍යන්තර පරිවර්තනයකට එතකම් මාර්ගයේ නැහැ කියල කිව්වෙ කවුරුත් ඒකයි.

දැනුම තිබ්බට වැඩක් නැහැ පෝට්ල භික්ෂුව වගේ 'ජානතෝ අහං භික්ඛවෙ පස්සතෝ ' 'ආසවානම් ඛෙය්‍යම් වදාමි' 'නෝ අජානතෝ නෝ අපස්සෝ' එහෙනම් මේ අභ්‍යන්තරයට දැනෙන ස්වභාවය බලන්න ඔබට සිහියට අසුවෙනවා. ඒ ඔබට ආත්මයක් වගේ දැනෙන එක දියවී දියවී යනවා. ඒ 'ආසවක්‍ෂය ඥානයයි' ඒක එක්ක ඔබට අර රාග ද්වේශ මෝහ කෙලෙස් ස්වභාවය දියවී යන ස්වභාවය ඒ ආසවක්‍ෂය ඥානය තුළ ඔබට තවත් අවදිමත් ස්වභාවයක් අසුවෙනව. ටික ටික දියවෙන ස්වභාවය තුළ ඇත්තටම කිවුවොත් ඒක තුළ මහත් සැහැල්ලුවක් ශාන්ත සුවයක් ටිකෙන් ටික 'විවරිතෝ විජඩීතෝ' කියන එකට විවර වීගෙන එනව. ඒ අවදිමත් ස්වභාවයයි. ඒක වචනයට ගන්න බැහැ. ලුණු රහ වගේ, ලුණු ගැන කියන්න බැහැ කවදාවත්. මේ අරහත්වය කියන මේ රහ නැතිවන අරහත් ස්වභාවය කියන්න බැහැ. ඔබ කොහොමද කතා කරන්නෙ ඔබට ඔබ නෑනේ. ඒ දැනෙන ස්වභාවය ආත්මය දියවී යන ස්වභාවය කොහොමද කියන්නෙ. අරහත්වය කවදාවත් කියන්න බැහැ.

**අරහත්වය කියන්නේ කොහේවත් තියෙන ඵලයක් නොවෙයි. ඵලයක් නැතිකම කෙනෙක් නැතිකම ආත්මය නැතිකම සත්ව පුද්ගල දෘෂ්ටිය බිඳ වැටුණු තැන ඔබ කොහොමද කියන්නෙ. ඔබට කියන්න පුළුවන්ද මේ ආත්ම සංඥාව දියවී දියවී යනවා කියල කියන්න පුළුවන්ද, දැන්**

**මම මළා කියල තමා අන්තිමට කියන්න වෙන්නෙ.** ඇයි දැන් මට එහෙම දැනෙන්නෙ නැහැනේ. සම්මුතියේ ඉන්න මනුස්සයාට දැන් කියන්න ඕනෙ දැන් මැරුණා කියන එක එතකොට මල්මාලාවක් එහෙම දායිද නැහැ. ඇයි ඒ 'න සංඝං ගච්ඡන්ති' සංඝනයක් නැහැ. ගලනයක් නැහැ. ගණන් ගන්න දෙයක් කෙනෙක් පුද්ගලයෙක් සත්වයෙක් වත්කමක් දෙයක් මුකුත් මේ ස්වභාවයේ මතුවෙන්නෙනෑ.

'ඡබ්බි සෝදන' සූත්‍රය බලන්න රහතන් වහන්සේ කෙසේ විය යුතුද අල්පේච්ඡතාවය මාහෙච්ඡතාවය රහතන් වහන්සේ තුළ නෑ. ඔබට යමක් කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය. ගමේ මිනිස්සු කතාවට කියනවනෙ නේද නැත්නම් මේ යුගයේ තියෙන තරමක් තියෙන්නෙ දෘෂ්ටි ගොඩක් බුදු සමයට හපන්. මේක කිසි දවසක කිසි කෙනෙකුට වෙනස් කරන්න බෑ. 'සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා' කියන එක මෙන්න මේක සිහියට අසු වෙනවා. ආත්ම සංඥාව දියවීගෙන යන ස්වභාවය කුසලස්ස උපසම්පදා මෙන්න මේකයි සිහියට අසුවෙන්නෙ. ආත්ම සංඥාව දියවීගෙන යන ස්වභාවය තුළ අලියා ආවත් ඔබට දුවාගන්න එහෙම දෙයක් හමුවන්නෙ නැහැ.

මහ ථෙරුවරු වගේ හිටියට අර භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් වනයට වඩින කොට බුදුන් වහන්සේ පොඩි සාමනේර නමක් අරිනවා නේද? හොරු රැළක් එනවා. භික්ෂූන් වහන්සේලා ඔක්කොම පස්සට දුවනවා. අර පොඩි සාමනේර නම ඉස්සරහට ගිහිල්ල 'බෙල්ල කපල දාන්න' කියනවා. ඉවරයි. මේ ගොල්ලො ගාව කෙලෙස් තියෙනවා. මේ ගොල්ලන් කැමති නැහැ මේකට. ඇයි ආත්ම සංඥාව දියවීගෙන යන ස්වභාවය තුළ මෙතන සත්වයෙක් පුද්ගලයෙක් කවදාවත් ඉදලත් නැහැ දැනුත් නැහැ. මෙතන මරණයකුත් නැහැ. ඉපදීමකුත් නැහැ කියල අවබෝධයකට පත් වෙලා මේ අවබෝධය තුළ අභ්‍යන්තර අර ආරෝපණ ස්වභාවය ආත්ම සංඥාව දිය වීගෙන යන ස්වභාවය තුළ මේ 'විමුක්ති සාරා' කියන ස්වභාවය තුළ විතරයි හිනාවෙලා බෙල්ල තියෙන්නෙ.

එතකන් ඔබ ඕක කරන් නැහැ. ඔබට ආත්ම සංඥාව තියෙන තාක් කල් ඔබ මැරෙන්න බයයි. සම්මුති මරණයට ඔබ බයයි. එක් ක්ෂණික සිතක උදය වය දකින්නට සම්මුති මරණය බොරුවක් වේ.

මේ ඔබ හරියට ' සක්කො උජුකො සුජුකෝ' කියන ස්වභාවය තුළ මේ ආත්මයෙන් ගිලිහිලා හරියට මේ ලී කෑල්ලක් වගේ එතකොට. කලුගලක් වගේ. මොනවද කරන්න තියෙන්නෙ. මේ සත්‍යය ලෝකයාට දෙන එකත් භාග්‍යයක්. මනුෂ්‍යයා නැත්නම් මේක දන්නෙ නෑ රැවටෙනවා. මේ සසර කියල මොකවත් නැහැ.

ඔබ එල හොයාගෙන යන්න එපා. ඔබේ එලය නැතිවුන දවසට ඔබට එල හම්බවෙයි. ඔබ එලයක් හොයාගෙන ගිහිං වැඳ වැඳ ඉදල වැඩකුත් නැහැ. මේ ධර්මය විතරක් ඔබ සරණ යන්න. මොකද ඔබගේ අභ්‍යන්තර ස්වභාවය, ඔබගේ රාග ද්වේශ මෝහ කෙලෙස් ස්වභාවය දියවීගෙන යනවිට පුදුම සැහැල්ලුවක් ඔබ අත් දකිනවා. ඒ මාර්ගයේ ඔබ යනවා. ඔබ නිවන් දකිනවා. වැඳ වැඳ යන කෙනෙක් නොවෙයි. ඔබව වන්දනාවට සුදුස්සෙක් වෙනවා. ඒකාන්තයෙන් නිවනින් සැනසීම ලබනවා. ඒ භාග්‍ය බුද්දෝත්පාද දේශනාවල ඔබ අත්දකිනවා. ඒ ඔබගේම අත්දැකීමක් බවට පත්වෙනවා. අපි අපේ යුතුකම ඉෂ්ට කරනවා. සොබාදහම ඔබට බණ කියනවා. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ කියල කෙනෙක් නැහැ ඒ බුද්ධ ස්වභාවයයි. ඒ ආර්ය භූමියයි ඒ සියල්ලම එකමයි.

ඔබත් මේ දහම අවබෝධ කරල ඒ අප ඔබට පවසන ආකාරයට ඔබටම අත්දකින්නට ලැබේ. පුදුම ශාන්ත සුවයක්. ඒකෙ ඔබට මරණයක්වත් නැහැ. මර බියක්වත් නැහැ. ඔබ ඒ අත්දැකීම අභ්‍යන්තරයෙන්ම ඔබගේ ම ආත්ම සංඥාව ගිලිහුණ ස්වභාවයක් තුළ දකිනවා. ඔබ ඕනෑම මොහොතක කෝච්චියකට හෝ වේවා ඔබ බෙල්ල තියන කෝච්චිය ළං වෙනකොට අපි නැගිටිනවා කියන ස්වභාවය තුළ ඔබ නැහැ. ඔබට ඉන්න කෙනෙකුත් නැහැ. මුකුත් නැහැ. එහෙනම් කෝච්චියකුත් නැහැ. තේරුමකුත් නැහැ. ඔබට එහෙනම් කම්පනයකුත් නැහැ. ඔබ යුතුකම කරයි එච්චරයි ඒ මහත් උතුමාණන් වහන්සේලා. පූර්ව භාග ප්‍රතිපදාවේ තියෙන වටිනාකම තමයි සම්පූර්ණයෙන් ම අද දියත් කළේ. ඒ වගේම ඔබගේ ප්‍රශ්නය ඉතාම වැදගත්. ඒ වගේම ඒකෙ කොහොමද නිවන් මග තුළ 'සත්‍ය ඥානය' තුළින් කෘත්‍ය ඥානය සිද්ධවන ආකාරය ඒ වගේම කෘතඃ ඥානය තුළින් ඒ අභ්‍යන්තරයෙන් පරිවර්තනය සිදුවන ආකාරය සම්පූර්ණයෙන් ම පැකේජ් එකක් වගේ නිවන අත්දකින ආකාරයට

දේශනා මාලාව ඉදිරිපත් කළා. හොඳයි එහෙම නම් හැමෝටම ඒ තුළ විශාල භාග්‍යක් තියෙනවා. බොහෝ හොඳට මේ යුගයේ නිවන් දකින්නට හැමෝටම මේ අභ්‍යන්තර පරිවර්තනය අත්දකින හැකියාව ලැබෙයි. ගොඩක් භාග්‍යවන්තයි හැමෝම ඔබතුමාට එහෙනම් අවසරයි. තෙරුවන් සරණයි හැමෝටම!

**උපාසක :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස

# 02

# ඇයි අපි ඉපදුණේ, ඇයි අපි මැරෙන්නෙ

**ආර්යයන් වහන්ස :** අපේ හුස්ම ටික කොයි මොහොතේ හරි යනවා. අපේ ශරීර කූඩුව හරියට කුලියට ගත්ත වාහනයක් වගේ. මේක අපිටවත් අයිතියක් නෑ. එහෙම නේද? තාවකාලික නවාතැන් පොලක්. බුදුන් වහන්සේ මේ විදිහට පැහැදිලි කරනවා බොහෝ තැන්වල ඔබ අසා ඇති. මේක කොයි මොහොතේ හරි ඔබට අත් අරින්න වෙනවා. ඔබ කැමති වේවා අකැමති වේවා ඒක අදාළ නැහැ. ඔබට පුළුවන්ද ආ... මට වැඩ තියෙනවා දැන් බෑ කියන්න. සමහර විට ඔබ යන වාහනය ඇක්සිඩන්ට් වෙන්න පුළුවනි නොසිතූ මොහොතක. සමහර විට ඔබට 'හාට් ඇටෑක්' එකක් හැදෙන්න පුළුවනි. කාටද කියන්න පුළුවන් ඊළඟ දවසෙ මොනවද වෙන්නෙ කියල. හරි අවිනිශ්චිතයි. හරියට අර බැලුම් බෝලයකට හුළං පුරවල වගේ අපේ මේ ශරීර කූඩුව.

මේ දහම තුළ ඔබ අහනවා විවිධාකාර දේවල්. ඇයි අපි ඉපදෙන්නෙ. ඇයි අපි ජීවත්වෙන්නෙ. ඇයි අපි මැරෙන්නෙ. මේක තමයි හැමෝගෙම තියෙන සරළම ප්‍රශ්නය. ආයිමත් ඇයි ඉපදෙන්නෙ. ඇයි මැරෙන්නෙ. මේ පොඩි කාලයකට ද මේ ඉන්නෙ. දැන් ඔබේ වයස කීයද අවුරුදු 10ක් 15ක් දැන් ඔබේ වයසින් හිතල බලන්න. පොඩි කාලයයි. ලොකු කාලයක් නැහැ. අවුරුදු 5ක් 10ක් වුනත් ඉක්මනට යනවා. අපි ඉගෙන ගන්නවා අවු. 10ක් 15ක් සමහර අය අවුරුදු 20ක් ඉස්කෝලේ යනවා. අපේ ජීවිතය ඉගෙනීමට යටවුණා. අපේ වයස බැලුවොත් අවුරුදු 50,60 පනින කොට අපට ලෙඩ වැඩියි. දියවැඩියාව, ප්‍රෙෂර් එක අවුරුදු 60 වෙනකම්වත් හොඳට ඉන්න බැහැ. දැන් ගොඩක් අයට අසනීප වෙනවා. පරමායුෂ අඩුවෙලා තියෙන්නෙ. අවුරුදු 50න් 20ක් අයින් කලොත්

අවුරුදු 30ක් වගේ. **පොඩි කාලයක් තමයි අපි හරියට ඉන්නෙ. ඒකෙ අපි මොනවද කරන්නෙ. මේ වගේ පොඩි කාලයක් මොකද්ද ඇති දේ. මනුෂ්‍ය ආත්මයක් ලබලත් අපිට මේ ඇත්ත හිතන්නවත් ඕනෙ නෑ. අන්ධයෙක් වගේ ජීවත් වෙලා අන්ධයෙක් වගේ මැරිලා යනවනම් ඔය කාල බීල දරුවො හදල වයසට ගිහින් මැරිල යනවා.** මොකද ජීවිතේ, මොකද්ද තේරුම, කිසිම තේරුමක් නැහැ.

ඔබ වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන් ලෝයර් කෙනෙක් වෙන්න පුළුවන්. ඉන්ජිනියර් කෙනෙක් ව්‍යාපාරිකයෙක් වෙන්න පුළුවන්. සාමාන්‍ය රැකියාවක් කරනවා වෙන්න පුළුවනි. ඔය මොනව කළත් ඔබේ ඉරණම එකමයි. උපතත් සමග ලැබෙන දායාදය මරණය. ඉපදුන දවසෙ ඉඳන් අපිට මරණයක් තියෙනවා. අපි මේ කතා කරන්නෙ සම්මුතියයි. අපි ඊයේ දවසෙ කතා කළා සත්‍ය ඥානය ගැන. මේ ලෝකයේ සත්‍යයක් තියෙනවා. ඒ සත්‍ය අපි දන්නෙනෑ. **සතාට සිවුපාවට නොතෙරුනාට ගස්වලට නොතේරුනාට මනුෂ්‍යයාට තේරෙනවා මේකෙ තේරුමක් නැහැ කියල. මේක වහගන්න අපි පාටි දානවා. බර්ත්ඩේ පාටි දානවා ට්‍රිප් යනවා අපි මේක වහගන්න ගොඩක් දේවල් කරනවා. මොකද්ද ඔබ වහගන්න හදන්නෙ සත්‍යය. සත්‍යයට ඔබ හරි බයයි. ඔබට ඕනෙ බොරුවෙන් ඉන්න. ඔබ කවදාවත් මැරෙන්නෙ නැහැ. ඕකනෙ කියන්න වෙන්නෙ. ඔව් ඉතින් රවට්ටගෙන ඉඳියි. දන්නෙ නැහැ මොකද්ද වෙන්නෙ කියලා.**

ඔබ හිතනවා ඔබ දිව්‍ය ලෝකේ යනව කියලා. මොකක් හරි බොරුවක් කියාගෙන කාලය ගත කරනවා. ඔබ ඔබව රවට්ට ගන්නවා. එහෙම රවට්ට ගෙන ඉන්නවා සතුටින්. අනිත්මට හුස්ම ටික යනකොට යටිගිරියෙන් කෑ ගහනවා. මර ළතෝනි දෙනවා ඇයි මෙච්චර කාලයක් ඔබ රවට්ට ගත්තනෙ. ඔබමනෙ ඔබ රවට්ටගෙන තියෙන්නෙ. ඇයි ඔබට සත්‍ය දකින්න ඕනකමක් තිබුනේ නැත්තෙ. ඊට පස්සෙ වයසට යනකොට මර බිය තියෙනවා. දැන් මොකද්ද කරන්නෙ. දැන් හොය හොයා යනවා මොනවද? දානෙ දෙන්ඩ ඕනෙ පින්දහම් කරන්න ඕනෙ. දැන් ගොඩක් හොය හොය දුවනවා පිස්සුවෙන් වගේ. මරබිය ඇවිල්ල ඉන්නකම්ම මරණයක් ගැන හිතපු නැති අය. මැරෙන්න ළංවෙන කොට දිව්‍ය ලෝකෙ

යන්න හිතෙනවා. හරියට අර ෆ්ලයිට් එකේ ටිකට් අරගෙන යනව වගේ. හිතන් ඉන්නෙ දැන්නම් හරි මං දිව්‍ය ලෝකෙ කියල. සමහර ආගම්වල එහෙම කියනවා.

දැන් ඔබ දිව්‍යලෝකෙ යනවයි කියලත් කියනවා. දැකල තියෙවද ඒ අය. අපි ඕනෙ කෙනෙකුට රවට්ටන්න පුලුවන්. ඇයි අපි ඇත්ත දන්නෙ නැහැනෙ. ඇත්තටම මොකද්ද වෙන්නෙ අපි දන්නෙනෑ. මැරුණට පස්සෙ වෙන්නෙ මොකක්ද කියල බලන්න. **ඔබ මැරුණට පස්සෙ ඉන්නව කවුරු හරි කියන එකක් විශ්වාස කරගෙන ඉන්නවා. කවුරුවත් දන්නෙත් නෑ දැකලත් නෑ හීන බල බල ඉන්නවා දෘෂ්ටි කාන්තාරයක, තවත් එක දෘෂ්ටියක හිරවෙලා. කොයිතරම් අසරණකමක් දැනෙනවද? මෙහෙම කියනකොට ඔබට දැනෙන්නෙ නැත්ද ඒ අසරණකම ඔබ හරි අසරණයි. නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං' ඔබ මේ ධර්මය දන්නෙ නැහැ. මොකක්ද මේ ධර්මය කියන්නෙ. සත්‍යය ධර්මයයි.** සත්‍ය ධර්මය කියන්නෙ ආගමක්ද? ආගම කියන්නෙ මරණින් මත්තෙ යන එකක්. මේක ආගමක් නෙවෙයි.

බුදුන් වන්සේ සත්‍ය ගවේෂී හෙව්වේ මේ සත්වයාට දුකින් මිදෙන මගක් නිගන්ඨයෝ බ්‍රාහ්මණයෝ ඒ ගොල්ලොත් සත්‍ය තමා හෙව්වේ. නමුත් ඒ ගොල්ලන්ට සත්‍ය හමුවුනේ නෑ. සමහර අය ගෝ ව්‍රත, කුක්කුර ව්‍රත, නිර්වස්තව ගංගා නම් ගඟේ නෑව. ඒ ගොල්ලො හිතුව හොඳ නරක කියල දෙයක් තියෙනවා. පව් පින් කියල දෙයක් තියෙනවා. එතකොට පව් ගෙවල ඉවර කරන්න ඕනි කියල හිතුව. පව් ගෙවල ඉවර කරන්න මොකක්ද කරන්නෙ. ශරීරයට වද දීල, දුක් දීල පව් ගෙවල ඉවර කරන්න හදන්නෙ. තාමත් මේ අපේ අය හිතන් ඉන්නවා පව් ගෙවල ඉවරයක් කරන්න. සමහර අය පින් කරන්නෙ පව් ඉවර කරන්න. තේරෙන්නෙ නැත්ද ඔබ දෘෂ්ටියක හිරවෙලා කියල. දැනෙන්නෙ නැත්ද ඕක කරන්න බැරි බව. බුදුන් වහන්සේ ඒක ප්‍රතික්ෂේප කළා. මේ කර්මය ගෙවල ඉවර කරන්න පුළුවන්ද? බෑ.

බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වෙන්න කලින් මහාමායා දේවිය පන්සිල් රැක්කා ඇයි ඒ. පව් ගෙවල ඉවර කරන්න. ඔබත් රකිනවා පන්සිල්. මේ බුදු කෙනෙක් පහළ වෙන්න කලින්. මිත්‍යාදෘෂ්ටික භූමියේ

මේ කර්මය ගෙවල ඉවර කරන්න පුළුවන්ද? හොඳ නරක කියන අන්තය ඉවරකරන්න යන්න හදනවා. මේකකට කියනවා වෘත සමාදානය කියල පංචශීලය වෘත සමාදානයක්. එය බුද්ධ ධර්මය නොවෙයි, කාටද මේක තේරෙන්නෙ. දැන් ඉන්නෙ ලංකාවෙ තනිකර මිථ්‍යා දෘෂ්ටිකයෝ. හරි පුදුම විදිහට මේ ගොල්ලො දෘෂ්ටිවල හිරවෙලා ඉන්නෙ. දෘෂ්ටි කාන්තාරයක. මේ කර්ම භූමිය ගැනයි පොත් තියෙන්නෙ. බුදුන් වහන්සේ දේශනා කරපු හේතුඵල දහම ගැන දන්නෙ නැහැ. ඒක ඔබ සත්‍ය දන්නෙ නැත්නම් ඔබ අන්ධයි. ඔබ මිථ්‍යා දෘෂ්ටිකයි. අපි සත්‍ය දැනගන්න ඕනෙ. අපේ හාමුදුරුවනේ මේ සත්‍ය අවබෝධ කරන්න. මේ සත්‍ය ධර්මය අවබෝධ වෙන්නම ඕනෙ ඒකට කාලය හරි.

ලෝකෙන් උතුම් රට ලංකාවයි. මේකෙ තියෙනවා නිවන් මග. මේක ධර්මද්වීපයක්. බුදුන් වහන්සේ අන්තුඩු පිරිවැඩියාගේ අසපුවට යනවා. ඒවාට කියන්නෙ අසපු. ඒවාට ආරාම කියන්නෙ නෑ. සූත්‍ර පිටකයේ මේවා මෙහෙමම තියෙනවා. ඔබටත් පුළුවන් කෝවිල්වලට යන්න. ඔබටත් පුළුවන් පල්ලිවලට යන්න. ඇයි එහෙම කියන්නෙ. බුදුන් වහන්සේ මේ ධර්මය දේශනා කළේ බෞද්ධයන්ට නොවේ. මේ ධර්මය අවබෝධ කරන්න ඔබේ ආගම වැදගත් නැහැ. ඔබ කුමන ආගමක සිටියත් ඒක අදාළ නැහැ. ආගම කියන්නෙ ඇදහිල්ලක්. මේක විශ්වාසයක් ඇදහිල්ලක් නොවෙයි මේ සත්‍යය, ඒක නිසා ඔබටත් පුළුවන් මේ සත්‍ය අවබෝධ කරගන්න. මේකෙ ඇත්තටම විසඳුම තියෙන්නෙ ඇයි ඉපදෙන්නෙ ඇයි මැරෙන්නෙ කියන එකම තමයි.

මේක හොඳින් ගලපලා බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරනවා. අපට ක්‍රිස්තියානි අය කතා කරනවා, මුස්ලිම් අය කතා කරනවා දෙමළ අය කතා කරනවා. අපට ඒක ප්‍රශ්නයක් නොවේ. හැම සංස්කෘතියක්ම වටිනවා. ලෝකෙ එක එක රටවල එක එක විදිහෙ සංස්කෘති තියෙනවා. හිම වැටෙන රටවල්වල කාන්තාරවල ඒ ඒ රටේ පරිසර ස්වභාවය අනුව සංස්කෘතිය හැඩ ගැහෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. ඒක අගය කරන්න. ඒක හරි සුන්දරයි. මේ ධර්මය අවබෝධ වුනා කියල ඔබ ඔබේ ආගම දකින්න. අපි මේ හැමෝටම ආගමක් තියෙනවා. බුද්ධාගමක් අද ආගමක් කියල අරගෙන තියෙනවා. ඒක ආගමක් කියල හිතුවොත් ආගමක් තමයි.

හැබැයි **ඔබගේ දුකින් මිදෙන මග හෙව්වොත් ඒ සත්‍ය ධර්මය ඔබට හමුවෙනවා ආගමට එහා සත්‍යයක්.** ඒ සත්‍ය ආගමකට අයිති නෑ. සමහර වෙලාවට අපි බණ කියන්නෙ මුස්ලිම් අයට. සමහර විට දෙමළ අයට. සමහර විට ක්‍රිස්තියානි අයට නිසා අපට අදාළ නෑ. ඔබ මනුෂ්‍යයෙක්. මනුෂ්‍යයට මේ සත්‍යය අවබෝධ කරගන්න අයිතියක් තියෙනවා ඔබට දුකක් තියෙනවා. ඒ දුකෙන් මිදෙන්න, බාධා කරන්න කාටවත් බැහැ. ඒක ඔබේ යුතුකම. අයිතිය ඒ මහා සසර ඕඝයේ නිමාව. මේ සත්‍ය අවබෝධ තුළ සිද්ධ වෙනවා. 'දුල්ලභං මනුස්සත්තං' 'දුල්ලභං සද්ධම්ම ශ්‍රවණං' 'දුල්ලභං ක්‍ෂණ සම්පත්තිං' මේක අති දුර්ලභ කාරණයක්. මේ සත්‍ය ඇසීමත් දුර්ලභයි. 'දුල්ලභං සත්ධම්ම ශ්‍රවණං' ඔව් ඇත්ත. මේ සත්‍ය ඇසීම අති දුර්ලභයි. දුර්ලභං 'ක්‍ෂණ සම්පත්තිං' මේ ක්‍ෂණ සම්පත්තිය අති දුර්ලභයි. 'දුල්ලභං මනුස්සත්තං'

**බුදුන් වහන්සේ දේශනා කරනවා මේ මනුස්ස ආත්ම භවයක් ලැබීම කණකැස්බෑවා විය සිදුරෙන් අහස දකිනවා වගේ අතිශයින් දුර්ලභ කාරණයක් විදිහට උපමාවක් පෙන්වනවා. ඒක ලේසි නෑ. බුදුන් වහන්සේට වැරදිලා නෙවෙයි. ඔබටයි වැරදිලා තියෙන්නේ. ඔබ ඉපදුනේ ඇයි? සත්‍ය අවබෝධ කරන්න. ඔබ ඒක දන්නවද නෑ. ඔබ හිතනවා දරුවෝ හදල ගෙවල් දොරවල් හදල මේ සල්ලි ටිකක් හොයල සැප විඳල මැරෙන්න. ඔබ රැවටිලා. ඔබට කවදාවත් ඔය සැප හම්බවෙන්නෙ නෑ.** ඔබ ඔබේ උපරිම ඇස් දෙක පිනවන්න. ඔබේ උපරිම දිව පිනවන්න. රසට හොඳ කෑම කන්න. ඔබ හොඳින් සල්ලි හොයන්න. ජීවත් වෙන්න. ඔක්කොම හොඳට කරන්න. හැබැයි ඒ සැපේ උපරිමයෙන් ඔබ ලබන්න. හැබැයි ඒ කොච්චර සැප ලැබුවත් ඊට එහා ගිය සැපයක් බුදුන් වහන්සේ දේශනා කරනවා. ඒ නිවන් සැපයයි.

ඒ හිතේ ගින්න නිවෙන ඒ අමා මහා නිවන් සුවය ඔබ අත්දකී නම්, මහණෙනි කල්පයක් හිටියත් වැඩක් නැහැ මහණෙනි මේ සත්‍ය එක මොහොතක් නොදැක කියන එක ඔබටත් අත් දකින්න ලැබෙයි. ඔබ බුද්දොත්පාද දේශනා අහන්න. මුල ඉඳලම අහන්න. ඔබ නිවන් දකිනවා. ඒකාන්තයෙන් ඔබ නිවන් දකිනවා. අපි ඔබට ඇපවෙනවා. එදා බුදු සමය වගේ 'ධම්ම චක්ක පවත්තන' සූත්‍රය වගේ. ඒ සද්ධර්ම ශ්‍රවණය

ඔබට නැවතත් සිද්ධ වෙනවා. දෑස් ඇර බලන්න කාලයයි දෑස් අරින්ට කාලයයි ඔබේ සියලු දුක අවසාන වෙනවා. මේ දේශනා අහන්නෙ මහත් භාග්‍යයක් නිසයි. මේව ලේසි නෑ. මේ 'ශූන්‍යත පටිසංයුත්ත' දේශනා ඔබ කියන තරම් ගැඹුරුත් නැහැ. හරිම සරලයි. හරිම සුන්දරයි හැබැයි හිතුවොත් හරිම ගැඹුරුයි. ඔබගේම ස්වභාවය අනුවයි ඒක ගැඹුරුද සරල ද කියන එක තේරෙන්නෙ. ඒක ඔබට භාරයි.

අපේ පැහැදිලි කිරීම විවිධාකාරයි. කෙනකෙනාට ගැලපෙන විදිහට මේ දහම විවර කරන්නට අපි කටයුතු කරනව. වයසක අම්ම කෙනකුට 'අම්මෙ, අම්ම නිවන් දකිනවා අම්මේ. අම්මලාට අපි කියන්න කැමතියි. කව්ද හිතුවේ අවුරුදු 2500ක් ගිය තැන ඔබ ඉපදිලා ඔබ මෙහෙම නිවන් දකිනවා කියල හිතුවෙ නැහැ නේද? ඔබ නිවන් දකින යුගයේ ඉපදිලා. ඔබ සූදානම් නැත්ද? සූදානම් වෙන්න කාලය ඇවිල්ලා. කාලය ඇවිදින් බුදු රජුන්ගේ ධර්මය දේශනා කරන්න. මේ සත්‍ය ධර්මය ලෝකයට විවර වෙනවා. මෙතෙක් ඔබ නොඇසූ පරමසත්‍ය අති ගාම්භීර දේශනාවක් විදිහට දෙරණ තලයට දෙදරුම් කමින් මුළු ලොවම කම්පා කරමින් ආත්මයක් නැති සත්වයෙක් පුද්ගලයෙක් නැත ස්වභාවයක් ගැන, සොබා දහමක් ගැන, සොබාදහමේ න්‍යායක් ගැන ලෝකයට විවර වෙනවා.

කිසි දවසක අහපු නැති දහමක් ගැබිනි මාතාවට අංගුලිමාල සූත්‍රය කියන කොට ඒ අංගුලිමාල සූත්‍රයක් නොවේ, ඒ පැහැදිලි කිරීමක් බුදු සමයේ කියලා දුක නැතිවෙන හැටි. අන්න පැහැදිලි කරනවා සප්ත සුරියෝද්ගම සූත්‍රය' දේශනා කරන කොට මේ එළියෙ තියෙන ලෝකයක් නොවෙයි මේ හිත තුළ මැවෙන ලෝකය. ඒ තිස් එක් ලෝක ධාතුවම හිත තුළින්ම දැකලයි අන්න ලෝකය විනාශ වෙන හැටි. අන්න නිවන් මග විවර වෙන හැටි බුද්ධෝත්පාද දේශනාවල ඔබ අසනවා සුර අසුර යුද්ධයක් නොවන බව මේ තමන්ගේම හිතේ තමන්ගේම මායාවට

රැවටුන තැන අන්න මාරයා අසුරයා වගේ, අර අසුරයාගේ මාර බන්ධනයට ඔබ කොටුවෙන හැටි සුරාසුර යුද්ධයෙන් පෙන්වනවා.

ඔබේ ඇසට පේනදේත් ඔබේ කණට ඇසෙන දේත් ඔබට දිවට දැනෙන දේත් නාසයට දැනෙන සුවඳත් කයට දැනෙන පහසටත් ඔබ

රැවටිලා තියෙන්නෙ. ඒ රැවටීමයි පෙන්වන්නෙ 'දෙල්පචිත්‍ර' අසුරයාගේ ඒ මාර බන්ධනය. ඒ මාර බන්ධනයයි ඔබේ ඇස කය දිව නාසය තුළ බැදෙන බන්ධනය. සුර අසුර යුද්ධයේ බුදුන් වහන්සේ දේශනා කළේ නිවන්මගයි. **'සප්ත සූරියෝද්ගම' සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරන්නේ නිවන් මගයි. මේ හැමතැනම හැම සූත්‍රයේම ධර්මය දකින්න 'ධම්මචක්‍ෂුය' අවදි වෙන්න ඕනෙ. මේ ධර්මය තියෙන්නෙ නිවන් මග විවර වෙන්නෙ. සුරයෝ හොඳයි අසුරයො නරකයි කියල අසුරයන් නරකයි සුරයන් හොඳයි හිතන තාක්කල් නැති දෙයක් තියෙනවා කියල හිතන තාක්කල් ඔබ මාරයට බැඳෙනවා. ඔබට මරණයක් තියෙනවා. ඔබට මර බියක් තියෙනවා. ඔබ මාර බන්ධනයට කොටු වෙනවා**. හැබැයි යථා දේ යථා විදිහට දැකීම 'යථාකාරි තථාවාදි', යථාකාරි දේ දකින එක 'යථාභූතං පජානාති' කියන එක විඤ්ඤාණ මායාවේ සත්‍ය දකින එකයි මේ 'යථාභූත ඥානය' කියන්නෙ.

'ප්‍රඥ්ඥා භාවේ තබ්බං විඤ්ඤාණං පරිනෙය්‍යයං' කිව්වේ ඒ නිසයි. ප්‍රඥ්ඥාව කුමක්ද විඤ්ඤාණ මායාවට නොරැවටීමයි. 'ප්‍රඥාවන්තං ආයං ධම්මං - ඤායං ධම්මං දුක්පණ්නස්ස' කීවේ කුමක්ද? ඒ ඔබ දුකෙන් මිදෙන්නේ විඤ්ඤාණ මායාවට නොරැවටුනොත් විතරයි. ඔබේ ඇසට පේන දේ සත්‍ය ද ඔබේ කණට ඇසෙන දේ සත්‍යද, ඔබේ දිවට දැනෙන රස නාසයට දැනෙන ගන්ධය, කයට දැනෙන පහස, ඔබ හොඳින් අසන්න. මේ සියල්ලම මායාවන්. මේවා කොහෙවත් තියෙනවා නොවෙයි. මෙතැනම මැවෙන මායාවන්. විඤ්ඤාණ මායාවෙන් තොර අත්දැකීමක් ඔබට නැහැ. එහෙනම් ඔබ මොන සිතුවිල්ලක් හිතුවත් හැම සිතිවිල්ලක් ම විඤ්ඤාණ මායාවක්මයි. ඔබට උරුම වන්නෙ දුකමයි. මායාවෙන් කොහොමද මායාව අවබෝධ කරන්නෙ. මේක එහෙම කතාවක් නොවේ. විඤ්ඤාණ මායාවේ සත්‍යය අසුවන්නේ ඔබේම අභ්‍යන්තර සත්‍ය ඥානය තුළ මතුවෙන සිහියටයි. "ඥායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ච කිරියාය' කියන්නේ නිවන් මග තුළ ඒක අසුවෙනවා. මේක සාමාන්‍යයෙන් අවුරුදු හතේ දරුවාටත් මේ සත්‍යය දැනෙනවා. මේක අමාරු නැහැ හරි සුන්දර කතාවක්.

ඔබ අසනවා ඔබට පූර්ව භාග ප්‍රතිපදාව පැහැදිලි කළා. ඒකෙ

දිගුවක් විදිහට අද දවසෙ ප්‍රායෝගික පැත්තෙන් මේ ධර්මය දකින්න උත්සාහ කරමු. අපි එතෙන්ට එන්න ඕනි. සත්‍ය ඥානය ඇතිහුටයි 'කෘත්‍ය ඥානය' තියෙන්නෙ. ඇස හැදෙන හැටි අපි පැහැදිලි කලා ඇස කියන්නෙ මස් ඇසට නොවෙයි, පේන බවට. ඔබට කොහොමද දෙයක් පේන්නෙ. හිත හැදෙන්නෙ කොහොමද මේ ආත්මය හැදෙන්නෙ කොහොමද? මේ ආත්ම සංඥාව ඔබ ඉන්නවා වගේ දැනෙන එක කොහොමද ඇතිවෙන්නෙ කියන එක. ඒ ආත්ම සංඥාව කොහොමද සකස් වෙන්නෙ. ඒ ආත්ම සංඥාව කොහොමද දියවෙන්නෙ. 'ආසවක්‍ෂය ඥානයට' එය හසුවන්නේ කොහොමද? ඔබ කොහොමද ඔබගේ අභ්‍යන්තරයේ ආසවක්‍ෂය ඥානය හඳුනගන්නෙ. අපි ඊයේ දවසෙ එය පැහැදිලි කළා.

ඒ සත්‍ය ඥානය ඇති විටයි කෘත්‍ය ඥානය තියෙන්නෙ. එහෙනම් ඒ හිත හැදෙන පෙර සිත් කඳ පිළිවෙළ දැක්කොත්, මේ මොහොතෙ අපිට කෙළින්ම බිත්තිය පේනව. බිත්තිය දකිනව නම් බිත්තිය දකින මමත් ඉන්නවා. හැබැයි මේ බිත්තිය කියන්නෙ ශබ්දයක්. ඇහැට එන්නෙ වර්ණයක්. ශබ්ද වර්ණ එකට එන එකයි ඔබ බිත්තිය දෙයක් කියල ගන්න එක. ඔබට පේන්නෙ බිත්තිය ශබ්දය. ශබ්ද වර්ණ වෙන් කරන්න බෑ. හැබැයි ඒක හැදෙන හැටි, ඔබ මව් කුසින් ලේ කැටි දරුවා තොටිල්ලෙ ඉන්න දරුවා මොන්ටිසෝරි යනකොට ශබ්ද වර්ණ එකතු වන හැටි ඔබ ඇහුවා. 'අම්මේ මේ මොකද්ද? පුතේ ඒ ඉර. මේක හඳ පුතේ, මේ අම්ම, අක්ක මොන්ටිසෝරි යනකොට කියල දෙනව කහපාට, රතුපාට, නිල්පාට මේක 'අ' යන්න මේක 'ර' යන්න. ඇහැට වර්ණයක් දෙනවා බෝඩ් එකේ වර්ණ ඡායාව අඳිනවා ඇඳල කණට ශබ්දයක් දෙනවා. කම්පන වේගයක් මේ ශබ්දය කියන්නෙ. වර්ණය කියන්නෙ කම්පන වේගයක්. ඒ ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතුවෙලා චිත්ත තරංගයක් හැදෙනවා. ඒකත් කම්පනයක්. තරංග කියන්නෙ කම්පනයක්. අපි කියනවා ස්පාර්ක් එකක් කියල. ප්‍රසාදයක් කියන එකයි ස්පාර්ක් කියන්නෙ.

**ස්කන්ධය කියන්නෙ වේගයට සකස්වෙන එකක්. දෙයක් තිබ්බොත් මාත් ඉන්නවා. පේනව ඇහෙනවා දැනෙනවා, මුකුත් නැතිවෙලා නැහැ. හැබැයි හැම දේම පේනවා ඔබට අවබෝධයක් එනවා ඒකෙ දෙයක්**

**නැහැ කියල. ඔබට දැනෙන්න ගන්නවා ඇත්තටම දේක වටිනාකම නොදැනෙන ස්වභාවයක් ඔබ තුළින් මතුවෙනවා. ඒ 'නිබ්බිදන්ති, නිරෝධන්ත විරාගන්ති පටිනිස්සග්ගානුපස්සි'** ඔබ සාමාන්‍ය විදිහට ගෙදර දොර වැඩ කරනවා. ඉගෙන ගන්නවා සාමාන්‍ය විදිහට. හැබැයි ඔබේ අභ්‍යන්තරයේ ගින්නක් ඇතිවෙන්නෙ නැහැ. තණ්හාව ඉරිසියාව වෛරය ක්‍රෝධය ඔබ තුළින් දුරුවෙනවා ටිකින් ටික. ඔබට පුදුම සැහැල්ලුවක් අත්දකිනවා. දරුවන්ට යුතුකම් හොඳට කරනවා. මහත්තයගෙ යුතුකම් ටික කරනවා. ඔබෙන් හැමෝටම යහපතක් සිද්ධ වෙනවා. ඔබ යන හැම තැනම පුදුමාකාර සුන්දරයි. හරි සිරියාවයි. හරි ප්‍රසන්නයි. ඒ ශාන්ත ප්‍රනීත සුවය ඔබ අත්දකිනවා. ඔබට ඒ අත්දැකීම් තියෙනවා.

හොඳයි අපි කථා කරමු අසා දැනගත් සත්‍යය. ඔබ එදිනෙදා කටයුතු කරනකොට ඔබ වතුර බොන කොට හිතට තිබහ වුනාට හිතට වතුර බොන්න බැහැ. හිත බඩගිනියි කිව්වට හිතට බත් කන්න බැහැ. හිත ඇවිදිනවා කිව්වට හිතට අවිදින්නත් බැහැ. හොඳට බලන්න හිත කියනවා වතුර තිබහයි කියලා. ඔබ කටට දානවා වතුර බඩට දානවා. එළියට යනවා. දැන් ඔබ කෝ ඔබ කියන්නෙ හිත. දැන් ඔබ බිත්තිය දකිනවා. බිත්තිය දකින මං ඉන්නවා. මේක දෘෂ්ටියක්. ආත්ම දෘෂ්ටිය දැන් මේ වතුර බොනවා. වතුර බොන්නෙ මමයි ඒක ආත්ම දෘෂ්ටිය. ඔබ කොහෙද ඉන්නෙ. දැන් කටට දානවා වතුර බඩට යනවා. එළියට යනවා. කෝ ඔබ වතුර බිව්වෙ නැහැනෙ. හිතට වතුර බොන්න බැහැනෙ. ඕක දෘෂ්ටියක්නෙ. ඒක ආත්ම දෘෂ්ටිය. ඔබ මේක දැක්කොත් සෝතාපන්න වෙනවා. ආත්ම දෘෂ්ටිය හඳුනාගන්න. වතුර බීපු කෙනෙක් නැහැ. ඔබ කියනවා මට බඩගිනියි, කටට බත් දානවා, බඩට යනවා එළියට යනවා. කෝ ඔබ බත් කාල නැහැනෙ. කව්ද බත් කෑවේ. හිතට පුළුවන්ද බත් කන්න. දැන් ඔබ කොහෙද ඉන්නෙ. ඔබ හිතන සිතුවිල්ලෙනෙ ආත්ම දෘෂ්ටිය හඳුනාගන්න. ඔබ ඔය කරන හැම දේකම ඔබ නැහැ.

ඔබට පුළුවන්ද ඇවිදින්න. හිතට ඇවිදින්න බැහැ. හිතට පුළුවන්ද එළවළු කපන්න. හිතට එළවළු කපන්න බැහැ. හිතට මොනවද කරන්න පුළුවන්. හිතට මුකුත්ම කරන්න බැහැ. ඔබ හැම තිස්සෙම ඔබව ගැටග හනවා. ඔබට රසක් දැනුනොත් ආ... මමද රස වින්දේ. දිවට දැනෙන

දේ දිවට දැනෙන්නේ ඒක සෙන්සර් එකක්. ඔබට පිළිකාවක් නම් ඔබගේ දිවේ රස දැනෙන එක නැති වෙනවා. ඔබ ඇස් අන්ධ නම් ඔබට වර්ණ පේන්නෙ නැහැ. ඔබේ කන් බිහිරි නම් ඔබට ශබ්ද ඇහෙන්නෙ නැහැ. එහෙනම් ඇස කියන්නෙ සෙන්සර් එකක්. මටනෙ පේන්නෙ. මමනෙ දකින්නෙ. කොහෙද ඉන්නෙ. දැන් ඔබ සෙන්සර් එක වැඩ කරන්නෙ නැත්නම් ඔබ නෑනෙ. ඔය සෙන්සර් එක ඔබද? නෑ ඒක දෘෂ්ටියක්. දෘෂ්ටිය කොතනින්ද පටන් ගන්නෙ. බලන්න මව්කුසෙන් එළියට එන ලේ කැටි දරුව මේවා මුකුත් දන්නෙ නැහැ. ඒකයි බුදුන් වහන්සේ කිවුවේ ජාතිය කොතනින්ද පටන් ගන්නෙ ජාති ධම්ම සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරනවා,

ස්කන්ධානානං පාති භාවෝ ආයතනානං පටිලාභෝ අයං වුච්චති ජාති' මහණෙනි, ඇසේ උපතයි උපත. ඇසින් බලල ඔබ දෙයක් කියල ගත්තොත් මේක පුටුව, මේක මේසෙ දැන් පුංචි දරුව මුකුත් දන්නෙ නැහැ. අන්න බාහිරින් ශබ්දයක් දානව. පුටුව පුතේ ඕක පුටුව. ආ.... පුටුව. ඇහැට එන වර්ණ හැඩතලය, කණට එන ශබ්දය එකතු වෙනවා. මේවා තියෙන්නෙ කම්පන වේගයටයි. ස්පාර්ක් වන වේගයට මේකෙ මූලයට යන්න ඕන. ඇස කියන්නේ ස්පාර්ක් වන වේගයමයි. ශබ්දය කියන්නෙ තත්පරයකට කෝටි වාරයක වේගයක්. විදුලි කොටනව වගේ. ඒක දිගටම ස්පාර්ක් වෙනවා. තප්පරයකට චිත්තක්ෂණ කෝටි ගණනක් පහළ වෙන අර එක හිතක් පහළ වෙන කොට චිත්ත වීථිවල පෙන්වන්නෙ මේකයි. මේ වේගයක් ස්පාර්ක් එකක්. ගඟ ගලනවා. වැස්ස වහිනවා. වේගයක් තමයි අපිට පේන්නෙ. සංඛාරා කියන්නේ වේග රූපයක්. අර ගිනි බෝලෙ කරකවන කොට ගිනි වළල්ලක් පේනවා. ඒ වේගෙට කැරකෙන එක තමයි සංඛාර 'සංඛාර සංඛාරත්තාය සංඛතං අභිසංකරෝති රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති' රූපය හැදෙන්නෙ රූප්පනයෙන් 'රුප්පත්තිකෝ ආවුසෝ රූපංවදේති' කියන්නෙ කම්පනය රුප්පනය කියන්නේ ඉද්දෙනව රුප්පනය ස්පාරක් වන වේගය රුප්පන වේගය. රූපය කියන්නෙ රුප්පන වේගයක්. රූපය රුප්පනය ස්පාර්ක් වෙනවා කිවුවෙ ඕකටයි. නූතන දරුවෙකුට තේරෙනවා මේක වේගයෙන් ස්පාර්ක් වෙනකොට ධනයි ඍණයි දිගටම ස්පාර්ක් වෙන කොට ආලෝකයක් පේනව වගේ, මෙන්න මේ ගිනිබෝලෙ කැරකෙන කොට ආලෝකයක්

වගේ ගිනි වළල්ලක් පේනවා. ඒවානෙ මේ ස්කන්ධ විග්‍රහයේ තියෙන්නෙ වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ. එන්නෙ කිරණයක්, කිරණ එන වේගයට දැනෙන්නෙ වේදනාවක්. ඒ තමයි සංඥාව. ඒකෙ වේගවත් නිසා බලයක් වගේ එන එක සංඛාරා. ඒක තුළ දැනීම දෙයක් වගේ ආලෝකය හැඩතලය දෙයක් වගේ දැනෙන එක චක්ඛු විඤ්ඤාණය. මේ ස්කන්ධ විග්‍රහයේ ප්‍රායෝගික පැත්ත.

එන්නෙ කිරණයක් දෙයක් වගේ දැනෙනවා ආලෝක හැඩතලයක්. ඒකෙ මුකුත් නෑ මේස පුටු ඇඳන් ඒක ශබ්දය අර තත්පරයකට කෝටි වාරයක් ස්පාර්ක් වෙනව වගේ. අර කර්ණ සංඛ පටලය ඩ්ර්...ඩ්ර්... ඒක තමයි කන් බෙරය වයිබ්‍රේට් වන එක. ඒක කොහෙවත් තියෙනවා නොවෙයි. මෙතනමයි. ඒක ෆැන්ටසි එකක් හීනයක්. **සත්‍ය ලෝකයේ හීනය ඔබ ජීවත් වෙන්නෙ හැම කෙනෙක්ම මේ ලෝකයේ ජනගහනය කෝටි අටසීයක්ම ඉන්නෙ විඤ්ඤාණ මායාවන්ට කොටුවෙලා හීනයක් බල බලා. එතනම ඉපදිලා එතනම මැරෙනවා. 'අවුත්තා සම්භූතා වුත්තානං භවිස්සති' පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිවම නිරුද්ධ වෙනවා. 'නහිදං අත්ථ කථං බිම්බං - නහිදං පරකතං අගං' මේක හදපු කෙනෙක් නෑ. කොහෙවත් නෑ. සත්වයෙක් පුද්ගලයෙක් මෙතන සිස්ටම් එකක් ප්‍රොසෙස් එකක් තියෙනවා. ඒ ආයතන කෘත්‍යයක් තියෙනවා. ප්‍රොඩක්ට් එකක් හැදෙනවා. අපි ඒක අවබෝධ කර ගන්නවා.**

නැති කෙනෙක් හදාගෙන නැති කෙනෙක් කොහෙද ඉපදෙන්නෙ. ඉපදුනේ ඇස පුටුව, මේසය, අම්මා, තාත්තා ගෙවල් දොරවල් සේරම හබ්ද වර්ණ පුටුව කියන්නෙ ශබ්ද වර්ණ නොවෙයිද? එතකොට ඉපදෙනවා කියන්නෙ මරණය කියන්නෙ 'අම්මේ මේ මොකක්ද. ඒක පුතේ මරණය. අම්මේ ඒකද අම්මෙ මරණය. ඔව් පුතේ ඕක තමයි මරණය කියන්නෙ. අම්මෙ ඒ කියන්නෙ මේ පොළවෙ වළලල දාන්නෙ ඒකයි මරණය කියන එක.' **ආ අම්මේ ඒකයි මරණය. රූප හැඩතලය තමයි පොලවේ වලලන්නේ. ඕක ශබ්දයයි රූපයයි එකතු වෙච්ච එකක්. ඕක කොහෙවත් තියෙන එකක් නොවෙයි. ඇසින් කනින් හැදෙන එක කොහෙවත් තියෙනවද.** අර ඇමරිකාවට විකුණපු දරුවා අම්මා 'මදර්' ඒ දරුව දන්නෙ නැහැ මැරෙනකම්ම 'අම්මා කියා අඬනවානෙ. අම්මා

හැදුනේ කෙහේද? ඇසට ආපු වර්ණයෙන් කණට ආපු ශබ්දයෙන් අම්ම ඉපදුනෙ ඇහෙන් කනෙන්.

දැන් චීනයේ ඉපදුනොත් 'චාංචීං' ඇයි කිරි දීපු අම්ම. කවපු පොවපු අම්ම. ඉස්කෝලෙ යවපු අම්ම. අභිසංකරණය තුළ දෙයක් වගේ දැනෙනවා අන්න කම්පනය ඒක පුරාම හටගත්ත බන්ධන බලය තුළ දුක. ආරෝපණය ඇසින් කනින් හදාගත්තා. ඒ ඇසින් කනින් හදාගත්ත එක කවුරුවත් කරා නෙවෙයි. 'නහිදං අත්ථ කතං බිම්මං නහිදං පරකථං අගඃ' දැන් මෙතන ඔබ ප්‍රායෝගික පැත්තට එනකොට කෘත්‍ය ඥානයට එනකොට මෙන්න මේ අවබෝධය ලැබෙනවා. දැන් ඔබට පේනවා දැන් ඔබ කෙනා නැතිව දකින්න හැමදේම හරිම සරලයි. හරි සුන්දරයි. නිවන් අත්දැකීමක් ලබන්නේ. 'ඔබෙන් තොර ඔබ මගෙන් තොර මම' 'මට මම නැතිවෙන හැටි' අන්න ක්‍රියා සිත ඔබ අත්දකිනවා. කර්ම විපාක ඔබට තියෙනවා කියල හිතනවාද. ඔබට කර්ම විපාක නැහැ. ඇයි ඒ කර්ම විපාක දෙන්න කෙනා නැහැ.

ඔබ දැන් කියනවා දැන් මට බිත්තිය පේනවා කියල. බිත්තිය කියන්නෙ ශබ්දයයි වර්ණයයි. එහෙම එකක් එළියෙ නැහැ, ඊට පස්සෙ හිතේ බිත්තිය තියෙනවද හිතෙත් නැහැ. දැන් බිත්තිය කෝ බිත්තිය කියල දෙයක් නෑ. දැන් පෙන්නැද්ද. ඔව් ඉතින් දන්නවා එහෙම දෙයක් පෙන්නෙ නැහැ කියනකොට ඒකට වටිනාකමක් දැනෙන් නැහැ. අන්න චන්දරාගය දුරුවෙනවා. **වර්ණ පටිසංවේදි වර්ණ රාඝන පටිසංවේදී** අන්න ඔබ නිවන් දකිනවා. ඒ කියන්නෙ දෙයක් නැහැ කියන්නෙ ඔබත් නැහැ 'නේතං මම' දෙයක් තිබ්බොත් 'ඒතං මම' අන්න මටයි බිත්තිය පෙන්නේ මම ඉන්නවා. කොහෙද ඉන්නෙ, දෙයක් වගේ දැනෙන්නෙ මටනෙ. මේකෙ සත්‍ය දකිනකොට දෙයක් වගේ නොදැනෙන එක මේක දෙයක් වගේ දැනෙන එක 'ආසවක්‍ෂය ඥානය' දෙයක් වගේ දැනෙන එක දියවීගෙන යන ස්වභාවය අන්න ආත්මය දිය වීගෙන යන ස්වභාවය 'නිබ්බිධන්ති විරාගන්ති නිරෝධන්ති පටිනිස්සගානු පස්සි'

විද්‍යාව මේ සත්‍යය දකින එක, අවිද්‍යාව දෙයක් කියල ගත්ත එක. එහෙනම් ඒ අරමුනේ දෙයක් කියල ගැනීමමයි දුක 'දුක්ඛ සත්‍යය' 'සමුදය' දෙයක් කරගන්න එක දෙයක් තියෙනවා නම් දුකක් තියෙනවා දෙයක්

කියන්නෙ අභ්‍යන්තරයට දැනෙනවා දෙයක් වගේ. අරමුණු දෙකක් කර ගැනීමමයි 'අජ්ජෝසාය තිට්ඨති' කීවේ 'තදුපාදානං භවෝ' ඒ කියන්නෙ බැස ගත්තොත් දෙයක් වගේ දැනෙන එක වටිනාකම 'නන්දිය' එතනමයි උපාදාන බලය දෙයක් වගේ දැනෙන එක 'අජ්ජෝසාය තිට්ඨති - යාරූපේ නන්දි' තදුපාදානං භවෝ' අන්න භවය හැදුනා. ඒ පටිච්ච සමුප්පාද ධර්මය භව පච්චයා, 'ජාති ජරා මරණ ශෝක පරිදේව' සියල්ලම දැන් ඔබට තියෙනවා මේ අරමුණේම තියෙන්නෙ. පටිච්චසමුප්පාද ධර්මය, ඒ නිසයි ඔබ අරමුණෙන් මිදෙන්නෙ. ඔබ නැතිවෙලා ආත්මය නැතිවෙලා.

දැන් ඔබ ප්‍රායෝගික වෙනවා. දැන් ඔබ ගෙදර වැඩ කරනවා. දැන් ඔබ එන ප්‍රශ්නයක් තියෙනවද? දැන් ඔබට කිසිම දෙයකට ගින්නක් නැහැ ගෙදර ඕනෑම දෙයක් කරනවා. දරුවාට බෙහෙත් ටික දෙනවා. රෑ 12.00ට උනත් 'යම් පුතේ ඉස්පිරිතාලෙට ගිහින් බේත් ටිකක් ගනිමු.' ඔබට කිසිම කම්මැලිකමක් නැහැ. ඇයි ඒ ඔබට ඔබ නැහැනෙ ඔබ යුතුකම් විතරයි කරන්නෙ. ඔබ හොඳට දරුවාට සලකනවා. අම්ම ඉස්සර වගේ නෙවෙයිනෙ. අම්මා කිසිම නැහැනෙ දුකක් කම්පනයක්. මොකක්වත්. අම්ම හොඳට ප්‍රෙෂ් එකේ ඉන්නවනෙ. මම දැන් ඉස්සර වගේ නෙවෙයි පුතේ සත්‍ය දකිනවා. මට ඉස්සර වගේ දුකක් ආවත් කම්පනයක් නැහැ. ධර්මය තියෙනවා පුතේ. ආයේ මට සසර දුකක් නැහැ. පුතාටත් දායාද විදියට මං ළඟ තියෙන වටිනාම සම්පත පුතාට දෙනවා. ඔබ ඒ අම්මා වෙන්න. සැබෑම බෞද්ධ දරුවෙක් වෙන්න කියල දෙන්න. ඔබේ මහත්තයත් ඔබේ දරුවනුත් ඔබට සලකාවි.

ඔබ රැවටෙන්නෙ නැහැ කිසි දේකට. සුන්දර කතාවක් අද ඉර පායයිද මන්දා. අන්ධකාරය පසාරු කරගෙන අරුණාලෝකය වැටෙන්නා සේ මේ දෙරණ තලයට මේ මහා ප්‍රඥා ආලෝකය පහළ වෙනවා ඔබට දැනෙනවා. ඔබ කෙතරම් භාග්‍යවන්තද ඒත් ඔබ කියයි මේ දේශනා ඇහෙන්නෙ ටික දෙනාටනෙ ආර්යයන් වහන්ස. ඔව්. භාග්‍යවන්තයො බොහොම අඩුයි. මිථ්‍යාදෘෂ්ටිකයො ගොඩක් වැඩියි. බුදුන් වහන්සේ අපට කියල දුන්න ගහක් යට ඉන්න හැටි. මහ පොළොවෙ ඇවිදින හැටි. ඒක අපිට සනීපයි. ඒ උත්තරීතර හුදකලාව. බුදුන් වහන්සෙ අපිට

දේශනා කළ ඒ අධ්‍යාත්මික හුදකලාව ඔබටත් දැනෙනවා. ඔබ මහා භාග්‍යවන්තයි. තෙරුවන් සරණයි.

*(ඉහත සාකච්ඡාව මෙතැනින් අවසන්)*

**උපාසිකාව :** ගෞරවනීය ආර්යයන් වහන්ස මම මේ දවස්වල ඔබ වහන්සේගෙ කමටහන් තමයි වඩන්නෙ. හුඟක් වෙලාවට මම උදේ සක්මන් කරන අවස්ථාවේදි තමයි ඒ දේ කරගෙන යන්නේ. හිතෙන් හදා ගත්ත පාර දෙපැත්තෙ තිබුණු හිතෙන් හදාගත්ත මල් පිපිල තිබුණ. මල් යන ශබ්දය සෝක ප්‍රසාදයට තමයි දැනුනෙ. ඝාන ප්‍රසාදයට හිතින් හදාගත්ත මල් සුවඳ දැනුන. හිතින් හදාගත්ත ගෙදරක මුළුතැන්ගෙයි හිතින් හදාගත් කෑම වර්ගයක් රෝස්වන සුවඳ ඝාන ප්‍රසාදයට දැනුන. ඒ එක්කම ජීව්හා ප්‍රසාදයක් සිතින් එහි රස විඳිනවා පේනවා. සිතින් හදාගත් සිසිල් සුළඟ කාය ප්‍රසාදයට දැනිල. ඒ අස්සෙ හිතේ හටගත් ගුවන්යානයක ශබ්දය සෝත ප්‍රසාදයට දැනිල. ඒ අස්සෙ තමන්ට වාදනයක් ශබ්දය කිව්වෙ නැහැ, ශබ්දය ආවෙ ගුවන් යානයකින් කියල. හිතින් හදාගත් ගුවන් යානය කිවුවෙ නැහැ ඒ ශබ්දය එයාගෙ කියල. මේ අයුරින් හිතෙන් හදාගත්ත පාරේ හිතෙන් හදාගත් මල්වල වර්ණ හැඩතල චක්ඛු ප්‍රසාදයට පෙනිල. ඒ අතරේ මගේ දුවත් ආවා පොඩ්ඩක් ඇව්දින්න කියල. ඒ වෙනකොට මම පැය එකහමාරක් විතර ඇවිදල එතකොට ටිකක් කාය ප්‍රසාදයට වෙහෙසක් වගේ දැනිල තිබුනෙ. ඒ එක්කම කාය ප්‍රසාදය බලවත් වෙලා. කාටද මේ මහන්සිය දැනෙන්නෙ. මෙතන කෙනෙක් නැහැ. ඒ හැඟීම ආපසු නිසාම මම දුව සමග තවත් විනාඩි 45ක් පමණ වේගයෙන් ඇවිද්ද. ඇවිදලා නැවත නිවසට ආවා අර සිතුවිල්ලම පෙරටු කරගෙන. මේක මට කමටහනින් පිට නිසා මනසට චිත්‍රපටියක් වගේ දැනුන අවස්ථාවක්. ඒකයි ඒක ඔබ වහන්සේට කියන්න හිටියේ.

**ආර්යයන් වහන්ස :** කමටහන මොකක්ද එතකොට.

**උපාසිකාව :** මම කමටහන වඩන්නෙ මේ අන්තිම හුස්ම බිංදුවයි.

**ආර්යයන් වහන්සේ :** නෑ නෑ ඔය කමටහන තියෙන්නෙ ඒ කමහටන නෙවෙයි. අන්තිම හුස්ම බිංදුව නම් එතනින් එහා දෙයක් නැහැනෙ.

**උපාසිකාව :** දෙයක් නැහැ, නමුත් සක්මනේ යෙදෙන අවස්ථාවේ දි සිදුවන සිදුවීම් පෙළක් තමයි මන ප්‍රසාදය.

**ආර්යයන් වහන්සේ :** මෙතන දුව ආවා කියන එක දකිනවා වෙන්න පුළුවන් ආයතන ටික. ශබ්දාරම්මනයක්, මේක වර්ණාරම්මනයක්, මේක ගන්ධාරම්මනයක්, මේක ඝානවිඤ්ඤාණයක්. මේක චක්ඛු විඤ්ඤාණයක්, මේක මනෝ විඤ්ඤාණයක්. එතකොට ආයතන ටික දකිනවා. රූප දර්ශනය. හොඳයි. සවිතක්කයි මෙනෙහිකරනවා සිතුවිලි ඒක හොඳයි හැබැයි අවිතක්ක කියන්නෙ ඕක නෙවෙයි. 'අවිතක්ක' කියන්නෙ දෙයක් කරගෙන නෙවෙයි එතකොට දකින්නෙ ආයතන ටික කියල. ඒක එළියෙ කතාවක් නොවෙයි. එතකොට ඒක 'සවිතක්ක' ස්වභාවයක්. දෙයක් හම්බවෙන්නෙ නෑ මෙතන දෙයක් නැහැ කියල ඔබතුමිය කිවුවනෙ මෙනෙහි කරනවනේ මේක විඤ්ඤානයක් කියල මෙනෙහි කරන එකක් කිවුවනෙ. එතකොට එතන තියෙනවා මාර්ගය තමයි. හොඳයි සවිතක්ක තමයි හොඳයි.

ඒ වුනාට ඕක මේ අන්තිම හුස්ම බින්දුව නෙවෙයි. ඒක පස්සෙ පැහැදිලි කරනවා එතකොට ඔය කරපු දේ කියන්නම්. ඔතන මම නැතුව දකින්න ඔය කමටහන තියෙන්නේ ආයතන නිරෝධය දකින එකක්. ඔතන කරන්නේ සලායතන නිරෝධයක් දකින්නේ ඕකෙ කෙනා දකින්නෑ එතකොට. අපි කියන්නේ රූප දර්ශනය 'සෙන්සස්' ටික දකියනවා කියන්නේ ඕකටයි. එතකොට එතන කෙනා නෑ සත්වයෙක් පුද්ගලයෙක් නෑ. ආත්මයක් නෑ 'චිත්තේන නීයතී ලෝකෝ' ඒක තියන සත්වයා ඉන්නවා, එතකොට හිතේ තියෙන ලෝකේ තමයි එක මට්ටමකින් බාහිර කථාවක් නැති බව ඉත්ථභව. මේක ඊට වැඩිය ගැඹුරුයි. බාහිරෙත්නෑ සිතෙන්නෑ ආත්මයක් නෑ **දෙයක් තිබ්බොත් ඒක බාහිර තියෙනවා. නැත්නම් සිතේ තියෙනවා. ඔබතුමිය ඒක හිතේ තියෙනව කියල ගන්නවා. එතකොට ඒක තව අන්තයකට ඇවිල්ලා. නාමයේ අන්තයකට ඇවිල්ලා. රූප අන්තයෙන් ගිහිල්ලා දැන් ආර්යයන් වහන්සේ කියන්නෙ නාම රූප අන්ත දෙකෙන්ම මිදෙන එකක්.** මොකක්ද ඒ කියන්නෙ. මෙතන ආත්මයක් නැහැ කියල දෙයක් නැහැ කියල. එතකොට සෙන්සස් ටිකක් විතරයි. ඒ කියන්නෙ සෙන්සස් ටික ප්‍රසාද ටිකක් විතරයි. ඒ ප්‍රසාද

ටිකෙන් පෙන්වන දේත් දෙයක් නෙවෙයි කියල දකිනව. දැන් ඔබතුමියට දෙයක් තියෙනවා. හැබැයි ඒ හිත කියල දකිනවා. ඔබතුමිය ඉන්නෙ ඊට එහා තියෙන කමටහනක. ආර්යයන් වහන්සේ කියනව ඊට වඩා ටිකක් ගැඹුරට ආපු කමටහනක් නේද?

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒක ඊට වැඩිය හොඳයි නේද 'චිත්තේන නීයති ලෝකෝ' දකිනවා? හැබැයි එතනත් දෙයක් නෑ කියල දකිනවා. එතකොට සෙන්සර් ටික විතරයි දකින්නෙ. ප්‍රසාද ටික විතරයි දකින්නෙ. **රූප දර්ශනයෙන් අයින්ට වෙලා ඔබතුමිය රූප දර්ශනය තියාගෙන ඉන්නවා හිතේ කියල** චිත්තේන නීයති ලෝකෝ කීවෙත් ඒකයි. 'චිත්තේන නීයති ලෝකෙන් ඔබ මිදෙනවා. ඕකමයි කතා කරන්නේ ලේයර්ස් කියල **සෝවාන් කියන්නෙ බාහිරෙන් මිදෙන එක. රූප අන්තයෙන් මිදෙන එක. අනාගාමි කියන්නෙ නාමාන්තයෙන් මිදෙන එක.** නාම රූප අන්ත දෙකෙන්ම මිදෙන එක තමයි අප කතා කරන්න. ආර්යයන් වහන්සේ ඊට වඩා ගැඹුරු පැත්තක් කියන්නෙ.

**හිත කියල කිවුවොත් ඒක හිතේ අන්තයට. බාහිර කිවුවොත් පෘතග්ජන අන්තයට යනවා බාහිර ඇත්ත වෙනවා. බාහිර පෘතග්ජන අන්තයෙන් මිදුනොත් සෝතාපන්න අන්තෙට එනව. හැබැයි ඒකෙ අනාගාමි අන්තය සිතෙන් මිදුනා කියන එක. එතන දෙයක් නැහැ කියන තැනයි අනාගාමි.** අනාගාමි කියන්නෙ ගති නිමිති කම්ම නිමිති පහළ වෙන්නෙ නැහැ කියන එක. හැබැයි ඔය කමටහනට මේක ඔබතුමිය දැක්කොත් මේක සේනසස් ටික කියල ප්‍රසාද ටිකක් කියල අන්න එතකොට අනාගාමි පැත්තටයි එන්නෙ. සාමාන්‍යයෙන් මෙන්න මෙහෙම මෙනෙහි කරන්න ඕනෙ. දැන් අපි උස පනින ක්‍රීඩකයෙක් බැලුවොත් ගොඩක් උස පනින්න කියල උත්සාහ කළොත් ටිකක් හරි උඩ පනිනවා නේද2

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්ස :** අන්න එහෙම ඔබ තුමියත් බලන්න ඕනෙ. බාහිරය ඇත්ත කරගෙන නෙවෙයිනෙ ඉන්නෙ. ආර්යයන් වහන්සෙ

කියන ඔක්කොම දැන් අහගෙනයිනෙ ඉන්නෙ. එතකොට හිතෙත් දෙයක් නැහැනෙ. ඒකත් අයින් කරන්න. ඔබතුමිය ඔය කමටහනට සංස්කරණය කරගන්නවා. ඔබතුමියම අභ්‍යන්තරයෙන් මේ කමටහන සකස් කර ගන්නවා. ආයතන ටිකක් විතරයි කියල 'ආයතන නිරෝධය දකිනවා' හරිද. කෙලින්ම අනාගාමි භූමියෙන් එහාට කමටහන දැන් හරි නේද?

**උපාසිකාව :** හරි

**ආර්යයන් වහන්සේ :** එතකොට අඩු තරමේ සෝවාන් වෙලාහරි නවතිනවනෙ. තේරෙනවා නේද දැන් කියපු එක කොයි තරම් වටිනවද?

**උපාසිකාව :** තේරෙනවා

**ආර්යයන් වහන්සේ :** ඒකනෙ රූප දර්ශනයෙන් මිදුන 'ඕභාසය' කියල අනුරුද්ධ ස්වාමින් වහන්සේ ඔය බුදුන් වහන්සේගෙන් අර 'උපක්ලේශ සූත්‍රයේ' පැහැදිලි කරන කතාව මතකද 'උපක්ලේශ සූත්‍රයේ' අර අධිගත ඥාන දස්සන සමාධිය' කියන්නෙ රූප දර්ශනයෙන් මිදුන ඒ කියන්නෙ ඔය සෙන්සස් ටිකක් කියල දකිනව. ඒ සෙන්සර් කියල දකිනකොට මේ ප්‍රසාද ටිකක් විතරයි කෙනෙක් නැහැ. දෙයක් නැහැ. මේක චක්ඛු විඤ්ඤාණය සිතක් කියනවා. ඒකනෙ කිවුවෙ මේක සෝත විඤ්ඤාණ සිතක් ශබ්දයක් ආවොත් ඒක දෙයක් කරගන්නේ නැහැ. එතකොට ප්‍රසාදයක විතරයි දකින්නෙ ඒ කියන්නෙ සෙන්සර් එකක් විතරයි කියලා. දැන් මොනව හරි රසක් දැනුනොත් මේක දිව මේ ජිව්හා විඤ්ඤාණයක් කියල ගන්න කොට ඒකෙ දෙයක් වෙන්නෙ නැහැ. ඒක එතකොට පුතාද දුවද මේසෙද දෙයක් වෙලා නැහැ. දෙයක් වෙලා නැහැ කියන්නෙ මේක දැන් විඤ්ඤාණයට මැවෙන එක කොහෙවත් තියෙනවා නෙවෙයි. දැන් විඤ්ඤාණයට මෙතන සකස් වෙන කොට මේක කොහෙවත් නැහැනෙ.

මේක සෝත විඤ්ඤාණය මේ ප්‍රසාදය දකිනවා. මේක ජිව්හා විඤ්ඤාණය, මේක කාය විඤ්ඤාණය. එතකොට මේක ප්‍රසාදයක් මෙතනම සෙන්සර් එක දකිනවා. ස්පාර්ක් වෙනව දකිනවා. එතකොට ඒක දෙයක් වෙලා නැහැ. දෙයක් කරගෙන නැහැ. හැබැයි ධර්මය හොඳින් දැනගෙන තියෙන්න ඕනෙ. මෙතන ශබ්ද වර්ණ විතරයි දෙයක් නැහැ

කියන එක. ඕක ඊට පස්සෙ මෙහෙම වෙනවා. දැන් දරුව කියල දේකුත් නැහැ. ඒක චක්ඛු විඤ්ඤාණයක්නේ. ශබ්දයක් ඇහෙනවා ඒක සෝත විඤ්ඤාණයක්නෙ නේද. ඔතෙන්ටනෙ ඔය එන්න හදන්නෙ. ඒකනෙ ඔය ප්‍රැක්ටිස් කරන්නෙ. එතකොට සුළඟක් ඇවිදින් ඇඟේ වැදුනාම මේක කාය විඤ්ඤාණයනෙ. ඒකනෙ ඔය කියන්න යන්නෙ. ඔබතුමිය කිව්වෙ ඔය ටික විඤ්ඤාණය ඕක දැනීමක්. දැනීම මොකක්ද කියල අදාළත් නැහැ. ඇයි විඤ්ඤාණයක් කොහෙවත් නැහැනෙ. විඤ්ඤාණයක් කියන්නෙ මේ සෙන්සස්වල එකතු වන එකක් කෙහේවත් නැහැ කියන එක. ඒ කියන්නෙ ශබ්ද කියන්නෙ කම්පනයක්නෙ. වර්ණ කියන්නෙත් කම්පනයක්. ශබ්ද වර්ණ එකතු වුන එකක් විඤ්ඤාණයක් කියන්න බැහැ. ඒක කම්පනයක් විතරයි එකන එක. දැන් වර්ණයක් දකින කොට කම්පනයක් විතරයි. ඊට පස්සෙ දැන් සුළඟක් වදිනකොට එකක් කම්පනයක් විතරයි. ඊට පස්සෙ රසක් දැනෙන කොට ඒකත් කම්පනයක් විතරයි. ඔය විඤ්ඤාණයක් එතකොට දැනෙන්න ඕනෙ කම්පනයක් විතරයි කියල.

ඊට පස්සෙ සුවඳක් ආවොත් කම්පනයක් විතරයි. මේක පිච්ච මල් සුවඳ ද අරක ද මේක ද හොයන්න යන්නෙ නෑ. හරි නේද? ඒවා විඳින්න යන්නෙත් නෑ. ඒවා ගැන අදහසකුත් නැහැ නේද. ධර්මය කොහොමත් දකිනව නේද එතකොට කම්පනයකුත් මේක විඳින කෙනෙකුත් ඉන්නවද. එතකොට ප්‍රසාද ටිකක් විතරයි. ප්‍රසාද දෙයක් වෙන්න නැහැනෙ. දෙයක් නම් ඒ දේ දකින මමත් ඉන්නවා. හැබැයි දෙයක් නැත්නම් අන්න තමන්ට අභ්‍යන්තරයට දැනෙනවා සැහැල්ලුවක්. වෙන මුකුත් නැහැනෙ එතකොට 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' කියන ස්වභාවය අත්දකින්න ලැබෙනවා. **මේ හිතන එක වෙනයි දැනෙන එක වෙනයි. දැන් සවිතක්ක ස්වභාවයක්නෙ. දැන් මෙනෙහි කරන එක වෙනයි. ඊට පස්සෙ මිදෙන අත්දැකීමකුත් එනවා අභ්‍යන්තරයෙන්. ඒක නවත්වන්න බැහැ. මුල ඉඳලම එනව ඒ ස්වභාවය. එහෙනම් දෙයක් නැහැනෙ. දෙයක් නැහැ කියල දැනෙනත් ගන්නවා.** හිතපු එක වෙනයි. දැනෙන එක වෙනයි නේද?

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්ස :** දැන් දෙයක් තියෙනවා කියල හිතන එක වෙනයි, දෙයක් තියෙන බවට දැනෙන එක වෙනයි. **දෙයක් නැහැ කියල මෙතන දැන් හිතනවනෙ, දැන් මෙහෙම යනකොට දෙයක් හම්බවෙන්නෙ නැහැනෙ. ඊට පස්සෙ ඒක දැනෙන්න ගන්නවා. ඒක දැනෙන්න ගන්නකොට අභ්‍යන්තරය නිකන් හිරි වැටෙනවා වගේ නේද?** අභ්‍යන්තරයට නිකන් දෙයක් නැහැ වගේ දැනෙන එක ඔබතුමියට සිහියට තමයි ඒක අහුවෙන්න ගන්නෙ. දෙයක් නැති බව දැනෙන එකක් එනවා. හැම දෙයක්ම දෙයක් කරගෙන ඒවා හොයන එකක් නැහැ. හොයන ගතිය අඩු වෙනවා. අභ්‍යන්තර පරිවර්තනයක් වෙනවා මේ අභ්‍යන්තර පරිවර්තනය සිතුවිල්ලක් නොවෙයි.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්ස :** සිතුවිල්ල නොවෙයි. දැන් සිතුවිල්ලෙන් නිවන් දකින්න බැහැ. මනසිකාරයේ එක්තරා මට්ටමකට 'සවිතක්ක' ස්වභාවයක් මනසේ තියෙනවා. මනසිකාරය ඒ කියන්නෙ මාර්ගය පමණයි. 'මාර්ග සිත්'වෙනයි. 'ඵල සිත්' වෙනයි. මේ දැනෙන එක 'අවිතක්ක ස්වභාවය තේරුනාද? දැන් මෙනෙහි කරනකොට මෙනෙහි කිරීම නිසා එන ඵලයකුත් තියෙනවා නේද? ඒ ඵලය තමයි මේකෙ මොකවත් දෙයක් වගේ නොදැනෙන අභ්‍යන්තරයට දැනෙන එක. ඊට පස්සේ ඒක තමන්ට දැනෙනවා. ඕක මෙනෙහි කර කර යනකොට ඔය කමටහනෙන් අභ්‍යන්තරයට ගානක්නෑ සැහැල්ලුවක් දැනෙනවා. දවසක් කරනවා දෙකක් කරනවා තුනක් කරනවා. සතියක් යනවා. මාසයක් විතර යන කොට ඔබතුමියට නිකන් සෘද්ධියෙන් යනව වගේ දැනෙයි. තිබ්බත් එකයි. දුව ආවත් එකයි. ටික දවසකට නාවත් එකයි පුදුම දියුණුවක් කරා යනවා.

**උපාසිකාව :** දැනටමත් ආර්යයන් වහන්ස ඒ ගතිය තියෙනවා. කොහොම වුනත් දේවල් දෙයක් කරගන්නෙ නැතිව කාලය ගතවෙනවා.

**ආර්යයන් වහන්ස :** දැන් ඒකයි ඔබතුමිය හිත හිතා කරන එකක් තාම තියෙනවා ඔබතුමිය කියන විදිහට තිබ්බා. ඔබතුමියගේ අභ්‍යන්තර පරිවර්තනය සිහියට ගලපන්න කියන එකයි කියන්නෙ. දැන් දියුණුව

තියෙන්නෙ අභ්‍යන්තරයේ අර පරිවර්තනය සිහියට ගලපන්න කියන එකයි කියන්නෙ. දැන් දියුණුව තියෙන්නෙ අභ්‍යන්තරයේ අර පරිවර්තනයේ දෙයක් වගේ දැනෙන්නෙ නැති ස්වභාවයක් අභ්‍යන්තරයෙන් මතුවෙන එකට සිහියක් තියෙන්න ඕනෙ. අවදිවෙන්න ඕනෙ. **ඔබතුමිය කියන හැමතැනම හිතන බවක් කිව්වා. මෙනෙහි කරන එකක් කිව්වා. දරුවා කියල හිතුව. දරුව කියල කෙනෙක් නැහැ කියල හිතුව. ඒක විඤ්ඤාණයක් කියල හිතුව. විඤ්ඤාණයක් කියල ඔබ පෙන්වපු කමටහනේ ඒකම තමයි හරි විදිහ. ඒ කමටහන අනුවයි මේ කියන්නෙ. ඒකෙම දියුණුව තමයි මේ කියන්නෙ. ඕක තමයි දියුණු වෙනව කියන්නෙ. ඔය කමටහන වෙනස් කරන්න එපා!** ඒ කමටහනේම යන්න පුළුවන් කියලයි නොකියා කීවේ තේරුණාද?

**උපාසිකාව :** එහෙමයි. ආර්යයන් වහන්ස. ඒ වෙලාවෙ මට මෙහෙම හැඟීමක් ආවා. ඇත්තටම ටිකක් විඩා ගතියකුත් දැනුණා. එයා වේගයෙන් යන කෙනෙක්. මගේ කමටහන ඒ වෙලාවෙ හොඳට ඉදිරියට ආවා ඉදිරියට ඇවිත් කමක් නැහැ. වෙන දෙයක් වෙත්දෙන්. ඕනෑ දේකට සූදානම් වෙනවා කියල හිතාගෙන ඇවිත් තමයි එයත් එක්ක ගමනට ගියේ.

**ආර්යයන් වහන්ස :** ඕනෑ දෙයක් වුනාවෙ කිව්වෙ. ඒකෙ තේරුම එහෙම සිතක් පහළ වෙන්න හේතුව මොකක්ද? ඕන දෙයක් වුනාවෙ කිවුවෙ මැරෙයි කියල ද?

**උපාසිකාව :** නෑ ඉතින් එහෙම වෙහෙස දැනෙන කෙනෙක් හිටියොත්.

**ආර්යයන් වහන්ස :** නැහැ නැහැ. මේකෙ හැමතැනම කෙනෙක් ඉඳීවි කියල එහෙම ගන්න එපා. ඒ දැනෙන එක දෙයක් කරගෙන තියෙන්නෙ වෙහෙස දැනෙන එක කයේ ස්වභාවයක් කියල දකින්න. වෙහෙසක් කාය විඤ්ඤාණය කියල දකින්න. එතකොට එතනත් කෙනෙක් නැහැ. ඔය විඤ්ඤාණයක් කියල ගන්න හැමතැනම කෙනා නැති වෙනවා. අමුතුවෙන් කෙනෙක් කියල නෑ කියල හිතන්න යන්න එපා එතකොට මේ විඤ්ඤාණයක් කියල ගන්න තැන **දැනෙන ස්වභාවය තමයි කෙනා තැනිවන ස්වභාවය. කෙනෙක් නැහැ කියල හිතන්න ගියොත් ඒක**

**මනෝ විඥ්ඥාණයක් වෙනවා. තේරෙනවද කියන එක. ඔය හිතන හැමතැනම සිතුවිල්ලක්ම විඥ්ඥාණයක්මයි.** ඒකයි කිව්වේ මාර්ගය තුළ සවිතක්ක ස්වභාවය තුළ හිතන සිතුවිලි තියෙන්නෙ කියල. හැබැයි දැනෙන ස්වභාවය තියෙන්නෙ අවිතක්ක ස්වභාවයේ ඔය දෙක දෙකක්. තේරෙනවද කියපු එක.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්ස :** ඔය හිතන හැමතැනම තියෙන්නේ එක්කො මනෝ විඥ්ඥාණයක්. එක්කො සෝත විඥ්ඥාණයක් එක්කො කාය විඥ්ඥාණයක්. **වෙහෙස දැනුනොත් ඒක කාය විඥ්ඥාණයක් හිතුවොත් ඒක මනෝ විඥ්ඥාණයක්.** ඒ හැමතැනම අභ්‍යන්තරයට එනකොට කෙනෙක් මුකුත් නැති වෙනස්ම ස්වභාවයක් දැනෙනවා මිදුන ස්වභාවයක්, ඒක තමයි මාර්ගයට පිළිපන්නයි කියන්නෙ. එතන තමයි මාර්ගය තියෙන්නෙ. අපි කියනවනෙ 'ආසවක්‍ෂය ඥානය' කියල. ඒක තමයි එතන අහුවෙන්නෙ. ආසවක්‍ෂය ඥානයත් එක්ක තමයි ඔය කියන ස්වභාවය එන්නෙ. ඔය දෙක දෙකක්. ඒ කියන්නෙ මේක දැන් කරගෙන යනකොට ඔය කලින් වගේමත් ගින්නක් නැහැ. එහෙම දිගටම යනකොට ගානක් නැහැ. සැහැල්ලුවක් දැනෙනවා. එතන ආසවක්‍ෂය ඥානය තමයි තියෙන්නෙ. අර ගින්න නැතිවෙන එක අර ඇලෙන ගැටෙන ස්වභාවයෙන් නිදහස් වන ගතියක් දැනෙනවා. දිය වී ගෙන යනව වගේ.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :** ඒක තමයි ආසවක්‍ෂය ඥානය. ඔය මිදෙන සැහැල්ලුවක් දැනෙනවානෙ සැහැල්ලුවක් කියන්නෙ අර අවිදිමත් ගතිය. අර අපි කියන්නෙ අවදියක් එනව කියල මොහොතකට අවදිය කියන්නෙ ඒ තමයි අබ්‍යන්තර පරිවර්තනය කියන්නෙ. ඒ වෙනයි ආසවක්‍ෂය ඥානය වෙනයි. ඒකෙ අර ඇලෙන ගෑවෙන ස්වභාවය. දියවෙන ස්වභාවය තියෙන සිහිය ඒක ආසවක්‍ෂය ඥානය. හැබැයි සැහැල්ලුව ඒ සැහැල්ලු ස්වභාවය තමයි අවදිය. ඔය රේල්පීලි දෙක වගේ. හැබැයි මේ දෙකම ඒ එළියට පේන්නෙ නෑ. අභ්‍යන්තර පරිවර්තනයක් එකටමයි තියෙන්නෙ.

**'ආසවඛ්‍ය ඥානය' හඳුනගන්න අති සියුම්. ඒ වගේම තමයි අර සැහැල්ලුව අවදිය. ඒ සැහැල්ලුව තමයි ඵලය. හැම තිස්සෙම ශාන්ත ප්‍රනීත සුවය කියන්නෙ ඵලයට. බාහිරත් එක්ක කම්පනය වෙන්නෙ නැති ස්වභාවයම තමයි සෝතාපන්න ඵලය.** ඒක අත්දකින්න තමයි මේ කියල දෙන්නෙ. දැන් ගොඩක් අය දන්නෙ නැහැනෙ මොකක්ද ඵලය. කෙහොමද අත්දකින්නෙ. කොහොමද ඒක දැනෙන්නෙ. මේකට 'සුතමය ඥානය' හොඳට පිරිසිදුව තියෙන්න ඕනෙ. නැත්නම් ආත්මය තියාගෙන මේක වෙන්නෙ නෑ. ආත්මය තියාගෙන එන එක මේක නෙවෙයි එය ආත්ම දෘෂ්ටිය. මේ සෙන්සස් ටික ශබ්ද වර්ණ ඉන් එහා මේ ආත්ම කථාවක් නැති අවබෝධයත් එක්කම මේ ප්‍රායෝගිකව මගට එන්න ඕනෙ. ඔබතුමිය හරි. ඇත්තටම මේ දේශනා ගොඩක් අහල තියෙනවා කියන එක. කොච්චර කල් ඉඳල අහනවද?

**උපාසිකාව :** අවුරුද්දකට වැඩියි ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්ස :** ඔව් ඒක තමයි නැත්නම් ඒ විදිහට එහෙම කතා කරන්නෙත් නැහැනෙ. ඒ නිසා අපිටත් තේරෙනවා හොඳින් අහල තියෙන්න ඕනි කියල. **අර දැනෙන ස්වභාවයේ තමයි රහස තියෙන්නෙ. සිහියට තමයි අපි කියන්නෙ යතුර කියල. මේ මාර්ගයට පිළිපන්නයි කියල අපි කියන්නෙ.** වාහනයක වුනත් යතුරක් තියෙනවානෙ. මාර්ගයේ යන්න ස්ටාර්ට් කරන්න එපැයි. ඒක තමයි තමන්ට දැනෙන එක දිය වී ගෙන යනව කෙලෙස් ස්වභාවය 'ආසවක්‍ෂය ඥානය' අසුවෙනවා. ටිකෙන් ටික අර 'නිබ්බිදන්ති විරාගන්ති නිරෝධන්ති' කීවේ එතන ඇලීමක් නෑ හරයක් නැහැ නිබ්බිදාවනෙ. ඇලෙන ගතිය නැහැ විරාගයට යනව. මෙතන නිබ්බිදාව තිබ්බත් එකයි නැතත් එකයි අර සැහැල්ලුවක් එනව මේකත් එක්ක. හැබැයි ඔය ආසවක්‍ෂය ඥානය 'නිබ්බිදන්ති නිරෝධන්ති' ස්වභාවය එකත් එක්ක. හැබැයි ඵල ස්වභාවය ඒක අත්දකින එකක්. එතන ඒක සිතුවිල්ලක් නෙවෙයි. කවදාවත් හිතල ගන්න බැහැ. ඒක අභ්‍යන්තරයට දැනෙනවා. ඒක හිතන්න ගියොත් සිතුවිල්ලක් වෙනව. හැම එකම සිතුවිල්ලක්.

**උපාසිකාව :** ඒක වටිනාකමක් අඩු වීගෙන යනවා.

**ආර්යයන් වහන්ස :** අපි අනුසෝතය තුළ හැම එකටම වටිනාකම් දීල පුරුදු කරල වටිනාකම් බල ගැන්විලයි තියෙන්නෙ. ධර්මය තුළ වටිනාකම් නැතිවෙනව ධර්මය තුළ වටිනාකමක් එන්නෙ නැහැ. දරුවා ඇහෙන් කනෙන් කියන කොට මේක ශබ්දයයි වර්ණයි කියනකොට කොහොමද වටිනාකමක් එන්නෙ. හැබැයි ඕක එක දවසකින් වෙන්නෙ නැහැ. ටික ටික තමයි. අර වටිනාකම දීලනෙ තියෙන්නෙ. ඒක දියවෙන්න ගන්නවා. ඊට පස්සෙ හිනහ වෙනවා. සමහර විට කතත් කරනවා. දරුව දන්නෙ නැහැ, ඇතුලේ ඒ වුනාට ගින්නකුත් නෑ. ඒක තේරෙන්නෙ දරුවා අසනීප වුනත් හරි අඬන්න වැළපෙන්න මොකවත් නැහැ. පුතේ අපි යමු බේත් ගන්න කියල. එතකොට තමයි තේරෙන්නෙ ලොකු දියුණුවක් තියෙන්නව කියල දැන් මේ ධර්මය දන්නෙ නැති අම්මලා කලබල වෙනවනෙ. එහෙම දෙයක් නෑ. තේරෙනවද කියන එක. මේ දියුණුව තුළ මේ වෙනස තියෙනවා.

ගිණිගත්ත කෙනෙයි ගිනි නොගත්ත කෙනයි වෙනස අධ්‍යාත්මික වෙනසක් කියල. මේ ඔක්කොටම වැඩිය වැදගත් වෙන්නෙ මේ කතාව අවසානයේදි කෙනා නැහැ. තමන්ට තමන් අහිමි වෙනවා. තමන්වත් ඉතුරු වෙන්නෙ නැහැ. මේ හැම තැනම තමන් දියවෙනව දන්නෙම නැතුව. එය දෙයක් තියෙනව නම් මාත් ඉන්නවා. දෙයක් නැති වෙනව කියන්නෙ අගය වටිනාකම දියවෙනව කියන්නේ තුන් භූමියම දියවෙනව. කාම භූමියම රූප භූමිය, අරූප භූමිය තුන් භූමියම දියවෙනවා. තුන් භූමිය දියවෙන කොට 'ත්‍රෛලෝකනාථ' පැත්තට එන්නෙ සම්මා සම්බුද්ධත්වයට පත් වුනහම එතකොට මේ බුද්ධ ස්වභාවයට ඔබතුමිය අවදි වෙනවා. ඒ බුද්ධ ස්වභාවය මේ අවබෝධය තුළයි ඒක තමයි අවිද්‍යා අශේෂ විරාග නිරෝධො' කියන්නෙ.

**අවිද්‍යාව කියන්නෙ සත්‍ය නොදන්නකම. එතකොට විද්‍යාව කියන්නෙ ඒක තමයි 'උදපාදී' විද්‍යාව තමයි 'ප්‍රඥා උදපාදී' 'ඥාන උදපාදී' මේ ප්‍රායෝගික පැත්තයි පෙන්නුවෙ. සියලු ලෝක ජය ගන්නවා කව්ද? ඔබතුමිය? ඇයි කාම ලෝකය පිනවන ලෝකය ඔබතුමිය මිදිලනෙ.** ඔය අවබෝධය තුළ මිදෙනවා. ඊට පස්සෙ ඒක දෙයක් වගේ නම් කාම ලෝකයෙන් මිදෙනවා රූප, සංඥාවෙනුත් මිදෙනවා, ඊට පස්සෙ අරූපය

ආත්ම සංඥාවෙන් ඒකෙනුත් මිදෙනවා. තුන් භූමියම ජය ගන්නවා. තුන් ලෝකයම ඔබ තුමිය ජයගෙන සෘදියෙන් වගේ යනව ඔය ගමන. සමහර විට දාඩියත් දානවා. මේක ෆිසිකල් බොඩි එකනෙ. මේක සෙන්සස් නේ. හති තියෙනව නම් හතියත් එනවා. ඒකත් ප්‍රශ්නයක් නෙවෙයි. මේ මාර්ගය තුළ ගොඩක් දියුණු අය බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට කතා කරල තියෙනවා. මේක මේ විදියට පැහැදිලි කරන කෙනෙක් කොහේද ඉන්නෙ.

**උපාසිකාව :** අපි අරමං වෙලා හිටියේ ආර්යයන් වහන්ස. අපිට සත පහක්වත් වියදම් වන්නෙ නැතිව ගමනාන්තයට යන්න පාර විවර කළේ ඔබ වහන්සෙමයි. අපිට පිහිටට වෙන කෙනෙක් හිටියේ නෑ. දැනට වුනත් අපි හරි සතුටින් ඉන්නෙ. තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :** ඒක ඇත්තටම අපි හරි සතුටෙන් කරන්නෙ අපි දන්නවනෙ අභ්‍යන්තර පරිවර්තනයක්නෙ මේ අපිට හෙළි කරන්න තියෙන්නෙ. අපිට මිදීමක් තියෙනව. ඒ මිදීම අනිත් අයට බෙදල දෙනව නේද? ඔබත් බලන්න. පුදුම සැහැල්ලුවක් ඔබට දැනේවි. පුදුම ශාන්ත සුවයක් ඔබට දැනේවි. තව කෙනෙකු ඒ සුවය අත්දකින කොට ඔබට සතුටු නැත්ද, එහෙනම් තෙරුවන් සරණයි.

03

# මේ භවයේම නිවන් දකිමු කර්ම භූමියෙන් මිදී

**ආර්යයන් වහන්ස :** අපි දන්නවා මේ ලෝකයේ ඉන්න ජනගහනයෙන් වැඩි හරියක් දෙවියෝ ලෝකේ මැව්වා කියන එකේ තමයි ඉන්නෙ. මෙතන ඇත්තට තියෙන්නෙ විශ්වාසයක් ඇදහිල්ලක්. දෙවියෝ ලෝකෙ මැව්වා කියන සංකල්පයක් ගොඩ නැගෙනවා. ඇත්තටම මේ පරිණාමය දිහා බලනකොට ඕනෑම කෙනෙකුට පෙනෙන දෙයක් තියෙනවා ගෝත්‍රික විදිහට ඉන්නවා ඉරට වඳිනවා හඳට වඳිනවා නේද? හරි පුදුම දේවල්වලට වන්දනා කරනවා, ගස් ගල්වලට පවා වඳිනවා. ඒක ගෝත්‍රික යුගයක් පරිනාමය තුළ අපට හමුවෙනවා. මේ මිනිස් වර්ගයාගේ පරිණාමය තුළ කොහොමද මේ දිව්‍යලෝකය මැව්වය කියන සංකල්පය ගැනයි කතා කරන්නෙ. ඉතින් මේ පරිනාමය තුළ අපිට පේනවා.

මේ ගෝත්‍රික මනුෂ්‍යයාගේ පරිනාමය දිහා බලනකොට අර පැවැත්මට දැන් අපි හිතමු සතෙක් ගත්තොත්, උකුස්සෙක් වගේ සතෙක් ඩැහැ ගන්නවා අර හා පැටියෙක් වගේ පොඩි සතෙක් ගුහාවට රිංගනවා. එතකොට ඒ සතා රැකෙනවා. මේ විදිහටම තමා අපේ ගෝත්‍රික සමාජය තුළට පවා අනික් අයටත් යමක් දීගෙන උපකාර කරගෙන, එකමුතුව ඉන්නකොට රැකෙනවා එහෙම නැති වුනොත් විනාශ වෙනවා. එතකොට සත්ව වර්ගයාගෙත් තියෙනවා මේක. දැන් අපි මී හරක් රැළක් ගත්තත් වඳුරෝ රැළක් ගත්තත් ඒ එකට ඉන්න කට්ටිය රැකෙනවා. හැබැයි ඒකෙ අනික් අය විනාශ වෙනවා. එකට අනික් අයටත් ආහාර සපයමින් අර එකමුතුව බෙදා හදා ගනිමින් යාවජීව කටයුතු කරනකොට රැකෙනවා. නැත්නම් විනාශ වෙනවා. මේක ගෝත්‍රික පරිනාමය තුළත් අපට පේනවා.

මේ විදිහට අපිට පේනවා හොඳ කරන පිරිසක් ඒ වගේම අනෙක් අයත් විනාශ කරගෙන කටයුතු කරන කොටසකුත්. එතකොට විනාශ කරගෙන කටයුතු කරන කොටස ඇත්තටම විනාශ වෙනවා. අර එකමුතුකම රැකෙන අනෙක් අයටත් දීල එහෙම කටයුතු කරන කොට ඒ කට්ටිය රැකෙනවා. **මේක පරිනාමය තුළ අපිට පේනවා. හොඳ නරක අන්ත දෙකක් එනවා කියලා. එතකොට හොඳ අන්තය කියන එක අර පැවැත්ම තමයි ඒ කියන්නෙ 'ඉත්ථභාවයක්' තියෙනවා. සතාට පවා ඉන්නවා වගේ දැනෙනවා. සතා පවා මරබියෙන් ඉන්නවා. ඒ නිසා අර ඉන්න බව රැකගන්න උත්සාහ කරනවා. ඉත්ථ භාවය ඉන්නවා වගේ දැනෙන ගතිය නිසා පණුවෙක් උනත් හානි වෙනවට යනවා පස්සටට රිංගගෙන**. එතකොට රැකෙන්න තමයි පණුවත් බලන්නෙ.

ඒකම තියෙනවා මේ මනුෂ්‍ය වර්ගයාගේත්. ඒක අර පරිනාමය තුළින් අපිට පේනවා. මේ හානියක් වෙන එක හානියක් නොවෙන එක රැකගන්න යන එක අනෙක් අයත් කරනවා නම් ඒක හොඳ පැත්තකට එනවා. හැම තිස්සෙම මේ 'ඉත්ථ භාවයත්' තිබුනට ඒක නැතිවෙන ස්වභාවයත් තියෙනවා පවතින්නෙ නැහැ. ඒක නිසා පැවැත්ම තමයි මේ හැම විටම සොබාදහමේ ම නිර්නායකයක් වෙලා තියෙනවා පැවැත්ම කියන එක. ඒ නිසා මේ සොබාදහමේ පැවැත්ම තමයි යහපත් විදිහට ගන්නෙ. ඉත්ථ භාවය කියන එක ඒ කියන්නෙ පැවැත්ම කියන එක. ඒක තමයි අපි මේ කතා කරන්නෙ.

මෙතන දී අපිට පේනවා පරිනාමය තුළම අර රැකෙන්න තියෙන එක අර රැකෙන එක ඉත්ථ භාවය කියන එක. එතනම තමයි අපි හොඳ කියන අන්තයට එන්නෙ. හැමදේම නැතිවෙන විනාශ වෙන ස්වභාවයක් තියෙනවා. ඒක මේ සතා සිවුපාවටත් දැනෙනවා. ඒක නිසා තමයි ඔතන 'භීතිය' තියෙන්නෙ. ඒ භීතිය නිසා තමයි ඒ සතා වුනත් රැකෙන තැනක තමයි ඉන්නෙ. ආරක්ෂාව තියෙන ස්වභාවයට අනුව තමයි කටයුතු කරන්නෙ. ආරක්ෂාව තියෙන පරිසරයක තමයි ඉන්නෙ. ආරකෂාව නැති තැන විනාශ වෙනවා. මේ ස්වභාවයම මතුවෙලා එනවා අනෙක් අයට උදවු උපකාර කරන ඒ ස්වභාවය පරිනාමය තුළත් එනවා. එකට ඉන්න එක. සමහර විට ගොදුරක් හම්බ වුනාම පරිනාමය අපි දන්නවා මේ

දඩයම් කරන යුගයක්. දඩයමක් හම්බ වුනාම ඒක ගෙනිහින් තමන්ගෙ රැලේ අයත් එක්ක බෙදා හදාගෙන කටයුතු කරන එක. එතකොට ඒ අයත් රැකෙනවා මෙන්න මේ ස්වභාවය. ඒ කියන්නෙ හොඳ කියන ස්වභාවය ඒකෙ අනිත් පැත්ත නරක කියන ස්වභාවයකුත් තමයි.

එතකොට මෙන්න මේ හොඳ කියන ස්වභාවයේ තමයි පැවැත්ම කියන ස්වභාවය තියෙන්නෙ. දැන් හැම ගෙදරකම වුනත් පැවැත්මට මොනව හරි, තමන්ගෙ පැවැත්මට හැම දේම වෙනව නම් හොඳ කියන අන්තයට එනවා. මුදල් ලැබෙනව නම්, ආහාර ලැබෙනවා නම් භවභෝග ලැබෙනව නම් හොඳ කියන අන්තයට එනවා. එහෙම දෙනව නම් එයා හොඳයි කියනවා. ඒ ස්වභාවයට එනවා. ඒ ස්වභාවය තුළින් මතුවෙනවා අර හොඳ නරක කියන ස්වභාව, දෙකේම අර 'දේව' ස්වභාවය හා 'නිරය' කියන ස්වභාවය. ඒ ස්වභාවය සංකල්පයක් ඇතුලෙන්ම ගොඩනැගෙන එකක්. ඒකෙන්ම ඊට පස්සෙ ඒ ස්වභාවයෙන්ම තමයි මේ අපි අන්ත දෙකක් හදාගෙන අපි මේ හොඳ තැනක කියන ස්වභාවය. ආයි නරක දෙයක් කළොත් නරක තැනක් කියන ස්වභාවය. ඒ අනුව හොඳ තැනක යන ස්වභාවය දිව්‍ය ලෝකය කියන ස්වභාවය. නරක තැනක නම් අන්න නිරය කියන ස්වභාවය. අන්න අපි හොඳ දෙයක් කළොත් හොඳ තැනක උපදිනවා කියලා. නරක දෙයක් කළොත් නරක තැනක උපදෙනවා කියාලා ඒ ඒක ඇතුළෙන්ම එන චිත්ත ස්වභාවය කලින්ම එන සංකල්ප තුළින්ම ගොඩනැගෙනවා. අපි ඊට පස්සෙ තැන තියෙන්නේ හොඳ දේ කරන්න. දෙයියො කියල හදාගෙන තියෙනවා ඊට පස්සෙ හැම කෙනෙක්ම මේ ලෝක ජනගහනයෙන් විශාල පිරිසක් දිව්‍යලෝකෙ යන්න තමයි ඊට පස්සේ හිතාගෙන ඉන්නෙ ඒක විශ්වාසයක් ඇදහිල්ලක්.

සමාජ සුබ සාදනය සඳහා කරන දේශනා එවැනි දේශනා මේ ආගමක් තුළ තියෙනවා. මරණයෙන් මතු යන එක ගැන ඒක ආගමක් තමයි. එතකොට ආගම් නිර්මාණය වෙනවා. ඇයි සතාට ආගම් නැත්තෙ. සතාට ඒ තරම් තියුණු මනසක් නැහැ. දැන් මෙතන මනස දියුණු නිසා ආගම් කියන ඒවා නිර්මාණය වෙනවා සංකල්ප විදියට එතකොට ආගමේම තියෙනවා, මේ දේව සංකල්ප හොඳ තැනකට යනවා කියන එක. හොඳ

අය ඉන්නවා කියන එක. එහෙම කවුරුත් දන්නෙ නැහැ. මාරුණට පස්සෙ කවුරුත් නැති නිසා නමුත් සිතුවිලිවල ඉන්නවා හදාගෙන" චිත්ත ලෝකවල ඊට පස්සෙ තමයි දානෙ දෙන්නෙ, පින් කරන්නෙ හොඳ තැනක යන්න හිතාගෙන. සංකල්පවලින් මේක නිර්මාණය වෙනවා. ඒ විදිහටම නරක දෙයක් කළොත් නරක තැනකට යනවා.

මේක ගෝත්‍රික සමාජයේ පරිනාමයත් එක්කම එන එකක්. මේ ආකල්ප, සංකල්ප, ආගමනය ඒ කියන්නේ මරණින් මත්තේ න 'ආග මන' ඒක ආගම. ඉතින් මේ ජන සමාජයට මේක පැවැත්මටයි මේක තියෙන්නෙ. ඇයි මේ ආගමට ඊට පස්සේ ඒ අය වැරදි කරන්නෙ නැහැ. දෙයියෝ බලාගෙන ඉන්නව කියල බයයි. ඔබ දන්නවා හින්දු අය කන්දෙක දෙපැත්තෙන් හිල් කරල ඔය කොන්නේස්වරම් මුන්නේශ්වරම්වල එහෙම ගණ දෙවියෝ, අයියනායක දෙවියො, කන්දසාමි මේ විධියට විවිධාකාර නම් වලින් ඔවුන් කන්දෙක අල්ලගෙන උඩ පනිනවා. වැරදි කළහම දෙවියො ඉස්සරහට ගිහිල්ල ඒ ගොල්ලො පිළිම ඉස්සරහ ඒක කරනවා. කතරගම දේවාලෙට ගිහිල්ල ඒ ගොල්ලො පිළිම ඉස්සරහ මේක කරනවා. අපි දන්නවා කතරගම දේවාලෙ මේ දේවල් කරගෙන ගිණි පාගන්නෙ ඇයි. මේ විදිහට මෙහෙම කරන්නෙ මේ පව් ගෙවන්න හදන්නේ මේක ඉන්දියාවෙන් පව් ගෙවන සංකල්පය ආවා. ඔය හැම එකම කරන්නේ ඕකට. ඒක ගෝත්‍රික ජන සමාජයේ කේන්ද්‍රමූලික වෙලා තියෙන්නෙ. දැන් දියුණු මනස මේක මුළු ලෝකයෙම අදත් තියෙන්නෙ ඒකනෙ. මේක ප්‍රඥාවන්තං ඎදයධම්මං දුක්පඎද්ඎදස්ස' මේ පව් ගෙවන්න හදන්නෙ. මේකද දුකින් මිදෙන මග.

නමුත් බුද්ධ ධර්මය එහෙම එකක් නෙවෙයි මේ නිගන්ධනාඨපුත්ත සියල්ල කර්මයෙන් ගෙවල ඉවර කරනවා. බුදුන් වහන්සේ ඒක ප්‍රතික්ෂේප කළා. ඔබත් ඉන්නෙ කොතනද? මේ දේවල් හොඳින් මෙනෙහි කරල බලන්න. **ඉරට හඳට වඳින එකත් නොපෙනෙන දෙවියන් වඳින එකත් සියල්ලම බුදුන් වහන්සේ ප්‍රතිෂේප කළ** ඒ ඔබගේ සංකල්ප විශ්වාස ඇදහිලි ආගම සංස්කෘය සදාචාරය මේ සියල්ල හොඳයි. අර අපි කිවුවෙ ඒක තමයි වෙසක්කාඩ් එකක් තොරණත් හැමදේම හොඳයි. ඔබ ඉන්නේ කොතනද හොඳ දේ හොඳයි ඒත් ලෝකෙ සත්‍යයක් තියෙනවා.

ඔබ ඒ සත්‍යය අවබෝධ කළ යුතුයි. **ඔබ ඒ සත්‍යය ඇසිය යුතුයි. ඒ සත්‍යය සොයා යා යුතුයි. ඔබ ඒ සත්‍යය දැනගත යුතුයි**.

මොකද ඔබ මේ සතෙක් සිවුපාවෙක් නෙවෙයි ඔබ මනුෂයෙක්. ඔබට යමක් තේරෙනවා සතුන්ට නොතේරුනාට මනුෂ්‍යයාට තේරෙනවා. මනුෂ්‍යයා කියන්නෙ මනස උසස් නිසා. එහෙනම් ඔබ තාම ඉන්නෙ එතන. නැත්නම් ඔබ මේ සත්‍යය දකින්න උත්සාහ කරනවා. බලන්න, කොච්චර නම් නිර්මල දහමක් ලෝකයට විවර වෙනවද කියල. මේක අති සුන්දර දහමක්. **අපි කතා කරනවා ඇස කණ නාසය දිව කය මන, ඔබ ලෝකය හදා ගන්නේ ඇසෙන් කණෙන් නහයෙන් දිවෙන් කයෙන් මනෙන්. ඔබේ ඒ ලෝකය කොහෙන්ද හැදුනෙ. ඔබේ ලෝකයේ මොනවද තියෙන්නෙ. ඔබට යමක් මෙනෙහි කළොත් වැටහෙනවා. ඔබ ඉපදුන තැනට යන්න. පුංචි දරුවට යන්න. ඒ තොටිල්ලෙ ඉන්න ලේ කැටි දරුවාට ළඟට යන්න.** ඒ ඔබයි කියල හිතන්න.

ඔබ ඉපදෙන කොට මොනවත් දන්නෙ නැහැ. ඊට පස්සෙ සිද්ධවෙන දේ බලන්න. ඔබ ඉන්නෙ ජපානයේ 'චාං චීං චූං ජපන් භාෂාව අපි දන්නෙ නැහැ. ඔබ ඉන්නෙ ඇමරිකාවෙද. බටහර රටකද. ඉංග්‍රිසි භාෂාව කතා කරන ඔබ ඉන්නෙ ආසියාවේද ඔබ ඉන්නේ ඉන්දියාවෙද? ඔබ ඉන්නේ චීනයෙද, ඔබ ඉන්නෙ අරාබියෙද ඒ ඒ ශබ්ද විලාශ ඒ ඒ පරිසර සාධකත් එක්ක ගොඩනැගිල තියෙන්නෙ. ශීත රටවල 'ස්රොස්' ගාල කථා කරන්නෙ. සීතල ගොඩක් නිසා සෙන්සියස් අංශක හිම මිදෙන පැත්තට යනකොට මේ උගුරෙන් මේවායේ උච්චරණය වෙන්නෙ නෑ 'ත්රස්' 'ත්රස්' ගාලා ශබ්ද වෙනස් වෙනවා. එතකොට භාෂාව වෙනස් වෙනවා. කටහඬ වෙනස් වෙනවා. ශබ්දය වෙනස් වෙනවා. ඒ ශබ්දයක් විතරයි.

ඒ කණට ඇහෙන ශබ්දය ඒ ස්වාරාලයෙන් පිටවෙන ශබ්දය විසිල් එක වගේ. **ඇහැට පේන හැඩතල වර්ණ මේ ලෝකය හැදුනේ ඔබේ ඇස නිසා ශබ්ද ලෝකය හැදුනෙ කණ නිසා, ඔය නාසයට මැවෙන ගන්ධ ලෝකය, දිවට මැවෙන රස ලෝකය, කයට දැනෙන උණුසුම සීතල තද ගතිය. මේවා දැනෙන්නෙ නැත්නම් ඔබ කොහෙද ඉන්නෙ. ඔබේ සෙන්සස් ටික නැත්නම් ඔබට ලෝකයක් තියෙනවද. ඇසෙන් කනෙන් දිවෙන් කයෙන්**

**මැවෙන ලෝකය 'මනෝ ලෝකය' ඒව කොහොමත් තියෙනව නොවෙයි**. ඒ නිසාම මැවෙන ආරෝපණය කොහෙවත් තියෙනවා නොවෙයි. මෙතන තියෙන්නෙ අපට එන කරන්ට් එක මේ ගින්න. 'ද්වේශය' ආශාව, තන්හාව, වෛරය එතන ගින්නක් තියෙනවා. මෙන්න මේ ගින්න නිවෙන හැටි බුදුන් වහන්සේ ලොවට හෙළි කරන්නෙ. එහෙනම් මේ ගින්න හැදෙන හැටි දැක්කොත් තමයි මේ ගින්න නිවෙන්නෙ.

ඔබට මරණයක් තියෙනවා. ඔබට ඉපදීමක් තියෙනවා. ඔබ මරණය කිවුවේ කුමකටද. අර පුංචි දරුවාගෙ තැනට ගිහිං බලමු අපිට කොහොමද මේව හම්බවුනේ කියල. මේක අපි හැම තිස්සෙම කියනවා. මෙතන තමයි මහ නිධානය තියෙන්නෙ. 'නාමරූප පච්චයා විඤ්ඤාණං' මෙනනයි 'මහා නිධානය' තියෙන්නෙ. මොකද්ද මේ නිධානය, මේ නිධානය තමයි මෙතන තියෙන 'ආත්ම සංඥාව' අපිට ආත්මයක් තියෙනවා. අපි ඉන්නවා වගේ දැනෙනවා. දැන් අපි බලන්න ඕනෙ අපි ඉන්නවා වගේ දැනෙන්නෙ කාටද. කොහොමද මේ ඉරිසියාව එන්නෙ. කොහොමද මේ වෛරය එන්නෙ. කොහොමද මේ තණ්හාව එන්නෙ. කොහොමද මේ ආශාව එන්නෙ. ඇයි අපි අඬන්නෙ. ඇයි අපි හිනාවෙන්නෙ. ඇයි අපි දුක් විඳින්නෙ ඇයි අපි සැප විඳින්නෙ මේව සේරම සංකල්ප. සංඛාර 'චිත්ත ස්වභාවය' කියල දැනෙනවා.

මේක ලොකු මායාවක්. හරියට මේ මායාව පැහැදිලි කරනවා නම් මේ ඇස කියන්නෙ කිරණයට ස්පාර්ක් වන වේගයෙන් සකස්වන ආලෝක හැඩතලය දෙයක වගේ දැනෙන ගතිය එතනින් තමයි පටන් ගන්නෙ. ඇසේ උපතයි මහණෙනි උපත කියන තැනින් 'සලායතන ලෝකෝ ලෝකෝ' කියන තැනින්. කිසි කෙනෙකුට මේ බුද්ධ වචනයෙන් එහාට යන්න බැහැ. ඔබ මොනව හොයන්න ගියත් වැඩක් වෙන්නෙ නැහැ. මේ **'රූපය කියන්නෙ 'රුප්පනයටයි' රූපේ 'පර්ජානාති' මොකද්ද මේ අපි අවබෝධ කරන්නෙ. අපි මේ අවබෝධ කරන්නෙ අපි හැදෙන හැටිමයි. අපි කොහෙන්ද ආවෙ කියන එකමයි. 'පාතිභාවය' වුනේ කොහේද 'ස්ඛන්ධානානං පාතිභවෝ - ආයතනානං පටිලාභෝ - අයං වුච්චති ජාති' කියන කතාවයි මේ විසදෙන්නෙ. 'ජාති ධම්ම' සූත්‍රයේ ගෙනෙන කතාවයි මේ විසදෙන්නෙ.**

ගෙදර ඉන්න දරුවා හිනාවෙලා සතුටින් ඉන්නවා. අම්මලා තාත්තලා කන්න දෙනවා. සතා සිවුපාවත් මේ දේ කරනවා. සතා සිවුපාවා දරුවෝ හදන්නෙ නැත්ද. සතා සිවුපාවට ගෙයක් නැත්ද. ඒවා හදන්න කවුරු හරි ඉගැන්නුවද. මේ බට්ටිච්චෙක්ගෙන් මේ පොල්කිච්චෙක්ගෙන් මේ ලේනෙක්ගෙන් ඇයි ඒ ගොල්ලන්ටත් ලෝකයක් තියෙනවානෙ. ඇයි දරුවො ඉන්නවනෙ. ඒගොල්ලන්ටත් ගෙවල් තියෙනවා ඒ ගොල්ලොත් මැරෙනවා, ඔබත් ඉන්නෙ එතනද ඒ සොබාදහම නේද? නෑ මම තමයි මේක කරන්නෙ. මම තමයි මේව ඔක්කොම කරන්නෙ. කුරුල්ලෝ කුරුලු පැටියට පියාඹන්න උගන්වනවා පිහාටු ටික හැදුනට පස්සෙ කුරුලු අම්මා කූඩුවෙන් එළියට තල්ලු කරනවා. ඔබ දැකල තියෙනවාද? උගන්නන්න ඕනෙද පියාඹන්න, පිහාටු ලැබුනම මරබිය එනකොට අත්තටු නිකම්ම ගැහෙනවා. **මාලුවට පීනන්න උගන්වන්න ඕනෙද මේ කතාවෙ මොකද්ද තියෙන්නෙ. මාලුවට දරුවෝ හදන්න උගන්න ඕනෙද? කුරුල්ලන්ට පැටවු හදන්න උගන්වන්න ඕනෙද. මේක සොබා දහමක් මේක නේචර් එකක්.**

**ඔබ දැක්කොත් මූලික තැන මූලය දැක්කොත් ඔබ කරන දෙයක් නැහැ. සියල්ල සිද්ධ වෙනවා. ඔබ බලන් ඉන්නවා වගේ දෙයක් මෙතන වෙන්නෙ. ඔබ ඒ සොබාදහම මමය කියලා කියාගන්න එකක් වෙනවා ඔබ මාව එකතු කරනවා හැම තැනටම. ඔබ ඒක මගේ කරගෙන දුක් විඳිනවා. ඔබ හදාගන්නවා ලෝකයක් ඒක 'චිත්ත ලෝකයක්' ඔබ මේක සොබාදහම කියා දකින්නෙ නැහැ. මම ඉන්නේ. මම තමයි දන්නෙ. මම තමයි කරන්නෙ. මමයි දැන් ඔක්කොම දැන් මමය ඉන්නෙ. ඔබ විඳවන්නෙ අන්න ඒ සිතුවිල්ලයි.** ඒ සිතුවිල්ල කොහොමද හැදෙන්නෙ. අන්න 'හිතෙන් මිදෙන මග' 'දුකෙන් මිදෙන මඟ 'නිවන් දකින මඟ අර 'නිස්සරණ මගක්' අපි හඳුන ගන්නවා.

හිත හැදෙන හැටි දැක්කොත් ඔබේ හිතයි ඔබට මේ දරුව අසනීපෙන් මේ දරුව සතුටෙන්. ඔබේ හිත කියනවා. ඔබේ හිතේ බලාපොරොත්තු ඉටු නොවෙන කොට දුක එනවා. හිතින්ම හදාගත් ගින්නක ඔබ අතරමං වෙනවා. ඒ ගින්න ඔබට විශාල දුකක් දෙනවා ඒක සිතුවිලි ගින්නක්. මේ ඔබ ඉන්නවා කියන ගින්න තමයි ලොකුම ගින්න. ඔබ හැදෙන හැටි

දකින්න ඕනෙ එතකොට තමයි ඔබට දැනෙන්නෙ මේක ලොකු මායාවක් කියල. ඔබ කියල කෙනෙක් නැති බව මරණය කියල දෙයක් නැති බව. මේක හරි පුදුම කතාවක්. මේක හැමදාම අපි කියල තියෙනවා මේ කතාව මරණයක් නැති බව. මොකද්ද මරණය කියන්නෙ කියල. මේක හරි සුන්දර කතාවක්. මේක භාගෙට දැනගෙන බැහැ. මේක හරියටම දැනගන්න ඕනෙ.

ඇහැට එන කිරණය. අර හිරු එළිය 'ප්‍රිස්මයක් ඇල්ලුවාම වර්ණ හතක් මැවෙනවා වගේ 'ත්‍රිකෝණය වගේ පිරමිඩය' වගේ 'ප්‍රිස්මය' හිරු එළියට අල්ලලා බලන්න. වර්ණ හතක් මැවෙනවා. බලන් ඉන්න ටිකක්. මේ විදිහටම තමයි නාභිගතවෙන්නෙ. අක්ෂි කාචය තුළ නාභි ගතවෙන විදිහට යෂ්ටි සෙල කේතු සෙල ඇස්වල හැදෙන නිර්මාණය. ඔය කියන වර්ණ ලෝකය නැහැ සොබාදහමක් තියෙන්නෙ. කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි. ඒ හැඩතලය කණට ඇහෙන ශබ්දය කර්ණසංඛ පටලය හෙල්ලෙන එක. වයිබ්‍රේට් වෙන එක. 'ටිරිලි ගාල ඒක තමයි ශබ්ද. එක එක රටවල්වල දාන ශබ්දවලට අපි භාෂාව කියන්නෙ. හැබැයි 'ටාසන්' වගේ කැලේ හිටියත් නරි 'හූ' කියන ශබ්ද හරි මොකක් හරි කණට එනවනෙ. සත්තු කෑ ගහන එක හරි. ඔබ 'ටාසන්' බලල තියෙනවනෙ. ඒකෙ සතෙක් වගේ කෑ ගහන එකනෙ 'ටාසන්' කරන්නෙ. ඒ කියන්නෙ ශබ්දයට අර හැඩතලය ගැට ගහනවා. මෙතන තියෙන්නෙ කම්පනයක්. අංශු කම්පනයක්. මෙතන තියෙන්නෙ කම්පන සිස්ටම් එකක්.

ආලෝකය කියන්නෙ, අපි දන්නවා වර්ණ කියන්නෙ, රතුපාට කියන්නෙ තරංගයාම වැඩි එකක්. තරංගායාම කියන්නෙ අංශු කම්පනයක්. කොහෙවත් තියෙන එකක්වත් එහෙම එකක් නොවෙයි. අංශුවක් කම්පනය වෙන එකක්. මේක නිකං උපකල්පනයකට ගන්න කම්පනයක් කියල. ඒ කම්පන වේගෙට තමයි වර්ණ මැවෙන්නෙ. ඒ ගම්පන වේගයට තමයි ශබ්ද මැවෙන්නෙ. අපි කියනවා ඔය 'හර්ට්ස්' 20යි 20,000, තරංගවාමවලින් කියනවා නම් ඒ කොන්ටම් න්‍යාය කියන්නෙ මහලොකු දේවල් නෙවෙයි. මේ එක අංශුවක් කම්පනය වන එකයි කොන්ටම් කියන්නෙ. අංශු කම්පන පැකට් කියල කියන්නෙ. නමුත්

මෙතන අංශු කොහෙවත් යනව නෙවෙයි. කම්පනය වෙනවා. එතන එතන අංශු කම්පනය වෙනවා.

මේක හරි සියුම් ඔබේ ඉන්ද්‍රිය ගෝචර නොවන නිසා ඔබට මේක දකින්න වෙන්නෙ නුවණින්. එහෙම නැත්නම් අර විද්‍යාඥයෝ වගේ ටෙලස්කෝප්වලින්. මේක පොඩි කරල අර න්‍යෂ්ටිය බලන විදිහට ශෛල විභේදන කරල මේක බලන්න ක්‍රමයක් තියෙනවා. භෞතිකවත් එක්තරා මට්ටමකට පේනවා මේ කතාව. ඒක දකිනකොට නුවණට අසුවෙනවා මොකද්ද මේ වෙන්නෙ කියල. නැත්නම් ඔබ හිතනවද කවදාවත් ටී.වී. එකක් හදන්න පුළුවන් කියල. ඔබ හිතනවද මේ දුරකථනය කොහෙවත් මොනවත් වයර් ගැටගහල නෑ. කොහෙන්ද මේකට එන්නෙ. නුවණින් ගන්නෙ මේක. සිස්ටම් එක හදාගන්නෙ මෙන්න මේක. 'ධම්ම චක්‍ඛුක්‍ෂයට' මේ කතාව අසුවෙනවාය කියන්නෙ. කම්පන 'සිස්ටම්' එක.

ඒ කියන්නෙ මේකෙ බල තුලනයක් තියෙනවා. ඒකයි අන්තරයක් කම්පනයක් කියන්නෙ. 'යෝ උභෝ අන්තෙ' කිවුවෙ ඒකයි. යො උභෝ අන්තෙ විදිත්වාන මේ කතාව කම්පන වේගයක් මේක අපි පෙන්වන්නෙ ඔබට බිග්බෑන් තියරි එකෙන්ම තමයි මේ කම්පන වේගයට මේක සකස් වෙන්නෙ කියල. සමහර අය හිතුව ආර්යයන් වහන්සෙ බිග්බෑන් තියරි එක ගැන කියන කොට මේක පරමාණුවක පිපිරීමක්. පිපිරීම නිසා වේගයක් පෘථිවියක් කියල අදටත් පෘථිවිය පැයට කි.මී. 187ක වේගයෙන් කැරකැවෙනව කියල. මේ භ්‍රමනය වන වේගයට ගුරුත්වාකර්ෂණ බලය හැදෙනව කියලා. උත්තරධ්‍රැවය, දක්ෂිණ ධ්‍රැවය නොගැලපෙන අන්ත දෙයක් හැදිල ඒ අන්ත දෙක අතර බලයක් වෙලා ඊට පස්සෙ අභ්‍යාවකාශයෙන් වෙන්නෙ 'ඕසෝන්' ස්ථරය කියන එක හැදෙන්නෙ මේ ස්වභාවය තුළ අර බ්‍රහස්පතී ග්‍රහයා වගේ. අර එකම අංශු ස්වභාවය වගේ මේ ග්ලැක්සියට කියල.

මේ තුලනාත්මක ස්වභාවය එකම ස්වභාවය. සාමාන්‍යයෙන් විද්‍යාඥයෝ පැහැදිලි කරන උපමාත් අරගෙන බ්‍රහස්පති ග්‍රහයා කියන්නේ වායුමය අවස්ථාවක්. අංශුමය අවස්ථාවක්. ඒක තමයි කැරකෙන අවස්ථාවට අයිත් අර කැරකෙන වේගයට ෆෑන් එක කැරකෙනකොට වේගයට මේතන පෘථිවි පෘෂ්ඨ ඝනීභනය වීමක්. අංශු ඝනීභවනය වීමක්.

ඒ තුළ තමයි පෘෂ්ඨය පෙන්වන්නෙ ඒ පෘථිවියේ පෘෂ්ඨය හැදෙන හැටි. ඊට පස්සෙ කැරකෙන වේගයට බල අන්තරය නිසා පෘථිවි ස්වභාවයක් හැදෙනවා. අර විශ්ව ස්වභාවය වෙනයි. පෘථිවි ස්වභාවය වෙනයි. ඒ ස්වභාවය තුළ තියෙනවා ගුරුත්වාකර්ෂණ බලයක් අර ගලක් උඩ දැම්මොත් උඩ යන්නෙ නැහැ. බිමට වැටෙනවා. අභ්‍යාවකාශයට දැම්මොත් යනවා. ආකර්ශණ බලයට අහුවෙනව මේ බල අන්තරය ඇතුළෙ අපි හිරවෙලා ඉන්නවා.

අපි කියල කෙනෙක් මේකෙ නෑ නමුත් 'සිස්ටම්' එක ප්‍රොසෙස් එක මේ කම්පන වේගය මොකක්ද කියන එක අපිට පේන හැම එකකම කම්පනය වෙන එක විතරයි මේ ඉන්ද්‍රිය ගෝචර වෙන්නෙ. ඇසට අහුවෙන්නෙ වර්ණ කම්පනයක්. කනට අසුවෙන්නෙ ශබ්ද කම්පනයක්. අපිට ඉන්ද්‍රිය ගෝචර කම්පන කෙලෙස් ස්වභාවයකින් වගේ දැනෙන්නෙ ටෙලස්කෝප් එකෙන්. අපි ඈත බැලුවත් බලන්නෙ අපේ විඤ්ඤාණයෙන්මයි එළියෙ නෙවෙයි. ඒකට අහුවෙන එකමයි මේ කියන්නෙ. මේකෙන් අපි ගත්තෙ රූප ඇදලා. කවදාවත් අපි විඤ්ඤාණයෙන් එහා දෙයක් අරගෙන නැහැ ගන්නත් බැහැ. මොකද සෙන්සස් නැහැ සෙන්සස්වලින් තමයි ගන්නෙ. සෙන්සස්වලට තමයි මේක ස්පාර්ක් වෙන්නෙ. මේකෙ ගත්තෙ උපමාවක් ආරෝපනය බලය හැදෙන හැටි පෙන්වන්නෙ. හැබැයි මේකෙ විඤ්ඤාණය නමැති ආරෝපණ බලය චිත්තාරෝපණ බලය හැදෙන හැටි පෙන්වන්නයි ගුරුත්වාකර්ෂණ බලය හැදෙන හැටි පෙන්වන්නෙ. අර විද්‍යුත් ආරෝපණ බලය හැදෙන හැටි පෙන්වන්නෙ.

මේක අභිඤ්ඤා දේශනාවලින් දීර්ඝව පැහැදිලි කරනවා ඒ ඔබ දන්නවා 187ක වේගෙන් පෘථිවිය භ්‍රමනය වෙනවා. ඇයි සූර්යයා වටේ යන්නෙ. ඇයි හැම තැනම යන්න පුළුවන්නෙ. ඒකෙ තියෙනවා බලයක්. ඒකයි මුලු විශ්වයම ප්‍රසාරණය වන වේගයට හසු වෙලා තියෙනවා. වේගයක් මත කම්පනය වීමක් මේ තියෙන්නෙ. අපි මේ ඝනය කියල කියන්නෙ වේගයට. හසු වෙවී ඝනීභවනය වීමක්. ඒක නිසාම සකස් වෙන්නෙ රශ්මිය. මේ ඔක්කොම එකයි. තාපය ගත්තත් රශ්මිය ගත්තත් උණුසුම ගත්තත් තද ගතිය ගත්තත් වර්ණය, ශබ්දය ගත්තත් එක කම්පන ස්වභාවයක්. මේ එකිනෙක වෙන් කරන්න බැහැ. නමුත් අපේ

ඉන්ද්‍රිය ස්වභාවය මේ එක එක වෙනස්ම දකිනවා. ශබ්දය ඒ විදිහට වර්ණය ඒ විදියට ගන්ධය ඒ විදිහට රසය ඒ විදිහට සෙන්සස්වල ස්පාර්ක් වීම හරියට සිරස අල්ලනවා වගේ සර්කිට් එකේ. මේ ස්පාර්ක් වන සෙන්සස්වලට උණුසුම සීතල තද ගතිය අන්න ඒ විදිහටම ස්පාර්ක් වන ගුලියක්. මේක නිසා හැදෙන ආරෝපන බලයක්.

මේ චිත්තාරෝපණය ගැනයි මේ කතා කරන්නෙ. හැදෙන හැටි ගැනයි. ඔබ දන්නවා වික්ටෝරියා ඩෑස් එකේ ලොකු චුම්භකයක් වතුර දාලා කැරකෙනවා. චුම්භකයක තියෙනවා ධනයි ඍණයි අන්ත දෙක තමයි කැරකෙන වේගයට ආරෝපණයට ලක්වෙලා 33000ක් විදිහට 11000ක් විදිහට කඩල ඊට පස්සෙ ගෙදරට එන්නේ 230 රතුපාට නිල්පාට වයර් දෙක ඔබේ ගෙදර තියෙන ප්ලග් එක. ඕකෙන් තමයි ඔබ ගෙදර ලයිට් එක දමන්නෙ. ඕකෙන් තමයි ෆෑන් එක දමන්නෙ. ඕකෙන් තමයි ඒසී හදන්නෙ සීතල හදනව, සුළඟ හදනවා ගින්දර හදනවා. මොනවද ඔබ හදන්නෙ නැත්තෙ. ආරෝපණ බලයකින් චටස් ගාල ඒ ස්පාර්ක් වන ෂෝට් එක තමයි බලය ඔක්කොම හදන්නෙ.

ඔබ දන්නවද මේ සිස්ටම් එකම තමයි ඔබගේ ඇසේ කනේ නාසයේ දිවේ සිද්ධ වෙනවා. ඒක කරන්ට් එකක් උපදිනවා. වික්ටෝරියා ඩෑම් එක වගේම. මේ ගුරුත්වාකර්ශන බලයටත් ඒ වගේම බලය අන්තරයකින් උපදින එකක් අඩයි ඔබ ඔය අභ්‍යාවකාශයෙන් වෙන්වෙලා ඔය සිස්ටම් එක හැදිල තියෙන්නෙ. ඒක තුළයි පදාර්ථය හැදෙන්නෙ. ඒක තුළයි ඝනීභවනය වෙලා ඔය ජලය හැදෙන්නෙ උණුසුම සීතල ඔය ෆ්‍රිජ් එකේ අයිස් මිදෙනවා වගේ ඒවා ඝනීභවනය වෙලා. ඊට පස්සෙ ජලය හැදිල තියෙන්නෙ. ඒවා ජලාශවලට ගිහිල්ල තමයි ඒක ශෛලික බහු ශෛලික ජීවින් හැදිල තියෙන්නෙ. එහෙම දෙයක් නැහැ මෙතන තියෙන්නෙ කම්පන ස්වභාවයක් පමණයි.

ඔබ කොස් ගහක් ගත්තොත් අඩි 50ක් 60ක් උසයි. කෑලි කෑලිවලට කපන්න. ගිණිකූරක් ගහන්න. කොහෙටද ගියේ සූර්යාගේ රශ්මිය වැඩිවෙලා පෘථිවිය අලුවෙලා නැති වුණාම කොහොමද ගියෙ. එතැන තියෙන්නෙ කම්පන අන්තරයක්. මේ අපට පේන්නෙ නැති කතාවක් මේ තියෙන්නෙ. ඇහැට කනට දිවට නාසයට කයට මනට ගෝචර නොවන

කතාවක්. ඒක ධම්මචක්කුක්ෂයට අසු වෙනවා. මස් ඇසට නොපෙනෙන බොහෝ දේ 'ධම්මචක්ඛුක්ෂයට' අසුවෙනවා. අපි දැන් හොයන්නෙ මොකක්ද? හිත හැදෙන හැටි. චිත්තාරෝපණය හැදෙන හැටි. අර 'ගුරුත්වාකර්ශනය' වගේ. 'විද්‍යුත් ආරෝපණය' 'චිත්තාරෝපණය' අපේ ස්නායු පද්ධතිය ඔස්සෙ දුවන කරන්ට් එක හැදෙන හැටි. ඒකත් ස්පාර්ක් වේගයක් එකම න්‍යායයයි තියෙන්නෙ. ඒක තමයි බුදුන් වහන්සේ 'මජ්ඣය ඥානං' කියන තැනින් පෙන්නුවේ.

'යො උභෝ අන්තෙ විදිත්වාන' 'මජ්ජේ මන්තා නලිප්පතී' තං බ්‍රෑහි මහා පුරිසො' සේද සිම්බනි මජ්ඣගා' කියන්නෙ මෙතනින් එහාට විද්‍යාවක් නෑ. ඒ තමයි විද්‍යාව නොගැලපෙන අන්ත දෙකක් තියෙනවා නම් මහණෙනි මැද්දෙ ශක්තියක් උපදිනවා කියල. ධනයි සෘණයි ස්පාර්ක් වුනොත් ෂෝට් වෙනවා ඕකයි විඤ්ඤාණ ශක්තිය කියන්නෙ. ඔබට නොතේරුනාට ඔබට දෙයක් කියල දැනෙන්නෙ ඔය 'ෂෝට්' වන ස්පාර්ක් වන දෙයක් කියල දැනෙන ශක්තිය තමයි. ඔබට ධණයි සෘණයි තියෙනවා. නෑයි කියන දෙක තියෙනව නම් කොහෙද තියෙන්නෙ එළියෙ. 'අජ්ජද්ධ බහිද්ඣා කියන්නෙත් ඒකමයි.

දෙයක් තිබ්බොත් ආ - ඒක තියෙන්නෙ අතන. අතන තියෙනව නම් මෙතන මම. ඔය ආරෝපණය මම කියල දැනෙන ගතිය 'ඉත්ථභාවය තියෙනවා වගේ දැනෙන ගතිය. හැබැයි එහෙම එකක් නැහැ ඊශාව අන්තය මොකක්ද සෘණ ධන කියන්නෙ ඉත්ථභාවයයි. ඉත්ථභාවය කම්පන වේගයටයි සකස් වුනේ. අපි ඒකයි ඔබට මේක බොහොම වටිනව මේ පැහැදිලි කිරීම. ඔබට ඇහැට එන්නෙ කිරණයක්. එහෙනම් අපි කිව්ව ස්පාර්ක් වෙනව. හිරු එළියට කණ්ණාඩියක් ඇල්ලුවාම ස්පාර්ක් වනවා. ඒකත් උපමාවක් විදිහට දකින්න ලයිටින් එකක් අහසේ විදුලියක් කොටනව වගේ. දිගටම විදුලි කෙටුවොත් මොකද වෙන්නෙ. ලොකු ආලෝකයක් එනව අර සූර්යයා වගේ. සූර්යයා කියන්නෙ දිගටම විදුලි කොටන එකක්. ඒ වගේ දෙයක් මෙතන සිද්ධ වෙනවා. ඒ කියන්නෙ අපේ ඇස මයික්‍රො විදිහට ඒ කියන්නේ ඉතාම ඇහැට නොපෙනෙන, ඒ කියන්නෙ ඉතාම සියුම් ස්පාර්ක් වන අධික වේගයක් තියෙනවා. ඒකයි කිව්වෙ තත්ත්පරයකට කෝටි වාරයක වේගයක්. මේ ඇස කියන තැන

ස්පාර්ක් වෙනව කියල. ස්පාර්ක් වන වේගය තමයි මෙතන දෙයක් වගේ අපිට දැනිල තියෙන්නෙ වේගය තමයි මෙතන දෙයක් වගේ අපිට පෙනිල තියෙන්නෙ. මේකෙ උපමාවට අපි ගත්තොත් බල්බ් එක රතුපාටයි නිල්පාටයි වයර් දෙක බල්බ් එක අතුලේ දඟරයක් තියෙනවා. මේ වයර් දෙක ඇවිල්ලා ඇතුලේ දඟර ස්පාර්ක් වෙනව. දඟරේ ස්පාර්ක් වෙනකොට ලොකු ආලෝකයක් එනවා. මේකම තමයි අපේ අර ස්පාර්ක් වන වේගයට අර නාභිගත වීම තුළ අපිට ආලෝකයක් මැවිල තියෙනවා. ඒක කොහේවත් කවුරුවත් කරපු දෙයක් නොවෙයි. 'නහිදං අත්ථ කථං බිම්බං - නහිදං පරකථං අගං මේක කළ කෙනෙක් නැහැ සොබාදහමක්.

මේ විදිහටම කර්ණසංඛ පඨලය වයිබ්‍රේට් වන වේගයට ට්‍රිරූඃ ගාන එක අර කම්පන වේගයක් තමයි ශබ්දය කියන්නෙ. කම්පන වේග දෙකක එකට එකතු වෙනව කියන එක සොබාදහමත් මීට වැඩි දේවල් මේ සොබා දහමේ සිද්ධ වෙනව ඔබට පේන්නෙ නැහැ. 'චිත්තාරෝපණය' හැදෙන හැටි. පුංචි දරුව පුතේ මේ අම්ම අම්ම කියන ශබ්දය අම්ම කියන වර්ණ හැඩතලය ස්පාර්ක් වන එක. ඒක තත්පරයට කෝටි වාරයක් ශබ්දය එන ස්පාරක් එක තත්පරයකට කෝටි වාරයක් සිදුවනවා. මේ ස්පාර්ක් දෙක එකට එක්වීම නවත්වන්න බැහැ. මොන්ටිසෝරියෙ උගන්වන්නෙ කහ රතු නිල් ඇහැට වර්ණයක් දෙනව කණට ශබ්දයක් දානවා. තොට්ල්ලෙ ඉන්න දරුවා දන්නෙ නැහැ රතුපාට නිල්පාටද කියල මෙරිගෝ රවුම උඩ කැරකෙනවා. හැබැයි ශබ්ද දාල තමයි මේක වෙන්නෙ. ශබ්දය මේක කම්පනය

අර ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංග යක් හැදෙන හැටි පෙන්නුවෙ. ඒකෙ ශබ්ද වර්ණ ප්‍රකටයි. නමුත් 'දිට්ඨ සුත දැනෙන ස්වභාවය මතු වෙනවා. ඒ වගේම මේ කම්පන ගොඩක්. කමපන ගුලියක් සක්කාය ඉත්ථ භාවයක් හදනවා කාය කියන්නේ ගොඩ. අර සේරගේම එකතුව. ඉත්ථ තියෙනව වගෙ දැනෙන ගතියක් හදනවා. 'සක්කාය'' 'කය' කියන්නෙ ගොඩ 'සක්' කියන්නෙ තියෙනවා. ඒ කියන්නෙ දෘෂ්ටියක් හැදෙනවා. ඒක 'සක්කාය දෘෂ්ටිය' ඒක ආරෝපන බලය ඒක පොඩි දරුවටත් මේක දැනෙනවා. අර ආරෝපණ බලය වේගයට අර ඇස කියන ආයතනය තුළ ඒ ආරෝපණය වන වේගය තුළ ඇස

දන්නෙ නෑ මේක බිත්තියක්ද පුටුවක්ද කියල. ඇසට එන්නෙ ආලෝකය විතරයි කැමරාවක් වගේ. එතකොට එතන ස්පාර්ක් වන වේගයට ඒ ආරෝපන බලයට දෙයක් වගේ දැනෙන තියෙනවා වගේ. දැනෙන ගතියට තමයි 'චක්ඛු විඤ්ඤාණය කියන්නෙ 'විඤ්ඤාණය කියන්නෙ දැනෙන ගතියටයි.

එතකොට ඒ ස්කන්ධ විග්‍රහය පෙන්වන්නේ රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියලා. ඒ ස්කන්ධානානං පාතිභාවෝ ඇසේ උපතයි කියන මේ ආලෝකය හැඩතලය. හැබැයි ආයතනයක් කියල ගන්න කොට 'තින්නං සංගති ඵස්සො' කියන කොට ඒ මොහොතේ හැදෙන ශබ්ද වර්ණ සියල්ලම එකට එකතුවීම තුළින් ස්පාර්ක් එකක් එතන. මනෝ කියල ගන්න කොට එනවා. මේකයි චිත්තානුපස්සනාවෙ පෙන්නන්නේ. ආයතන වෙනයි. මනෝ විඤ්ඤාණය වෙනයි. මනෝ විඤ්ඤාණය කියන්නෙ මොලේ ඇතුලෙවත් කොහෙවත් තියෙන එකක් නොවෙයි. මේ මොහොතේ වෙන මොකවත් ගන්නෙ නැතිව මේක හොඳට බලන්න. අර එකම මොහොතේ මොන්ටිසෝරි දරුවාට ඇහැට වර්ණ දීල කණට ශබ්ද දෙනව 'පුතේ මේ 'අ' යන්න කියල බ්ලැක්බෝඩ් එකේ අඳිනවා. 'අ' කියල කණට ශබ්දය දෙනවා. එතකොට මේ දරුවට ඊළඟ දවස එන කොට අර දරුව රූපෙ දැක්ක ගමන් 'අ' යන්න කියනවා.

දැන් ඔබ ඔතන ඉන්නෙ මෙහෙ පිච්ච මල් කියල කියනකොට ඔබට එන්නෙ ශබ්දයක්. ඇයි ඔබට රූපයක් මැවෙන්නෙ. මේකෙ ශබ්ද වර්ණ වෙන් කරන්න බෑ. ශබ්ද වර්ණ විතරක් නොවෙයි ඒකෙ ස්පාර්ක් එකක් එනව උණුසුම, සීතල, ගඳ, රස, සුවඳ සියල්ලම ස්පාර්ක් වෙනවා. එක ක්ෂණයෙන් එක මොහොතේ මේක අධික වේගයක් නිසා ඒකට දැනෙන එකක් එනවා. මේක වෙන් කරල 'විභජ්ජනය' කියන්නෙ මේක වෙන් කරල දකින්න. නැත්නම් මේක එකට එන වේගය නිසා මේක එකට දැනෙන එක තමයි වේගෙට එකට එන එක සංඛාර කියන්නෙ සකස්වන වේගය. 'සංඛාර සංඛාරත්තාය සංඛථං අභිසංකරෝති' රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති'

අභිසංකරණය කියන්නේ බඹරය. බඹරයක් කැරකෙන වේගයට බලගැන්වෙනවා බඹරෙන්ම බලගැන්වෙන එකයි 'ඉතථ භාවය' කියන එක

හැදෙන්නෙ. මෙන්න මේක දකින්න නුවණින්. ඇස් ඇත්තෝම දකින්වා කියන්නෙ ඒකයි. මේ 'සංඛාර' කියන්නෙ අභිසංඛරණයක් සකස් වෙන වේගයට ඒකෙ දෙයක් වගේ දැනෙන එකේ අවසාන ඵලය විඤ්ඤාණයයි කියන්නේ. චක්ඛු විඤ්ඤාණය ගැන කිවුවොත් ආලෝකය හැඩතලය විතරයි. සෝත විඤ්ඤාණය කිවුවොත් ශබ්ද. නමුත් මේවා එකම තත්ත්පරයට මේ මොහොතේ සකස් වන වේගයට දැනෙන එකයි මනෝ විඤ්ඤාණය කියන්නෙ. ඒකයි මෙතන 'නාම රූප පච්චයා විඤ්ඤාණං' කීවේ 'තින්නං සංගති ඵස්සො' කීවේ ස්පර්ශය කියන්නෙ එකට ස්පර්ශ වෙනකොට 'ධම්ම' කියන එක හැදෙනවා. ඒකයි මෙතන 'ධම්ම' කියන එක මනසෙ හැදෙන්න හේතුව. **'ධම්ම' කියන්නෙ පුටුව, අම්ම, තාත්තා, ගෙවල්, දොරවල් ධම්ම, ඒ ධම්ම හැදුනෙ කොහොමද එතනින් එහාට ධම්ම ස්පාර්ක් වෙන්නෙ දිගටම. එතනින් එහාට ඔබට පේන්නෙ කෙළින්ම ශබ්ද වර්ණ එකට එකතු වෙච්ච එකක් එන්නෙ.**

අර පෙර සිත් කඳ පිළිවෙල දකින්න ඕනෙ කියන්නෙ මෙන්න මේක හැදෙන හැටි දකින්න. නමුත් මේ මොහොතේ එන්නෙ බිත්තිය පුටුව මේසෙ ඇඳ. මේ මොහොතේ එන 'චුතූපපාද ඥානය' දකින්න බැහැ පෙර සිත් කඳ පිළවෙල දකින්නෙ නැතිව ශබ්ද වර්ණ එකට එකතු වෙන හැටි දකින්නෙ නැතුව. අන්න එහෙම වුනොත් තමයි ඔබ මේ ආරෝපනය හදෙන හැටි, ඔබට අවසානයේ දෙයක් කියන එකමයි ආරෝපණය කියන්නෙ. ඔබට දෙයක් තියෙනවා බිත්තියක් තියෙනවා. ගෙයක් තියෙනවා. ලංකාවක් තියෙනවා ඇමරිකාවත් තියෙනවා ඉරත් තියෙනවා හඳත් තියෙනවා දරුවොත් ඉන්නවා. හැමදේම තියෙනව මේ ඔක්කොම ශබ්ද වර්ණ වගේම දෙයක් කොහෙවත් නැහැ. ඔබ හැමදේම එකතු කළේ ශබ්දයෙන් වර්ණයෙන්.

ඒකයි අපි කිව්වෙ දරුවා ඇමරිකාවට විකුණනවා අපේ දුප්පත් අම්මලා. එතකොට ඒ දරුවා ඇමරිකාවෙ හැදෙනකොට ඒ දරුවා දන්නෙ නැත්නම් මැරෙනකම් ඒ දරුවා අම්මා කියන්නේ ඒ හැඩතලයට. මදර් කියන ඒ හැඩතලය. ඒ දරුවා නාවපු අම්මා, කිරි දීපු අම්මා, ඉස්කෝලෙ යවපු අම්මා. මේ ඔක්කොම අභිසංස්කරණය වෙලා අම්ම මැරෙන කොට අර අම්මට එන මව් සෙනෙහස, දුක ඔක්කොම අරක ඇතුලේ ආරෝපණ

ගොඩක් විතරයි. ඒ දරුවා අඬනවා. ඒ දරුවට අම්ම තැත්ද ඒ දරුවට අම්ම ඉන්නවා. කොහෙද අම්මා හැදුනෙ ඒ අම්මා ලංකාවෙ ඉපදුන අම්මද නැහැ කව්ද? ඒ අම්මා ඇහෙන් කනෙන් හැදුන අම්මා. ඇහැට ආව වර්ණයට කණට ආපු ශබ්දයට හිතෙන් හැදුන අම්ම ඊට පස්සෙ අන්න මෙතන දෙයක් තිබ්බොත් ඒ දේ නිසාමයි මෙතන දෙයක් කියල හැදුනෙ. අම්ම කියන දේ.

අම්මා කියන ජාතිය කොහොමද ඒ දරුවාට හැදුනෙ. ශබ්දයෙන් වර්ණයෙන් කම්පනයෙන්. ඒ කම්පනය ඇතුලේ හැදුන අනෙක් කම්පනය මොකක්ද? අම්මා ඉන්නවා. මාත් ඉන්නවා කියල ආත්ම කම්පනයක් ඒ දරුවාට හැදෙනවා. ආත්මයක් තියෙනවා කියන්නෙ ඉන්නවා වගේ දැනෙනවා කියන්නෙත් ඉන්නවා වගේ දැනෙන එක නැතිවෙන එකයි. මරණය කියන්නෙ ඒ දරුවට මරණයක් තියෙනවා. ඒ අම්මටත් මරණයක් තියෙනවා. ඒ දරුවාට අන්න මරබියක් තියෙනවා. ඒ අම්මා මැරෙනවාට බයයි කොහොමද මරණය ආව. අර සේරම ආවෙ ඇහෙන් කනෙන්. අම්මෙ අර මොකක්ද පුතේ ඒක මරණයක්. ආ මොකක්ද අම්මෙ මරණය. ඔව් පුතේ ඒක මරණයක්. අම්මෙ ඔය වලලන විට කියන්නේ මරණය කියන එකටද. ඔව් පුතේ ඒකට තමයි මරණය කියන්නෙ.

මේ ළමය ඉන්නෙ ඇමරිකාවෙ එයා වෙන ශබ්දයක් දානවා ඩෙත් ඔයත් මැරෙනවා පුතේ දැන් කොහොමද මරණය හැදුනෙ. අර රූපය ඇහැට ආපු වළලන එක නැත්නම් ගිණි තියෙන එක. අන්න මරණය ඇහැට ආවේ කණට වර්ණය කියන ශබ්දය දුන්න. අම්ම ඇමරිකාවෙ හිටිය නම් වෙන ශබ්දයක්, චීනයේ හිටිය නම් වෙන ශබ්දයක්. දැන් මරණය කියන එක ඇහෙන් කනෙන් ඇහෙන සිතුවිල්ලක්. 'අම්මෙ ඒකද මරණය' ඒ දරුව දන්නෙ නැහැ එතකන් මරණය කියන එක. **පුංචි දරුවා මොන්ටිසෝරි යන දරුවා එහෙම නැත්නම් ඔය තොටිල්ලේ ලේකැටි දරුවා පොඩ්ඩක් ලොකු වෙන කොට අම්ම මැරුණත් ඒ පෙට්ටිය වටේ සෙල්ලම් කරනවා. එයාට එහෙම එකක් නෑ. ඒ දරුවට මරණය ගැන හැඟීමක් නෑ. මේ සත්‍යය දැන ගත්තොත් ඔබත් මරණය ජය ගන්නවා. පුංචි දරුවා සෙල්ලම් කරනව වගේ.**

එතකොට අම්මෙ ඉපදෙනව කියන්නෙ. අර මවු කුසෙන් එන ආ... ඒක තමයි පුතේ ඉපදෙනව කියන්නෙ ඒ ඇහැට එන්නෙ රූපය කනට එන්නෙ ශබ්දය ඔන්න ඉපදුනා. ඇහෙන් ඉපදුනා. මහණෙනි ඇසෙ උපතයි උපත. බුදුන් වහන්සේට වැරදිලාද නෑ. හරි මහණෙනි ඇස නිසා හටගත් ලෝකයයි අන්න 'සළායතන ලෝකෝ' 'ලෝකං වදේති' ඒ ශබ්ද ලෝකයයි. ඒ වර්ණ ලෝකයි මේ ගන්ධ ලෝකයයි ඒකයි අපි කිව්වෙ ඔබට මේ ආයතනවලට වැටෙන ලෝකයක් කොහෙවත් නෑ කියල. මේක 'ෆැන්ටසි' එකක්. මේක 'ප්‍රොඩක්ට්' එකක්. මේක ආයතනික එලයක්. කර්මාන්ත ශාලාවක එලයක් තුළ එලයක් හම්බවෙලා. මේක සොබාදහමේ නිර්මාණයක්. ඔබ හැදෙනවා ඇසෙන් කනෙන් අර කණ්ණාඩිය දැකපු රූපය පෙනෙනවා. වගේ ආ... මේ මම. කමල්. අමල්නේ මේ කොහෙන්ද ආවෙ කණ්ණාඩියෙ දැකපු එක ඇහැට ආවෙ රූපය කොහෙන්ද ආවෙ. ශබ්දය කොහෙන්ද ආවෙ. මේක දෙක එකතුවුණාම ඔබ කොහෙන්ද ආවෙ.

ඔබට ඔය දැනෙන හැඟීම් හැම එකකටම අර තොටිල්ලෙ ඉන්න ලේකැටි දරුවා ඇතුලෙ පැලෝපීය නාලයේ පෙකණිවැල වෙන් කරනකොට ඒ ඇතුළෙන් අම්මගෙ ඕජාව එන එක ඔක්කොම නවතිනවා. එතකොට අර ලේකැටි දරුවාට අර මවුකුසින් එළියට එනකොට අර 'ඔක්සිජන්' පවා එන්නෙ නෑ. අර ඔක්කොම එන 'ඕජාව' නවතිනවා. එතකොට මේක අර කකුල් දෙකෙන් අල්ලලා උස්සලා පෙනහැල්ල වැඩ කරන්නෙ නැත්නම් තට්ටුවක් දානව. මේ පුංචි දරුවගෙ. ඒකට හේතුව අර පෙනහැල්ලේ අර ස්පන්දන පොම්පෙ අර තිබෙන පොම්පෙ ඒක වැඩ කරවන්න. ඒක මැෂින් එකක්. මේ 'ෆිසිකල් බොඩි' එක මැෂින් එකක්. මේක ක්‍රියාත්මක කරනවා. ඊට පස්සෙ තමයි මේක වැඩ කරන්න ගන්නෙ. ඊට පස්සෙ මේක ඇතුලෙ නහරවැල් ඔක්කොම වේලෙනවා. අම්මගෙ සාරය එන්නෙ නැති නිසා. ඊට පස්සෙ මොකද මේ දරුවගෙ ඇතුළෙ දැක්කොත් පෙනෙයි දරුවා රතුපාට වෙලා. ඊට පස්සෙ නිල්පාට වෙන්න යනව අන්න ඊට පස්සෙ මේ දරුවා 'චෑස්' ගාලා පිටවෙන ප්‍රශ්වාස වාතයත් එක්ක අන්න 'විසිල්' එක වගේ වදිනවා. ඒකට හේතුව ඇතුල පිච්චෙනවා. අර නහරවැල් ඔක්කොම වේලෙනවා. **අම්මගෙ ක්ෂීරය දැන් ඔක්කොම එන්නෙ නෑ. 'ටක්' ගාලා මේ ලේ කැටි දරුව අම්මගෙ**

**තුරුලට ගේනවා. අර තියපු ගමන් 'චූෂන' පොම්පෙ වගේ. අර ඇතුල වේලෙනවා. නහරවැල් හැකිලෙනකොට ඒ හැකිලෙන ස්වභාවටය අර උරාගෙන උරාගෙන යනවා. අපි කියනවා දරුවා කිරි බොනවා කියල. කිරි බොනවා නෙවෙයි, 'සිස්ටම්' එක වැඩ කරනවා. කවුරුත් කරනවා නෙවෙයි සොබාදහමේ සිස්ටම් එකට වැඩ කරනවා.** ඊට පස්සෙඅර පුංචි දරුවගෙ අර නහරවැල් ඕක්කොම ඇතුලෙ තියෙන සේරම සීතල වෙලා යනවා. ඊට පස්සෙ අර පිච්චෙන ස්වභාවය නැති නිසා සිසිල් වීම තුළ අර 'චෑස්' ගාන විසිල්' එක නවතිනවා.

දරුව නැවතත් හැකිලෙන්න ගන්නවා. දරුවා ක්ෂීරය පිරුණාට පස්සෙ දරුවා නිහඬයි. ඊටපස්සෙ පැත්තකින් තියෙනවා. ඊට පස්සෙ ආයෙ ටිකක් වෙලා යනකොට අර ඔක්කොම ඇකිලෙන්න ගන්නවා. ආයෙ කියනවා ආන්න දරුවාට බඩගිනි වෙලා කියල. ආපි චූසන පොම්පෙ වැඩ කරන්න ගන්නවා. අර 'විසිල්' එක වගේ වැදුන 'චාස්' ගානවා. ඔක්කොම වේලෙන කොට එනව 'විසිල්' එක. ඊට පස්සේ ඒ දරුව ටිකක් ලොකු වෙන වයසට එනවා. එතකොට මොකද වෙන්නෙ. ශබ්ද වර්ණ එකතුවෙන වයසට එනවා. එතකොට මොකද වෙන්නෙ ඇතුලෙ බඩවැල් ඔක්කොම වේලෙනවා. අර වගේම කන්නැතුව ඉන්නකොට වතුර බොන්නෙ නැතුව ඉන්නකොට ඇතුලෙ එනව පිච්චෙන ගතියක්. ආ... ඊට පස්සෙ වචනයට ගන්නවා. ඒකට තමයි මේ බඩගිනියි කියන්නෙ. ඔව් පුතේ ඒක තමයි බඩගිනියි කියන්නෙ. අන්න අර පිච්චෙන ගතිය අන්න අර ලේ කැටි දරුවටත් තිබුණෙ මේක. දැන් මේක දැනුත් වෙනවා. පිච්චෙන ගතිය. කන්නැතිව ඉන්න කොට පිච්චෙනවා. අපිත් කියනවා බඩගිනියි කියල. අර රූපෙට ශබ්දෙ දාගන්නවා. බලන්න මේව හැදෙන හැටි.

හැම එකම සොබා දහම තුළින් ඔබට පේනවා. එතන ඔබ කියල කෙනෙක්වත් ඔබට හම්බ වෙන්නෙ නෑ. ඔකකොම ශබ්ද වර්ණ. 'සලායතන ලෝකයක් වෙනවා මරණය කියල දෙයක්' නැති වෙනවා. මර බියක් නැති වෙනවා. ඔබ ඉපදුනේ කොහෙද සිතින්, සිතෙන් මිදෙන මග, දුකෙන් මිදෙන මග, නිවන් දකින මග, එයයි නිස්සරණ මග එහෙනම් මේ හිතෙන හැදෙන හැටි කතා කරන්නෙ ඒ කියන්නෙ ශබ්ද වර්ණ එකට එකතුවෙන එකට අර එකතුවෙන වේගෙට ශබ්දත්, වර්ණත් ශබ්ද

තරංගත් වර්ණ තරංගත් එකතුවෙලා චිත්ත තරංගයක් හැදෙනවා. කියපු එක මුලින් සිතක් වුනෙ අර ශබ්ද, ශබ්ද විදිහට. වර්ණ, වර්ණ විදිහට. ඊට පස්සෙ මේක දෙයක් වගේ දැනෙන එක හේතුඵල දහමයි මේ කියන්නෙ. 'හේතුව' නම් ශබ්ද වර්ණ සලායතන. 'ඵලය' නම් ආත්මයයි. මොකද්ද මේ කියන්නෙ. මහණෙනි, කිරෙන් ගිතෙන් හැදුවට ගිතෙල් කිරි කරන්න බැහැ. **ඒ කියන්නෙ කිරිවලින් චීස් හැදුවට මේ නූතන දරුවෙකුට කියනවා නම් පුතේ චීස් ආයෙ කිරි කරන්න බෑ. මොකද්ද ඒ කීවෙ..? චීස් කියෙන්න 'ඵලය' 'හේතුව' කිරි. කිරි වෙනයි ඵලය වෙනයි.**

මේක බුදුන් වහන්සේ උපමා කරන්නෙ ශබ්ද වර්ණ වෙනයි. ඒ නිසා හැදුන දෙයක් කියල ගන්න එක වෙනයි. දෙයක් කියල ගන්න එක. දෙයක් තියෙනවා කියල ගන්න එක දෙයක් කියල ගත්තොත් එතන එළියෙ දෙයක් තියෙනවා කියන්නෙ හැම තිස්සෙම එලියෙ අතන මෙතන හැදෙනවා. ඒ කියන්නෙ දෙයක් තියෙනවා. තියෙන්නෙ කොහෙද. අන්න එහෙනම් මෙතන 'මම ඒතං මම' ඒ තමයි මම, බිත්තිය නම් බිත්තියමයි ආත්මය කියන්නෙ, බිත්තිය වෙනයි ආත්මය වෙනයි කියලා දෙකක් නෑ. ඔබෙන් තොර මමෙක් නැහැ කිව්ව වගේ බිත්තියෙන් තොර මමෙකුත් නෑ. බිත්තියමයි ආත්මය කියන්නෙ.

ඔබ පොළොව දකිනවා නම් ඒ ආත්මය. පොළොව දකින එක නවතින්නෙ නැහැ. මේ ධර්මය තුළ ඔබට පේන ඇහෙන දැනෙන එක වෙනද වගේමයි. කණ්ණාඩිය වගේ ඔක්කොම පේනවා. ඇහෙනවා. දැනෙනවා. සම්මුතියේ මොකුත් වෙනසක් වෙන්නෙ නෑ. හැබැයි **ඔබගේ අවබෝධය තුළ ඔබට තියෙන ආරෝපණයක් එනවා. ඔය දෙයක් තියෙනවා කියල දැනෙන ආරෝපණයක් තියෙනවා. මේ කරන්ට් එකක් උපදිනවා කියපු එක. අන්න ඒ කරන්ට් එක නිවෙන එකයි නිවන් දකිනවා කියන්නෙ.** ඒ ආරෝපණ චිත්තාරෝපණය දියවීගෙන යනවා. අන්න ආත්ම සංඥාව දියවෙන තැන. අන්න අනාත්ම ධර්මය ඔබට හමුවෙනවා. ආත්මය නැති බව ඔබ දකින තාක් කල් ආත්ම දෘෂ්ඨියෙන් ඔබ මිදෙන තාක් කල් ඔබට මේ 'භව ඕඝය' 'සසර ඕඝය' නිමා කරන්න බැහැ. ඒකට හේතුව ඔය කම්පන ස්වභාවය නැවත තව තැනක ෆ්‍රීකොන්ස් වෙනවා.

වෙනම පරියායක් තියෙන්නෙ ඔබට කියන්න **මේ මොහොතෙ හුස්ම ගියොත් හරියට නිකං අර 'දෙරණ, සිරස' අල්ලනව වගේ. ටීවී එක මේ මොහොතෙ කැඩිල ගියාට යාපනයේ මේ මෙහොතේ ටීවී එකක් තියෙනවා. නම් 'සර්කිට්' එකකුත් තියෙනවා නම් ෆ්‍රීකොන්ස් එක මෙතන අහුවෙනව නම් ඒ ඉන්නෙ ඔබමයි.** මේ මොහොතෙ ටීවී එක කැඩුන වගේ ඔබගේ හුස්ම ටික යනවා. මොකක්ද මේ ඇතුලෙ තියෙන රාග ද්වේශ මෝහ ස්වභාවය. ඔබගේ කම්පන ස්වභාවය සංඛ්‍යාතය අනුවම 'මානීය මක්කහේ, අතිමානීය කුක්කුරෝ' කිව්ව වගේ, 'ගති නිමිති', 'කම්ම නිමිති' ආකාරයට ඔබගේ සකස්වීම නවත්වන්න බැහැ. මානීය මක්කටෝ කියන්නෙ රාග ද්වේශ මෝහ කියන්නෙත් කෙලෙස් කියන්නෙත් මේ ආරෝපණය චිත්තාරෝපණය. කරන්ට් එක වගේ වැඩක් මේකෙ තියෙනවා. සිස්ටම් එකක් කවුරුත් මරණින් මත්තේ යනවා නෙවෙයි. නමුත් සිස්ටම් එක මෙතන මෙතනම එතන එතනම සකස්වන 'සිස්ටම්' එකක්.

ඒකයි කීවෙ වතුරට ගලක් දානකොට වළලු හැදෙනවා කියල. **අර 'ජල තටාකයකට' පනිනකොට එහෙම නම් වතුරට ගලක් දානකොට ඒ මැද්දෙ තියෙන ජලය කොහෙවත් යන්නෙ නැහැ. වළලු හැදුනත් ඒ බිත්තිය අයිනෙ තියෙන ජල අංශු තමයි ඉස්සිලා පාත්වෙලා වදින්නෙ. මෙන්න මේ 'සිස්ටම්' එක ඔබ මෙතන හුස්ම ටික යනකොට මෙතනින් කවුරුත් යන්නෙ නැහැ. මොකක්වත්ම යන්නෙ නැහැ. අර වතුරට ගලක් දමනකොට එතනම මුකුත් ජල අංශු ගියේ නැති වුණාට ඉස්සිලා ජල අංශු වැදුන වගේ ඒ කම්පන සමාන එක කොහේ හරි වෙන්න පුලුවන්.** ඔබට නවත්වන්න බෑ. ඒක වෙනම පරියායක්. ඔබ හිතන්න දන්නෙ හරියට එතනින් යනව වගේ නූල් ඇදෙනවා වගේ 'සිස්ටම්' එකක් එහෙම එකක් මෙතන නැහැ. අහසෙ විදුලි කොටනකොට **මෙතන ජනෙල් හෙල්ලෙන්නෙ කොහොමද? නූලක් දාලා ගැට ගහලද නෑ. එතන කම්පන සංඛ්‍යාතයට මෙතන කම්පන සංඛ්‍යාතය සමාන නම් දෙක එකමයි ඒ නිසා හෙල්ලෙනවා.**

**මේ නිසා මුලු ලෝකෙ වටේම ඉන්න මේ මිනිස් සංහතියටම මේ විඤ්ඤාණ ධාතුවල කම්පන සංඛ්‍යාත කෙසේද? ආර්යයන් වහන්සේගේ**

**කම්පන සංඛ්‍යාතය ශූන්‍ය වන්නේ කෙසේද? ඒ ශූන්‍ය වන ස්වභාවයට ඔබ මේ දේශනා අහනවා නම් ඔබගේ සංඛ්‍යාතය ශූන්‍ය වෙලා ඔබ්ගෙ ආත්ම දෘෂ්ඨිය බිඳ වැටිලා ඔබත් නිවන් දකිනවා. දස දහසක් ලෝක ධාතුව කම්පා වෙනවා කිව්වෙ මෙන්න මේ නිසයි.** ආර්යයන් වහන්සේගේ අභ්‍යන්තර පරිවර්තනයක් ලෝකයට හෙළි කරනවා කිව්වෙ, අභ්‍යන්තරයේ ශූන්‍ය ස්වභාවය ලෝකයට ප්‍රකාශ කරන ඒ ස්වභාවයට ඔබගෙ අර 'සිරස' අල්ලනවා වගේ 'දෙරණ' අල්ලනවා වගේ. රේඩියෝ නාලිකාව 'ටියුන්' කරනවා වගේ. **ඔබගේ තිබුණ ආත්ම ස්වභාවය තුළ ඔබ ඇසින් කනින් දිවෙන් නාසයෙන් කයින් මසින් ඝනට, ඝන ලෝකයක් හදාගෙන අර පඨවි සංඥාව තුළ හදාගෙන තිබුණ ඒ ඝන ලෝකය තියෙනවා කියල ගත්ත ලෝකය 'ටියුන්' වෙලා 'ඉත්ථභාවයක්' වෙලා චිත්ත ස්වභාවයක් වෙලා චිත්ත ස්වභාවය ඔබට අවබෝධ වෙලා** ඒකත් ටියුන් වෙලා ටියුන් වෙලා අද ශබ්ද වර්ණ වෙලා ඒකත් දියවෙලා ඒක අවසානයේ දි කම්පනයක් විදිහට දැනිල කම්පනය දියවෙලා අවසානයේ කම්පනයක් නැති අකම්පන ස්වභාවයක්.

ඔබ, ඔබ ඉන්න තැන ඇමරිකාවේ වේවා, ඒංගලන්තයේ වේවා, ඕස්ට්‍රේලියාවේ වේවා, සිංගප්පූරුවේ වේවා කොහි හිටියත් මේ දේශනා ඇසේ නම් ඒ ඔබගේ කම්පන සංඛ්‍යාත අබොප්පා චේතෝ විමුක්තියට පත්වෙනවා. ඔබ නිවන් දකිනවා. මේ දේශනා ප්‍රාතිහාර්යයි. මේ අවබෝධය කියන්නෙ එසේ මෙසේ එකක් නොවෙයි. ඔබගේ 'භව ඕඝය' ඔබ හිතනවාට වඩා සංකීර්ණයි. මහණෙනි, මමත් නුඹලා වගේ මේ අනවරාග්‍ර සංසාරයේ සැරිසැරුවා මේ සත්‍යය නොදකින තාක්. තණ්හාව නමැති වඩුවා 'තා මා දිටිම්' කියා කීවේ මේ කම්පන සංඛ්‍යාතය අජ්ජෝසායති තිට්ඨති දෙයක් කියල ගත්තොත් 'යා රූපේ නන්දි' ඒ කියන්නෙ කම්පනයටයි. 'තදූපාදානං භවෝ' කියන්නෙ කම්පන බලයටයි. ඒකමයි දෙයක් වගේ දැනුණෙ. බිත්තිය දෙයක් වුණා, භවය දෙයක් වුණා. අම්ම දෙයක් වුණා, ලෝකය දෙයක් වුණා. උපතක් තියෙනවා. මරණයක් තියෙනවා. ඔබත් ඉන්නවා. ඔබට ජාතියක් තියෙනවා. ජරා - මරණ - ශෝක - පරිදේව තියෙනවා. ඒ පටිච්ච සමුප්පාදය අනුලෝමව දකීද ලෝකය ඇත්ත කරගෙන ඔබ සිටීනම් ඔබට සියල්ල උරුමයි.

**ඔබ කෙසේද දුකින් මිදෙන්නෙ. එහෙනම් මේ අනාත්ම ධර්මය තුළ ඔබ ආත්මයක් නැති බව දැකපු දවසට ඔබට ඔබ අහිමි වුණු දවසට ඔබට ඔබ නැති බව දැනෙන දවසට, ඒ ඔබට ප්‍රත්‍යක්ෂ වන දවසට ඔබේ අභ්‍යන්තරයට ඒ දැනෙන ගතිය, දැනෙන දවසට, ඔබ නිවන් දකින දවස එනව. එදාට ඔබ නිවන් දකිනවා. ඒක නවත්වන්න කාටවත් බැහැ. ඔබ නිවන් දකින එක ඔබටවත් නවත්වන්න බෑ. සිතිවිලිවලට යන්න පුලුවන් සීමාව අභිබවා යනවා. අභ්‍යන්තරයට දැනෙන සත්‍යය දිගින් දිගටම ගලනවා. ඒකෙ සිතුවිලිවලින් නවත්වන්න බැහැ.** ඔබට හිතල බැ ඔබ නිවන් දකින එක නවත්වන්න. 'වොස්සග්ග පරිණාම' වෙනවා කියන්නෙත් 'නියත සම්බෝධි පරායනය' වෙනව. මහ දැවැන්ත ඇඟ කිලිපොලා යන සිද්ධියක්. ඔබට ඔබ අහිමිවන තැන ඔබටවත් නවත්වන්න බැහැ. ඔබ හිතල ඊට පස්සෙ, ආ.... ඒක බොරුවක් කිව්වට වැඩක් නැහැ. ඔබේ අභ්‍යන්තරයට දැනෙනවා මේ ලෝකය බොරුවක්. ඒක ඔබට දැනිල ඉවරයි.

ඒකට හේතුව ඔබේ අභ්‍යන්තරයට ඔබේම අභ්‍යන්තර 'චිත්ත' ස්වභාවය තුළ මතුවන කම්පන ස්වභාවයට තියෙන ප්‍රතිවිරුද්ධ ස්වභාවය අකම්පිත ස්වභාවය බලගැන්විලා. ඔබගේ කම්පන ස්වභාවය දිය කරනවා. ඒක ඔබ කරනවා නෙවෙයි. ඔබට සිද්ධ වෙනවා. ඒ 'බුද්ධ' ස්වභාවයයි. අකම්පිත ස්වභාවයයි. 'අබුප්පා' චේතෝ විමුක්තියයි. ඒ නිමිතිගත ඔබ දේවල් කියල ගත්ත 'නිමිති' කුඩුවෙලා යනවා. අනිත්‍යයි. ශුන්‍යයි. ඒ හැමතැනම ඔබට දෙයක් නොවෙන ශුන්‍යත ස්වභාවයක් මතුවෙනවා. 'අප්‍රනීතයි' ඒකෙ කිසිම වටිනාකමක් අගයක් දැනෙන්නෙ නැහැ. නිබ්බිදාවට නෙවෙයි, නිබ්බිදන්ති, විරාගන්ති, නිරෝධන්ති අන්න ඒ නිබ්බිදාව අගයක් නොදැනෙන ස්වභාවය තුළ ඒකට ඇල්මක් නැති 'විරාගි' ස්වභාවයක් තුළ 'නිරෝධය.'

ඔබ කරනවා නෙවෙයි. ඔබට වෙනවා මේ කල්‍යාණ මිත්‍රයාග් පණිවිඩය මත මෙය සිද්ධ වෙනවා. **කල්‍යාණ මිත්‍රයා පණිවිඩය දෙන්නේ ඔබගේ ඔය බොළඳ හිතට නොවේ. කල්‍යාණ මිත්‍රයාගේ ඔබට නොදත් ඔබේ අභ්‍යන්තරයේ කැකෑරෙන 'ඕඝය' දකිනවා. කල්‍යාණ මිත්‍රයාට ඔබේ**

**අභ්‍යන්තර චිත්ත ස්වභාවය විතක්ක ස්වභාවය 'විතක්ක සංඥා', 'ප්‍රපංච සංඥා' 'සමුදය චිරන්ති' කියන තැන අන්න 'පරිචිත්ත විජානන ඥානයට' ඒක හසු වෙනවා. ඔබට නොදැනෙන බොහෝ දේ ඔබ ඉදිරිපිට ඉන්න කලයාණ මිත්‍රයාට දැනෙනවා.** ඔබ නොදන්න ඔබේ කතාව කලයාණ මිත්‍රයා විසඳයි. ආනන්දය, එසේ කියන්න එපා. කලයාණ මිත්‍රයා මතයි ආනන්ද මේ ශාසනය පවතින්නෙ මේ ශාසනය තියෙන්නෙ හිතේ. මේ දෙයක් කියල ගත්ත 'සත්ත්ව පුද්ගල දෘෂ්ඨිය' බිඳවැටුණ 'ඉත්ථි භාවය' බිඳ වැටුන තැන තියෙන ස්වභාවය. ඒ බුද්ධ ස්වභාවයයි. බුද්ධ ශාසනයයි. කොහෙවත් එළියෙ තියෙනවා නෙවෙයි. කිසිම ලෝකයක් එළියෙ නැහැ. ඔබට කවදාවත් හම්බවෙන්නෙත් නැහැ. තිස් එක් ලෝක ධාතුවම ඔබේම මේ අරමුණේම තියෙනවා. මේ අරමුණමයි දැකිය යුතු වන්නේ. මේ සදාතනික සුවයක්. ඔබට අත්දකින්න ලැබෙනවා. ඔය ගින්න සියල්ලම නිවිල යනවා. රාග ගින්න. ද්වේශ ගින්න. ඔබ ඇසින් කනින් දිවෙන් නාසයෙන් කයින් මනින් ඔබට ආරෝපණය වන ඒ ආරෝපණ ගින්න සුණු විසුණුවෙලා යනවා. 'සලායතන නිරෝධයට' පත්වෙනවා. 'සබ්බ සංඛාර' සියලු කම්පන සියල්ල 'සබ්බ සංඛාර සමථයකට' පත්වෙලා යනවා. ඒ 'අඛොප්පා චේතෝ විමුක්තිය'යි.

දැන් ඔබ එදිනෙදා අරමුණුවල දැකිය යුතු වන්නේ ඒ සත්‍ය දහම. ඔබ දකිනවාද ඔබට පේනවාද ඔබට දැනෙනවාද ඔබ නිකන් හිටියත් නිවන් දකිනවා. මේ දේශනා අසයි නම් අපට විවිධාකාර විදිහට දුරකථනයෙන් දැනුම් දෙනවා. ඒ කතාවල තියෙනවා 'මම කිසිම දෙයක් කළේ නැහැ. ආර්යයන් වහන්ස, ඒත් මට මේ හැම දෙයක්ම තිබ්බත් එකයි, නැතත් එකයි. මට ඒක කියන්න තේරෙන්නෙ නැහැ. අභ්‍යන්තරයේ ලොකු පරිවර්තනයක් මට වෙලා තියෙනවා. මට කිසි දේක ගින්නක් නැහැ. සමහරවිට බැලුවම මේ ගොවිතැන් කරන අම්මලා, ගොවිතැන් කරන ගොවි මහත්තුරු මේ නිවන් දැක්කෙ. මේක අභ්‍යන්තර පරිවර්තනයක්. මාර්ගයට පිළිපන්නයි කියන්නෙ පෝට්ලල නෙවෙයි. ඔබගේ අභ්‍යන්තර පරිවර්තනය ඔබටවත් නවත්වන් පුලුවන් එකක් නෙවෙයි. ඒක දැනෙන එකක්. සුනීත, සෝපාක, මොකවත් ඉගෙන ගෙන නැහැ. ඒ කසල ශෝධකයෙක්. ඇයි දැනෙන්නෙ නැද්ද, මේ ලෝකය මේක බොරුවක් කියල. ඔච්චරයි මහා ප්‍රාඥයෙක් වෙන්න ඕනෙ.

**'විඤ්ඤාණ' මායාවට නොරැවටේ නම් ඔබ 'මහා ප්‍රාඥයෙක්' ප්‍රඥාභාවේ තිබ්බං විඤ්ඤාණං පරිඤ්ඤෙදයිය කිවේ 'පජානාති' කියන්නෙ විඤ්ඤාණ මායාවට නොරැවටෙන එක. විඤ්ඤාණ මායාවේ සත්‍ය දකින එකයි ප්‍රඥාව.** මේක අවුරුදු හතේ දරුවටත් තේරෙනවා. අවුරුදු හතේ දරුවට බොරු ගොඩක් දාල නැහැ. ඒ දරුව ප්‍රභාෂ්වර සිතෙන් මේක දකිනවා. ඔබට ඇහෙන්න ඇති දේශනාවක "අම්මේ 'නතිං.... නතිං' කියල ඒ දරුවා ඒක කියනවා. ඒ දරුවට ඒක දැනෙනවා. එතන එක් සිතයි ඒ මොහොතේ ඒ දරුව නතිං කියලා ඉවරයි. ඒ දරුව නිවන් දකිනවා ඔබට ප්‍රශ්න ඇති. ඒත් මේ දහම අවබෝධ වුණු ආර්යයන් වහන්සේලාට ඔතන ප්‍රශ්න නැහැ.

ඔබ ඒව 'ඇප්ලයි' කරනවා දරුවාට ඔබ හිතනවා ලේ කැටි දරුවටත් අර තියෙනවා කියල ඔක්කොම ලෝකය ලේ කැටි දරුවාට නැහැ. ඔබ ඒක 'ඇප්ලයි' කරල ඔක්කොටම කිවුවට ඔබේ තියෙන කෙලෙස් ස්වභාවය ලෝකෙ දිහා බලල ඒ කෙලෙස් ඔබ ලෝකෙට පැවරුවාට **ඔය ටීවී එකේ යන කතාවක් නැහැ. ඔබේ හිතමයි ඔය සේරම. ඒ වගේම තමයි ඔබේ ඇත්ත ලෝකය ඔබ හිතුවට එළියෙ කතාවක් නැහැ. ඔක්කොම විඤ්ඤාණ මායාව. ඔබ හිතනවා පමණයි එළියෙ කොහෙද ලස්සන දේවල් ඔබේ හිතමයි ඔබ දකින්නෙ. ඔබේම විඤ්ඤාණ මායාව ඔබ එළියේ තියල තියෙන්නෙ. මේ ධර්මය දකිනම් ඔබට බාහිර ලෝකයක් හම්බවෙන්නෙ නැහැ. ඒ දකින දේ ඔබ සත්‍ය දකිනවා.** කිසි කෙනෙකුට ඔබට ඒක කියාගන්න බෑ. මේ යුගයේ කරන්නෙ මේක අති ගාම්භීරයි. මේක ලේසි නෑ. 'සුවිශුද්ධං' කියන තැන. මේ දේශනා අහල හැමෝම ඒ මොහොතේම නිවන අත් දකිනවා. මේක දේශනා ප්‍රාතිහාර්යයක්. ඒ හැමෝටම තේරෙනවා සැබෑම මගඵල ලාභීන් බිහිවෙන යුගයක් ඒක තමයි ස්වභාවය. සොබා දහමේ හැටි.

ඔබට මේ දහම තුළ ඕනෑම දෙයක් කතා කරන්න. ඕනෑම විදිහකට කමක් නෑ. හොඳ වේවා නරක වේවා ඒවා අපිට අදාළ නෑ. අපිට වැදගත් වන්නෙ මහා ප්‍රඥාව. ඔබ ප්‍රඥාවන්තයි. ඔබට ඒක වැටහෙනවා. ඔබට දැනෙන දේ කියන්න. අපි ප්‍රායෝගික පැත්තක් කතා කරන්නෙ. අපි පෙන්නුවෙ මේ ධර්මය කුමක්ද කියන එක. ප්‍රායෝගික අත්දැකීමක්

වචනෙන් කියන්න බැහැ. ලුණු රහ ගැන කොහොමද කියන්නෙ, තණ්හාව කොහොමද වචනෙන් කියන්නෙ. නිවන ගැන කොහොමද වචනෙන් කියන්නෙ. ඒ වුණත් අපි ඔබට යා යුතු මග කියනවා.

**මේක ඔබේම හිතමයි. ඔබ සිතන්නෙ දෙයක් හදා ගන්නෙ. ඒ හදාගන්න දේනෙ නැතිවෙලා තියෙන්නෙ. ඔබේ හිතේනෙ තියෙන්නෙ මේක. වටිනා දෙයක් කියල ඔබේම හිතේනෙ මේකයි හැඩතලය කියල. ඒක තව කෙනෙක් දකින්නෙ නැහැ. ඔබේ හිතේ 'චිත්තයක්' තියෙන්නෙ. සිතිවිලි සිතෙන් හදාගත්ත දෙයක්. ඇත්තටම අපේ හිතනෙ මේ හැම එකකටම තියෙන්නෙ.** අපි හිතෙන්නෙ මේ දුක් විඳින්නෙ. එතකොට අපේ හිතේනේ තියෙන්න අපේ හිතේ තියෙන දේවල් කොහෙවත් තියෙනවද, කොහෙවත් නැහැ. නමුත් ඒක අපේ හිතේ තියෙන දේ කියල අපි හිතන්නෑ. අපි හිතන්නෙ එළියෙ තියෙන දේ කියල. නමුත් එළිය තියෙන දේ නෙවෙයි. හිතේ තියෙන්නෙ. මේ දේ වටිනව කියල ඔබ දන්නවා. ඔය ත්‍රීවීල් එක පවා ගොඩක් වටිනවා කියල ගත්තට ජීවිතය වගේ එක පාරටම නැතිවෙනවා නේද... දැන් ගෙවල් හදනවා. ජීවිත කාලයටම 'ලෝන්' ගහල. ණය වෙලා. එක වැස්සයි වහින්නෙ ගේත් එක්කම ඉවරයි. තට්ටු දෙකේ තුනේ ගෙවල් යනවා එහෙම නෙවෙයිද මිනිස්සුන්ට කොච්චර දේවල් වෙනවද. සුනාමියෙන් කොච්චර දේවල් නැති වුණාද... කොරෝනාවලින් කොච්චර ජීවිත නැතිවුණාද... දොස්තරවරු පවා රට රටවල ඇමතිවරු පවා නායකයො පවා නැතිවුණා නේද...

ජීවිතය කියන්නෙ හරියටම මේ අපි හිතනවා නේද මේක තියෙනවාමයි කියල. කොහෙද තියෙන්න. අපි හිතන දේ නේද නැතිවෙන්නෙ. නැතිවුණා නම් නැති වුණේ තියෙනවා කියල හිතාගත්ත සිතිවිලි ටිකක් විතරයිනෙ. ඒකයි කීවෙ **'හිතෙන් මිදෙන මග - දුකෙන් මිදෙන මඟ' 'නිවන් දකින මග' මේකයි නිස්සරණ මඟ' මේ සත්‍ය දැනගත්තොත් ඔබට ලෝකයකුත් නැහැ. ඔබත් නැහැ. මර බියකුත් නැහැ. පුදුම කතාවක්නෙ. ඔක්කොම ඇත්ත පේන්න ගන්නවා. ඊට පස්සෙ හැම මොහොතකම ඇත්ත පේන්න ගන්නවා. ඒක තමයි කෘත්‍ය ඤාණය. ඊට පස්සෙ එන එන සිත දකිනකොට ඔබ ඇත්තමයි දකින්නෙ.** සියලු දෙනාටම තෙරුවන් සරණයි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත. ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.**

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. සූත්‍ර දේශනා 03
19. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි
20. බුද්ධ ඥාණය අචින්ත්‍යයි
21. නොපෙනෙන සත්‍යය
22. සිතුවිල්ල මම නෙවෙයි